**2016 වර්ෂය සඳහා**

# කාර්යසාධන වාර්තාව
# සහ
# වාර්ෂික ගිණුම්

# වාණිජ දෙපාර්තමේන්තුව

**[295 වන ශීර්ෂය]**


*4 වන මහල, රක්ෂණ මන්දිරය,*
*අංක: 21, වොක්ෂෝල් වීදිය,*
*කොළඹ 02*
*දුරකථන:* ***011- 232 9733 / 243 6114***
*ෆැක්ස්:* ***011 -243 0233***
*විද්‍යුත් තැපෑල:* **fortrade@doc.gov.lk**
*වෙබ් අඩවිය:* **www.doc.gov.lk**

පටුන


| | | පිටුව |
|---|---|---|
| 1 | හැඳින්වීම | 01 |
| 2 | 2016 වර්ෂයේ විදේශ වෙළඳාම පිළිබඳ සමාලෝචනය | 04 |
| 3 | බහුපාර්ශවික වෙළඳ සබඳතා | 08 |
| 4 | ද්විපාර්ශවික වෙළඳාම සහ ආර්ථික සහයෝගීතාව | 18 |
| 5 | කලාපීය ආර්ථික සහයෝගීතාවය | 25 |
| 6 | වෙළඳ ආයෝජන සහ සංචාරක ප්‍රවර්ධනය | 30 |
| 7 | ප්‍රභවස්ථාන සහතික නිකුත් කිරීම | 44 |
| 8 | කාර්ය මණ්ඩල සංචලන | 46 |
| 9 | මූල්‍ය ප්‍රකාශය | 47 |

# **වගු ලැයිස්තුව**


| | පිටුව |
|---|---|
| *ශ්‍රී ලංකාවේ සමස්ත ආනයනය, සමස්ත අපනයනය, සමස්ත වෙළඳාම සහ වෙළඳ ශේෂය (2011-2016)* | *05* |
| *වාණිජ නිළධාරීන් විසින් සිදුකර ඇති ක්‍රියාකාරකම්වල සාරාංශය* (2016) | *32* |
| *නිකුත් කරන ලද ප්‍රභවස්ථාන සහතිකපත් 2011-2016* (*ගිවිසුම් අනුව*) | *45* |


# **ප්‍රස්ථාර සටහන් ලැයිස්තුව**


| | පිටුව |
|---|---|
| *වාණිජ දෙපාර්තමේන්තුවේ සංවිධාන සටහන* | *02* |
| *වාණිජ දෙපාර්තමේන්තුවේ සබඳතා* | *03* |
| *ශ්‍රී ලංකාවේ අපනයන සහ ආනයන සංයුතිය* | *05* |
| *ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳ ගමන් මඟ* | *07* |

# 1. හැඳින්වීම

## <u>දැක්ම</u>

*"ජාත්‍යන්තර වෙළඳ සම්බන්ධතා තුළින් ජනතාවගේ ජීවන තත්වය උසස් කිරීම"*

## <u>මෙහෙවර</u>

***"සමස්ත නිෂ්පාදන, ආදායම් සහ සේවා නියුක්තිය දියුණු කිරීම තුළින් ජීවන තත්ත්වය නංවාලීම සහ ඉහළ ජීවන තත්ත්වයක් ළඟාකර ගැනීම මගින් ශ්‍රී ලංකාවේ සමස්ත ආර්ථික වර්ධනය සඳහා ක්‍රියාකාරී ලෙස දායකත්වය ලබාදීමේ අරමුණින් යුතුව, රජයේ වෙළඳ ප්‍රතිපත්ති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම මගින් ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳ සම්බන්ධතා ද්විපාර්ශ්වික, කලාපීය සහ බහුපාර්ශ්වික මට්ටම්වලින් සංවර්ධනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම."***

කර්මාන්ත සහ වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ජාත්‍යන්තර වෙළඳ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ආයතනය වන වාණිජ දෙපාර්තමේන්තුව විසින් ද්විපාර්ශ්වික, කලාපීය සහ බහු පාර්ශ්වික මට්ටමින් ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳ සම්බන්ධතාවල සමස්ත පැවැත්ම සම්බන්ධයෙන් ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරනු ලැබේ. ඒ අනුව වාණිජ දෙපාර්තමේන්තුව විසින් ඉටුකරනු ලබන කාර්යභාරයට වෙළඳ ප්‍රතිපත්ති සහ ප්‍රවර්ධනයට අදාළ කාර්යයන් ඇතුළත් වේ. වාණිජ දෙපාර්තමේන්තුව විසින් ඉටුකරනු ලබන පුළුල් කාර්ය ක්ෂේත්‍රයන් පහත සාරාංශයෙන් දැක්වේ.


- අදාළ රේඛීය අමාත්‍යාංශ / අධිකාරීන් සහ පෞද්ගලික අංශයේ පාර්ශ්වකරුවන්ගේ සමීප සහයෝගීතාවයෙන් යුතුව ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වෙළඳ ප්‍රතිපත්ති සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

- රටෙහි අපේක්ෂිත සමස්ත සංවර්ධනය පිළිබඳ විශේෂ අවධානයක් සහිතව විදේශ වෙළඳ ප්‍රතිපත්ති සම්බන්ධයෙන් කර්මාන්ත සහ වාණිජ කටයුතු අමාත්‍යාංශය වෙත උපදෙස් ලබාදීම.

- විදේශ වෙළඳ නියෝජනය මගින් වෙළඳාම, ආයෝජනය සහ සංචාරක ව්‍යාපාරය යන ක්ෂේත්‍රයන් පිළිබඳ ශ්‍රී ලංකාවේ වාණිජමය අපේක්ෂාවන් ප්‍රවර්ධනය කිරීම.

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළදී, වාණිජ දෙපාර්තමේන්තුව විසින් විදේශ වෙළඳාම පිළිබඳ රජයේ දැක්ම සහ රටෙහි සමස්ත ආර්ථික සංවර්ධනය කෙරෙහි දැක්විය හැකි මුඛ්‍ය දායකත්වය මත පදනම්ව එහි කාර්ය වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලැබීය. මෙලෙස, 2016 වසරේ කාර්ය වැඩසටහන මගින්, අනෙකුත් කාර්යයන් අතර, පවත්නා වෙළඳ සම්බන්ධතා තවදුරටත් ශක්තිමත් කිරීම, නව වෙළඳපළ සොයා ගැනීම, නව නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම, අන්තර්ජාතික වෙළඳපලවල් වලට පිවිසීම සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර (SME) අංශ දිරිගැන්වීම සහ දකුණු ආසියානු කලාපයේ වෙළඳ මූලස්ථානයක් වශයෙන් ශ්‍රී ලංකාව සංවර්ධනය කිරීම කෙරෙහි ද අවධානය යොමු කර ඇත. වාණිජ දෙපාර්තමේන්තුව විසින් එහි විදේශ වෙළඳ නියෝජනය මගින්, සෘජු විදේශ ආයෝජන සහ ආයෝජන කළඹ ප්‍රවර්ධනය මෙන්ම ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරයද ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය මඟපෙන්වීම සහ සහාය ද ලබාදෙන ලදී.

# වාණිජ දෙපාර්තමේන්තුවේ සංවිධාන





## කෙටි යෙදුම්

| | |
|---|---|
| D | අධ්‍යක්ෂ |
| DD | නියෝජ්‍ය අධ්‍යක්ෂ |
| AD | සහකාර අධ්‍යක්ෂ |
| CRO | වාණිජ පර්යේෂණ නිළධාරී |
| DO | සංවර්ධන නිළධාරී |
| Mgt. Asst. | කළමනාකරණ සහකාර |
| KKS | කා. කා. ස. |

* වඩාත් ජ්‍යෙෂ්ඨතම (අධ්‍යක්ෂ මට්ටමේ) නිලධාරීන් ලෝක වෙළඳ සංවිධානයේ ස්ථිර නියෝජිත/ තානාපති, වොෂින්ටන්, ලන්ඩන්, බ්‍රසල්ස් සහ කරච්චි යන ස්ථානයන්හි දූත මණ්ඩල සඳහා පත්කළ යුතුය.

# අපගේ සබඳතා


රේඛීය අමාත්‍යාංශ හා වෙනත් රාජ්‍ය ආයතන
ලෝක වෙළඳ සංවිධානය සහ අනෙකුත් වෙළඳ කටයුතු සම්බන්ධ සංවිධාන
වෙළඳ මණ්ඩල
කලාපීය හා ද්වීපාර්ශවීය වෙළඳ ගිවිසුම්
සම්බන්ධී කරණ කටයුතු
කේන්ද්‍රීය ආයතනය ලෙස
වෙළඳ ප්‍රවර්ධන සංවිධාන
වරණීය වෙළඳ ගිවිසුම්
පෞද්ගලික අංශය
වෙළඳ සහ ආර්ථික සහයෝගිතා සඳහා වන ඒකාබද්ධ කමිටු

## 2. 2016 වර්ෂයේ ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳාම පිළිබඳ සමාලෝචනය

ශ්‍රී ලංකාවේ රාජ්‍ය ප්‍රතිපත්තියෙහි ආර්ථික සංවර්ධන වැඩසටහන තුළ ප්‍රමුඛ ස්ථානයක් විදේශ වෙළඳාම සඳහා හිමිවී ඇති අතර එය ශ්‍රී ලංකාවේ සංවර්ධන ඉලක්ක අත්පත් කර ගැනීමෙහි ලා වැදගත් සුවිශේෂී සාර්ව ආර්ථික මෙවලමක් ද වේ.

මෙම ඉල්ලක්කය ලඟා කරගැනීම සඳහා වූ අරමුණු අතරට ශ්‍රී ලංකාවේ නිෂ්පාදන සඳහා විදේශීය වෙළඳපොළ ප්‍රවේශය ශක්තිමත් කිරීම, වෙළඳ හා තීරුබදු ප්‍රතිපත්තීන් තවදුරටත් යාවත්කාලීන කරමින් වෙළඳ ප්‍රවර්ධනය ජාතික සංවර්ධන රාමුව තුළ අනුකලනය කිරීම, සාධාරණීය වෙළඳ පරිසරයක් තහවුරු කිරීම සහ අයෝජනය දිරිමත් කිරීම යනාදිය ඇතුළත් වේ. මෙම අරමුණු, බහුපාර්ශවීය, කලාපීය සහ ද්විපාර්ශවීය වෙළඳ ගිවිසුම් ඔස්සේ අත්පත් කරගැනීමට කටයුතු කරනු ලැබේ.

ගෝලීය මට්ටමෙන් වෙළඳාම ලිහිල්කරණයෙහි සම්මුතීන් හැරෙන්නට, කුඩා සහ අවධානමකින් පෙළෙන රටක් ලෙස ශ්‍රී ලංකාව, බොහෝ අභියෝගයන්ට මුහුණ දෙනු ලැබේ. දැඩි තාක්ෂණික සහ සෞඛ්‍ය ප්‍රමිතීන්, රේගු පටිපාටීන් සහ සම්බන්ධ අවශ්‍යතාවන් වැනි තීරු බදු රහිත ක්‍රියාමර්ගයන් තුළින් ඇතිවන අයහපත් බලපෑම් ඒ අතර වේ. තීරු බදු රහිත ක්‍රියාමාර්ගයන් යොදාගැනීම 2008 හි වූ ආර්ථික අර්බුදයන් ඇතිවීමට බලපෑ අතර එය තවදුරටත් ශ්‍රී ලංකාවේ ගැටලුවක් ලෙස පවතින්නේ අපනයන වෙළඳපොළ මඟින් සිදු කරන ඕනෑම තීරුබදු ලිහිල්කරණයක ප්‍රගමනය එවැනි පියවරයන් නිසා අහෝසි වන විටදීය.

ගෝලීය ආර්ථික සීමාව තුළ පහළ බැසීමේ ප්‍රවණතාවයක් පැවතිය ද ශ්‍රී ලංකාවේ අපනයනයන් සඳහා නව සහ වෙනත් වෙළඳපොල සෙවීමෙදී පවා ශ්‍රී ලංකාව පිටස්තරය අභිමුඛයෙහි දී සාමූහික ප්‍රයත්නයන් දරා ඇත. චීනය, බ්‍රසීලය, රුසියාව, තුර්කිය, දකුණු කොරියාව සහ දකුණු අප්‍රිකාව යානාදී රටවල් එලෙස වෙලඳපොළ පුළුල් කිරීම සඳහා හදුනා ගත් රටවල් කිහිපයකි.

පවත්නා ජාත්‍යන්තර වෙළඳපොළ තුළ ශ්‍රී ලංකාවේ කොටස වැඩි දියුණු කිරීම වැදගත් කටයුත්තක් මෙන්ම අභියෝගයක්ව පවතී. ජාත්‍යන්තර වෙළඳපොළ තුළ ශ්‍රී ලංකාවේ කොටස වැඩි දියුණු කිරීම සඳහා සුදුසු පියවරයන් ගෙන ඇති අතර ඒ විශේෂයෙන්ම ශ්‍රී ලංකාව පාර්ශව කරුවකු වී ඇති නිදහස් වෙළඳ ගිවිසුම් හා වරණීය වෙළඳ ගිවිසුම් යටතේ ඇති වෙළඳපොළ ප්‍රවේශ අවස්ථා පුළුල් කිරීම සහ උපරිම උපයෝජනය මඟිනි. ඒකාබද්ධ කමිටු සාකච්ඡා සහ ඉන් පසු සිදු කරන කටයුතු මඟින් වෙළඳ ප්‍රවර්ධනය සඳහා රටවල් අතර අන්‍යෝන්‍ය සහයෝගිතාවය වැඩි දියුණු කරන අතර වෙළඳාම සම්බන්ධ ගැටලු විසඳනු ලබයි.


සමාලෝචනයට යටත්වන කාලයෙදී රටෙහි ජාත්‍යන්තර වෙළඳ ප්‍රතිපත්ති පාලන තන්ත්‍රයේ අරමුණ වී ඇත්තේ අපනයන ක්ෂේත්‍රයෙහි සංවර්ධනය යි. ඒ අනුව ඵලදායිතාවය වැඩි දියුණු කිරීමට මෙන්ම විදෙශීය වෙළඳාමෙහි ප්‍රතිලාභ බෙදා ගැනීම සඳහා ග්‍රාමීය හා නාගරික ක්ෂේත්‍රයන්හි හා ගෝලීය අර්ථිකය අතර සම්බඳතාවය ඉහළ නැංවීමට රජය විසින් ප්‍රමුඛත්වය දෙන ලදී. තාක්ෂණික නව නිපැයුම් දිරිමත් කිරීමෙන්, නව කර්මාන්ත කලාපයන් තුල පෞද්ගලික අයෝජනය පහසු කිරීමෙන්, රාජ්‍ය සේවා සැපයුම ඉහළ නැංවීමෙන් සහ සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්ත ප්‍රවර්ධනය කිරීමෙන් හා වර්ධනය කිරීමෙන් කර්මාන්ත අංශයෙහි ජාත්‍යන්තර තරඟකාරීත්වය වැඩි දියුණු කිරීම කෙරෙහි රටෙහි ආර්ථික ප්‍රතිපත්ති සැලැස්මෙහි අවධානය යොමු වී ඇත. ද.දේ.නි හි අපනයන කොටස ඉහළ නැංවීමේ අරමුණෙන් යුතුව ලෝකයේ විශේෂිත අපනයන අවශ්‍යතාවයන් හා තාක්ෂණය මුල් කරගත් අපනයනයන් සඳහා අයෝජකයන් හදුනා ගැනීම කෙරෙහි රජයේ ආර්ථික ප්‍රතිපත්තීන්හි ආවධානය යොමු විය.

**ශ්‍රී ලංකාවේ සමස්ත ආනයනය, සමස්ත අපනයනය, සමස්ත වෙළඳාම සහ වෙළඳ ශේෂය** 2010-2016 (**වටිනාකම ඇ.ඩො.මි** )


| වර්ෂය | අපනයන | වර්ධනය % | ආනයන | වර්ධනය % | සමස්ත වෙළඳාම | වෙළඳ ශේෂය |
|---|---|---|---|---|---|---|
| **2010** | 8,294 | 16.5 | 12,340 | 26.4 | 20,634 | -4,047 |
| **2011** | 10,018 | 20.8 | 19,703 | 59.7 | 29,721 | -9,685 |
| **2012** | 9,181 | -8.4 | 17,889 | -9.2 | 27,069 | -8,708 |
| **2013** | 10,009 | 9.0 | 17,098 | -4.4 | 27,107 | -7,088 |
| **2014** | 11,044 | 10.3 | 19,246 | 12.6 | 30,290 | -8,202 |
| **2015** | 10,212 | -7.5 | 18,989 | -1.3 | 29,201 | -8,777 |
| **2016** | 10,217 | 0.048% | 19,515 | 2.77 | 29,732 | -9,298 |

*මූලාශ්‍ර: ශ්‍රී ලංකා රේගුව*

### 2.1 අපනයන හා ආනයන කාර්ය සාධනය





ශ්‍රී ලංකා රේගු දත්ත අනුව, 2016 වසරේ ශ්‍රී ලංකාවේ සමස්ත ආනයන වියදම ඇ.ඩො.මි. 19,515 වන අතර 2015 වසරේදී එය ඇ.ඩො.මි. 18,989 විය. එය 2015 වසරට වඩා 2.77% වර්ධනයකි. ආනයන සංයුතියේ මූලිකවම 12% ක කොටසක් ඉන්ධන සඳහා ලැබී ඇති අතර 2015 වසරට සාපේක්ෂව එහි 21.49% වර්ධනයක් ඇත. මෝටර් රථ (8%), යකඩ සහ වානේ (5%), රෙදිපිළි සහ කපු පුළුන් (4%) ප්ලාස්ටික් සහ ද්‍රව්‍ය (4%) ලෙස ආනයන සංයුතිය සැකසී ඇත.






**2016** වසරේදී ශ්‍රී ලංකාවේ සමස්ත අපනයන අදායම ඇ.ඩො.මි. **10,217** වූ අතර එය **2015** දී ඇ.ඩො.මි.**10,212** විය.

ශ්‍රී ලංකාවේ අපනයන ඉපැයුම් අතර රෙදිපිළි සහ ඇඟළුම් ප්‍රමුඛත්වයක් ගන්නා අතර එහි දායකත්වය **45%**කි. **2015** වසරේ එම අගයට වඩා සුළු ඉහළ යෑමක් **(1.05%)** දක්නට ලැබේ. **2016** අපනයන ඉපැයුම් අතරින් දෙවැනි ප්‍රධාන අපනයන ලෙස තේ **(12%)** ඝන සහ අනෙකුත් ටයර් **(3%)** රබර් අත්මේස් **(2%)** සහ කුරුඳු **(2%)** දැක්වේ.

### 2.2 අපනයන හා ආනයන දිශාව 2015-2016






| අපනයන (%) | |
|---|---|
| යුරෝපා සං. (EU) | 30.47 |
| ඇ.එ.ජ. (USA) | 27.48 |
| ඉන්දියාව | 5.39 |
| චීනය | 1.95 |
| එ. අරාබි එමීර් | 2.69 |

| ආනයන (%) | |
|---|---|
| ඉන්දියාව | 19.61 |
| චීනය | 21.90 |
| යුරෝපා සං. (EU) | 10.68 |
| ජපානය | 4.87 |
| එ. අරාබි එමීර් | 2.77 |

# 3 . බහු-පාර්ශ්වික වෙළඳ සම්බන්ධතා

ශ්‍රී ලංකාවේ බහු පාර්ශ්වික වෙළෙඳ සම්බන්ධතා මගින් ලෝක වෙළෙඳ සංවිධානයේ (WTO) ගිවිසුම් කෙරෙහි මූලික වශයෙන් අවධානය යොමු කරනු ලබයි. ශ්‍රී ලංකාව විසින්, වෙළඳාම සහ සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මේලනය (UNCTAD), ලෝක බුද්ධිමය දේපළ සංවිධානය (WIPO), ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානය (ITC) සහ ලෝක වෙළඳ සංවිධාන නීතිය පිළිබඳ උපදේශක මධ්‍යස්ථානය (ACWL) ඇතුළත් වෙනත් බහු පාර්ශ්වීය සංවිධාන කිහිපයක් සමඟ සමීප සම්බන්ධතා පවත්වාගෙන යනු ලැබේ.

## 3.1 ලෝක වෙළඳ සංවිධානය (WTO) තුළ ශ්‍රී ලංකාව නියෝජනය කිරීම

නයිරෝබි යේ පැවැත්වූ WTO අමාත්‍ය සමුළුවේදී ගනු ලැබූ තීරණ ක්‍රියාත්මක කිරීම සම්බන්ධ ගැටලු නිරාකරණය කොට අවසන් කිරීම සහ කෘෂිකර්මය, කෘෂිකාර්මික නොවන වෙළඳපොල ප්‍රවේශය (NAMA) හා සේවා යනාදියෙහි පවතින ගැටලු සඳහා ඉදිරි විසඳුම් සෙවීමේ මාර්ගයක් සෙවීම පිළිබඳ 2016 වසරේ දී WTO විසින් සිය අවධානය යොමු කර ඇත. කෙසේ වුවත්, බොහෝ සාමාජිකයන්ගේ විවේචන සහ අදහස් තවමත් ක්‍රියාවට නැංවීමට නියමිතය.

සාමාජික රටවලින් කිහිපයක් සිය දේශීය සහනාධාර , වෙළඳපොළ ප්‍රවේශය, කප්පු හා අපනයන සීමා පිළිබඳ ගිම්හාන නිවාඩුව අවසන් වීමට ප්‍රථම විශේෂ කෘෂිකාර්මික සභාව වෙත ගොනු කොට ඉදිරිපත් කර ඇත. එහෙත් සාමජික රටවල් අතර ඉදිරි අරමුණ පිළිබඳ පැහැදිලි වෙනසක් ඇති බවට විශේෂ කෘෂිකාර්මික සභාවෙහි සභාපති විසින් වාර්තා කර ඇත. G-33 මඟින් යෝජනා කරන ලද පොදු තොග සහ විශේෂ ආරක්ෂණ යාන්ත්‍රණය පිළිබඳ කටයුතු තවමත් උදාසීන මට්ටමේ පවතී.

ශ්‍රී ලංකාව කුඩා හා අවධානමට ලක්විය හැකි ආර්ථිකයක් සහිත රටක් ලෙස ලෝක වෙළඳ සංවිධානය විසින් හඳුනාගෙන ඇත. කුඩා සහ අවධානමකින් පෙළෙන ආර්ථිකයන්ගේ අවශ්‍යතාවයන් සැලකිය යුතු සහ අර්ථවත් ආකාරයකින් සපුරාලීමට අදාල වගකීම් අමාත්‍ය මණ්ඩල ප්‍රකාශනයේ 27 වන වගන්තියෙන් දැක්වේ. එමනිසා ශ්‍රී ලංකාවට ලෝක වෙළඳ සංවිධානයෙන් එහි වෙළඳාම සම්බන්ධ වැඩසටහන් සඳහා තාක්ෂණික සහ ශක්‍යතා සංවර්ධන සහය ලබා ගැනීමේ අවස්ථාව ඇති අතර ඊට අමතරව අමාත්‍ය රැස්වීමේදී යලි ප්‍රතිඥා දුන් කුඩා ආර්ථිකයන් සඳහා කාර්යය වැඩසටහන තවදුරටත් පවත්වාගෙන යාම ලෝක වෙළඳ සංවිධානයෙහි සංවර්ධන මුල් කරගත් වැඩසටහන් මඟින් ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා තවදුරටත් අවස්ථාව සලසා දෙනු ඇත.

ලෝක වෙළඳ සංවිධානය තුල ශ්‍රී ලංකාව නියෝජනය මඟින් වර්ෂය තුල ශ්‍රී ලංකාවට පැවති වෙළඳාම හා ආයෝජනය සම්බන්ධ ගැටලු රැසකට අදාල ප්‍රතිපත්ති උපදේශනයන් ලබා ගැනීමට හැකි විය. ඒවා අතර

- ශ්‍රී ලංකාව හා යුරෝපා සංගමය අතර ඒකාබද්ධ ආර්ථික කමිටුව සඳහා මූලික සටහන
- ලෝක වෙළඳ සංවිධානය යටතේ ආයෝජන කලාප ගුණාත්මක කිරීම සඳහා උපදේශක සටහන්
- ලෝක වෙළඳ සංවිධානයේ තොරතුරු තාක්ෂණ ගිවිසුම පිළිබඳ තාක්ෂණික සටහන
- ලෝක වෙළඳ සංවිධානය යටතේ ඇස්බැස්ටෝස් ආනයනය කිරීමේ තහනම සහ එහි නෛතික බලපෑම පිළිබඳ සටහන
- ශ්‍රී ලංකාවේ අපනයන සම්බන්ධ සහනාධාර පිළිබඳ යෝජිත පියවරයන් සහ ලෝක වෙළඳ සංවිධානයේ නීති පිළිබඳ නියමයන් අතර ගැලපීම පිළිබඳ සටහන
- ලෝක වෙළඳ සංවිධානයේ සහනාධාර සහ ප්‍රතිතෝලන පියවරයන් පිළිබඳ ගිවිසුමෙහි VII වන ඇමිණුමෙහි දැක්වෙන ශ්‍රී ලංකාවේ ක්‍රමාංකනය සහ ඉදිරි කටයුතු පිළිබඳ සටහන
- වෙළඳාම පහසුකරණය පිළිබඳ ගිවිසුම ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය උපදේශක සටහන
- නවසීලන්තයෙන් කිරි පිටි ආනයනය කිරීමේ ගැටලුව පිළිබඳ උපදේශක සටහන

- යුරෝපා සංගමයේ අරමුදලින් සම්පාදිත ශ්‍රී ලංකාවේ ශක්‍යතා සංවර්ධන වැඩසටහන පිළිබඳ තොරතුරු
- ද්වීපාර්ශවික ආයෝජන ගිවිසුම් පිළිබඳ සටහන
- කලාපීය වෙළඳ ගිවිසුම්වල මෑතකාලීන වර්ධනය පිළිබඳ උපදේශක සටහන

2016 වසරේ ලෝක වෙළඳ සංවිධානයේ ආසියානු පැසිෆික් කණ්ඩායම් සම්බන්ධීකාරක ලෙස ලෝක වෙළඳ සංවිධානය විසින් ශ්‍රී ලංකාව පත් කරන ලද අතර ශ්‍රී ලංකාව විසින් වැඩ කණ්ඩායම්වල ක්‍රියාකාරීත්වය ශක්තිමත් කිරීම සඳහා නව වැඩසටහන් දියත් කරන ලදී. අදාල වර්ෂය තුල ලෝක වෙළඳ සංවිධානයේ සීමාවාසික වැඩසටහන යටතේ වාණිජ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් දෙදෙනෙකුට පූර්ණ ආධාර සහිත සීමාවාසික පුහුණුවක් ලැබීමට අවස්ථාව හිමි විය. එමෙන්ම පුහුණු සහ තාක්ෂණ සහයෝගිතාවය පිළිබඳ ලෝක වෙළඳ සංවිධානය මඟින් පවත්වනු ලබන පුහුණු වැඩසටහන් 10 ක් සඳහා ශ්‍රී ලංකා සහභාගීත්ව වරම් ද හිමි විය.

මෙම ප්‍රයත්නයන්ගේ ප්‍රතිඵලයක් ලෙස කණ්ඩායම තුල වෙනත් රැස්වීම් වාරයක් 2016 අප්‍රේල් මස 19 වන දින ලෝක වෙළඳ සංවිධානයේදී පවත්වන ලදී. එම සැසිවාරය සඳහා ලෝක වෙළඳ සංවිධානයේ අධ්‍යක්ෂ ජනරාල් වන රොබර්ටෝ අසවේදු (Mr. Roberto Azevedo) මහතා සහභාගී වූ අතර කෘෂිකර්මය පිළිබඳ විශේෂ සැසිවාරයේ මුලසුන හොබවන ලද්දේ වැන්ජලිස් විටාලිස් (Vangelis Vitalis) තානාපතිතුමා විසිනි.

ලෝක වෙළඳ සංවිධානයේ වෙළඳාම සංවර්ධන අංශය සමඟින් ශ්‍රී ලංකාවේ කුරුඳු කර්මාන්තය පිළිබඳ විශේෂ සභා වාරයක් 2016 ජූනි මස පැවැත් විය. මෙම සැසිවාරය සඳහා මෑතකදී ශ්‍රී ලංකාවේ පිහිටුවන ලද සිලෝන් කුරුඳු ආයතනයෙහි ප්‍රධානී සාරද ද සිල්වා මහතා සහභාගී විය. ශ්‍රී ලංකාවේ කුරුඳු කර්මාන්තයේ පවතින විශේෂත්වය ඉස්මතු කිරීමටත් එම ක්ෂේත්‍රය තව දුරටත් දියුණු කිරීම සඳහා WTO, UNCTAD, UNIDO, WIPO, ITC වැනි ජාත්‍යන්තර ආයතනවල සහය ලබා ගැනීමට අවස්ථාව ශ්‍රී ලංකාව වෙත හිමිවිය.

2016 නොවැම්බර් මස 4 දින ලෝක වෙළඳ සංවිධානයේදී පැවැත් වූ වෙළඳාම සහ සංවර්ධනය පිළිබඳ ලෝක වෙළඳ සංවිධාන කමිටු (CTD) රැස්වීමේදී කුඩා ආර්ථිකයන් සඳහා සභාවාරයක් වෙන් කෙරෙන ලද අතර එහිදී ශ්‍රී ලංකා පාර්ශවය විසින් ලංකාවේ මෘදුකාංග ක්ෂේත්‍රයේ සංවර්ධනය පිළිබඳ විශ්ලේෂණයක් ඉදිරිපත් කරන ලදී. වෙළඳාම සහ සංවර්ධනය පිළිබඳ ලෝක වෙළඳ සංවිධාන කමිටුවෙන් කුඩා ආර්ථිකයන් සඳහා ලබා දුන් සභා වාරයේදී කුඩා ආර්ථිකයන් විසින් ලෝක වෙළඳාමට දායක වීමේදී මුහුණ පාන්නට සිදුවන විශේෂ අභියෝග පිළිබඳ සාකච්ඡා කිරීමට සහ විසඳුම් ලබා දීම සඳහා කාර්ය වැඩසටහනක් අනුගමනය විය. මෙම සභාවාරය සඳහා ශ්‍රී ලංකාව ඉදිරිපත් කිරීමක් සිදු කළ දෙවන අවස්ථාව මෙය වේ.

### 3.2 ශ්‍රී ලංකාවේ සිව්වන වෙළඳ ප්‍රතිපත්ති සමාලෝචනය

ශ්‍රී ලංකාවේ සිව්වන වෙළඳ ප්‍රතිපත්ති සමාලෝචනය 2016 නොවැම්බර් මස 1-3 යන දිනයන් හි ජිනීවා හි පිහිටි ලෝක වෙළඳ සංවිධානයේදී පැවැත්විණි.

වාණිජ දෙපාර්තමේන්තුව විසින් අදාල පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා කරන ලදුව 2012-2016 දක්වා කාල පරාසය ආවරණය කෙරන රාජ්‍ය වාර්තාව සම්පාදනය කරන ලදී.

ශ්‍රී ලංකාවේ වෙළඳ ප්‍රතිපත්තිය වෙනස්වීම පිළිබඳ රටවල් 24 ක් මඟින් ලිඛිත ගැටළු 100 ට වඩා සමාලෝචන කාල පරිච්ඡේදයේ දී ශ්‍රී ලංකාවට ලැබී ඇත. අදාල රේඛීය අමාත්‍යංශයන් සමඟ සම්බන්ධ වීමෙන් එම ගැටලු සඳහා විසඳුම් ලබාදීමට වාණිජ දෙපාර්තමේන්තුව සහ ලෝක වෙළඳ සංවිධානයේ නිත්‍ය නියෝජිත විසින් කටයුතු කරනු ලැබීය.

ශ්‍රී ලංකාවේ වෙළඳ ප්‍රතිපත්තිය පිළිබඳ අදහස් දක්වමින් ඇමරිකා එක්සත් ජනපදයේ නියෝජිතයා විසින් මානව අයිතිවාසිකම් ප්‍රජාතන්ත්‍රවාදය රැකීම සඳහා ශ්‍රී ලංකාවේ කැපවීමටත් මෛත්‍රීපාල

සිරිසේන ගරු ජනාධිපතිතුමාගේ පාලන නීතිය පිළිබඳවත් ප්‍රසංශා කරන ලදී. වසර ගණනක් පුරා පැවති යුද්ධය නිමා වීමත් සමඟ නව ප්‍රජාතාන්ත්‍රික සාරධර්ම නව්‍ය කිරීමත් නිසා රට ආර්ථික සෞභාග්‍ය සහ දියුණුවන ගෝලීය සංකලනයෙහි ස්ථානයක් හිමි කර ගැනීමේ හැකියාවක් පවතින බවට ඇමරිකා එක්සත් ජනපදය අදහස් පල කරන ලදී. යහපත් පාලනයක්, හිතකර ආර්ථික ප්‍රතිපත්ති සහ සාමය පැවතීමත් නිසා ශ්‍රී ලාංකිකයන් තුල බලාපොරොත්තු සහගත අනාගතයක් ඉදිරියේදී ශ්‍රී ලංකාවට අතකර ගත හැකි බවට ඇමරිකා එක්සත් ජනපදය තවදුරටත් පවසන ලදී. ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික අපනයන වන ඇඟලුම් සහ කෘෂිකර්ම යන නිෂ්පාදනයන් වර්ධනයට එහි අගය දාමය **(Value Chain)** ඉහළ දැමීමෙන් ලබා ගත හැකි වනු ඇත. සීඝ්‍රයෙන් වර්ධනය වන තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය ද රටෙහි අපනයනයට ඌණපූරකයකි. ඇමරිකා එක්සත් ජනපදය නව දුරටත් පවසන ලද්දේ දෙරට අතර පවතින් සම්බන්ධතා ශක්තිමත් කිරීමට සහ පුළුල් කිරීමට ඔවුන් ශ්‍රී ලංකාව සමඟ ඉදිරියේදීත් කටයුතු කරන බවයි. මෑතකාලීනව සිදු වූ දේශපාලන පෙරළිය නිසා ද්වීපාර්ශවික සහයෝගිතාව යන ක්ෂේත්‍රය සැලකිවයුතු මට්ටමකින් වර්ධනය වී ඇති අතර ශ්‍රී ලංකාවට සංවර්ධන සහයෝගිතාවය ලබාදෙන වැඩසටහන් රැසකට මඟ පෑදිනි. බාහිර වෙළඳාම සහ ආයෝජනය වර්ධනය කෙරෙන පස් අවුරුදු ද්වීපර්ශවික ඒකාබද්ධ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේදී ශ්‍රී ලංකාව සමඟ සමීපව කටයුතු කිරීමට ඇමරිකා එක්සත් ජනපදය අපේක්ෂා කරයි.

වෙළඳ ප්‍රතිපත්ති සමාලෝචන අර්ථ කථනයේ දී, යුරෝපා සංගමය විසින් ශ්‍රී ලංකාවේ ප්‍රගතිය පිළිබඳ ප්‍රසංශා කරන ලදී. ප්‍රධාන වශයෙන් නව ප්‍රතිපත්ති ක්‍රමය තුල ශ්‍රී ලංකාවට යහ පාලනය සහ පාලන නීති ඇතුලු බොහෝ ක්ෂේත්‍රයන්ගේ දියුණුව අත්පත් කර ගත හැකිය. යහපත්, ක්‍රියාශීලී සහ වඩාත් විවෘත මාර්ගයකින් යුතු නව රජයේ ආර්ථික නැමියාව කෙරෙහි යුරෝපා සංගමය තම උනන්දුව දක්වයි. GSP+ සහනය සඳහා ශ්‍රී ලංකාවේ ඉල්ලුම් පත පිළිබඳ යුරෝපා සංගමය විසින් මේ වනවිට තාක්ෂණික අගය තක්සේරුවක් සිදු කරමින් පවතින අතර නොවැම්බර් මස අගදී ඒ පිළිබඳ ශ්‍රී ලංකාව දැනුවත් කරනු ඇත. යුරෝපා සංගමය විසින් 2017 මැයි මස මැද භාගය වනවිට අවසන් තීරණය ගනු ඇත. 2015 වසරේදී ශ්‍රී ලංකාවේ සමස්ත වෙළඳාමෙන් 27% සඳහා යුරෝපා සංගමය සාමූහිකව ගණනය කර ඇත. ශ්‍රී ලංකාව සහ යුරෝපා සංගමය අතර සමස්ත භාණ්ඩ වෙළඳාම යුරෝ බිලියන 4.7 විය. යුරෝපා සංගමය සාමූහිකව ශ්‍රී ලංකාව වෙත ප්‍රතිපාදන සපයන්නෙකු වේ. 2005 සිට 2015 අතර කාලය තුල යුරෝපා සංගමය විසින් යුරෝ මිලියන **500**ක් ප්‍රතිපාදන ලෙස ශ්‍රී ලංකාවට ලබා දී ඇති අතර යුරෝ මිලියන 250 ක සහනශීලී ණයක් ද ලබා දී ඇත. මෙය වෙළඳාම සම්බන්ධ ශක්‍යතා සංවර්ධන සහය සඳහා ලබා දුන් යුරෝ මිළියන 8 ක අධාරයට අමතරව, 2014 සිට 2020 දක්වා ද්වීපාර්ශවික සංවර්ධන සහාය සඳහා යුරෝ මිලියන 250 ක මුදල වේ.

කැනඩාව විසින් තම අවස්ථාවේ දී පවසන ලද්දේ 2009 දී අත්කරගත් සාමයේ ප්‍රථිඵලයක් ලෙස රට අයෝජන මට්ටමෙන් ඉදිරියට යන බැවින් කැනඩාව ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා ඇප කැපවී සහයවන පාර්ශවකරුවෙකු බවයි. සංචාරක කටයුතු, වෙරළ ආශ්‍රිත කර්මාන්ත පුනර්ජනනීය බලශක්තිය සහ යටිතල පහසුකම් සැපයීමේ ව්‍යාපෘති යනාදී අංශයන් ගෙන් ශ්‍රී ලංකාවට අති විශාල ආර්ථික විභව්‍යතාවයක් ඇත. මෙම අභ්‍යන්තර ආර්ථික සංවර්ධන ව්‍යාපෘති සඳහා කැනඩාව විසින් පෙර ලෙසට ම ඉදිරියේදීත් ආයෝජනය කරනු ඇත. අපේක්ෂිත සහ ස්ථාවර ආර්ථිකයක් ශ්‍රී ලංකාවෙහි ඇති කිරීම සඳහා අවශ්‍ය වෙනස්කම් සිදු කිරීම සඳහා කැනඩාව ශ්‍රී ලංකාව ට අනුබල දෙයි.

තම සභා වාරයෙදී ඉන්දියාවත් ශ්‍රී ලංකාවත් පවත්නා පෞරාණික මිත්‍රත්ව සහ ශිෂ්ඨාචාරාත්මක බැඳීම පිළිබඳ ඉන්දියාවේ නියෝජිතයා විසින් සඳහන් කරන ලදී. භූගෝලීය, ඓතිහාසික,ආගමික,භාෂාත්මක, සංස්කෘතිමය සහ වෙළඳ යන අංශයන්ගෙන් දෙරටෙහිම පොදු සමානකම් දැකගත හැකිය. පසුගිය වසර කිහිපය තුල සාමාන්‍ය හුවමාරුවන්ගේ උපරිම මට්ටම දක්වා යමින් මෙම සම්බන්ධතාවය සියලුම අංශයන්වලින් තවදුරටත් පුළුල් සහ ශක්තිමත් වී ඇත.

ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර ශක්තිමත් ආර්ථික හා වාණිජ්‍යමය සමීප සම්බන්ධතාවයක් ඇත. ශ්‍රී ලංකාවේ විශාලතම වෙළඳ පාර්ශවකරු ඉන්දියාව වන අතර ඉන්දියාව සමඟ විශාල වශයෙන් වෙළඳ ගනුදෙනු සිදු කරන දකුණු ආසියාවේ රටවල් අතර ශ්‍රී ලංකාවද වේ. දෙරට අතර සිදුවන සමස්ත වෙළඳාම ඇ.ඩො.බි 6 ඉක්මවයි. ඉන්දියාව ශ්‍රී ලංකාව සමඟ විවිධාකාරයෙන් ඇති සංවර්ධන සහයෝගිතාවයන් අතර ඇ.ඩො.බි. 2.6 ක සංවර්ධන ණය අධාර ද ඇතුලුව සංවර්ධන ව්‍යාපෘති සඳහා සහය ලබා දීම වැදගත් වේ.

තීරුබදු ක්‍රමය සරල කිරීමෙන් සහ ප්‍රමාණාත්මක රෙගුලාසි ඉවත් කිරීමෙන් ආනයන සහ අපනයන සඳහා තනි විද්‍යුත් ද්වාරයක් පවත්වා ගැනීම ඇතුලු විදේශීය ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා ශ්‍රී ලංකාව දරණ ප්‍රයත්නය ඕස්ට්‍රේලියාවේ ප්‍රසංශාවට ලක් වන ලදී.

2010 දී සිදු කරන ලද වෙළඳ ප්‍රතිපත්ති සමාලෝචනයෙන් පසුව ශ්‍රී ලංකාවේ ස්ථාවර ආර්ථික කාර්යය පිළිබඳ උනන්දු වූ බවට නවසීලන්ත නියෝජිත විසින් සමාලෝචන ක්‍රියාවලිය අතරතුරේ දී ප්‍රකාශ කරන ලදී. ජාතික සංහිඳියාවක් ඇති කිරීමේ ක්‍රියාවලිය, ව්‍යවස්ථා සංශෝධනය සහ ප්‍රතිසංස්කරණය හා ආර්ථික වර්ධනය අරමුණු කරගත් ප්‍රතිපත්ති හේතුවෙන් ශ්‍රී ලංකාව වඩාත් යහපත් මාර්ගයකට එළැඹී ඇත. පවත්නා වෙළඳ ගිවිසුම් පිළිබඳ නැවත සාකච්ඡා කිරීම, අපනයන ප්‍රවර්ධන උපායමාර්ගයක් ඇති කිරීම, විදේශීය සෘජු ආයෝජන දිරිමත් කිරීම සහ අපනයන විවිධාංගීකරණය ප්‍රවර්ධනය කිරීම යනාදී ශ්‍රී ලංකාවේ ප්‍රධාන කටයුතු නවසීලන්තය විසින් පිළිගනු ලබයි. මෙම පියවරයන් සහ විනිවිදභාවයකින් යුතු අපේක්ෂිත වෙළඳ පරිසරයක් පවත්වා ගැනීම තුලින් ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයට දායක වනු ඇත. දෙරට අතර හුවමාරු වන සිලෝන් තේ සහ කුරුඳු මෙන්ම නවසීලන්ත කිරි නිෂ්පාදන වැනි ගුණාත්මක නිෂ්පාදනයන් අභිමත කරන බවට නවසීලන්තය ප්‍රකාශ කරන ලදී.

දෙරට අතර බොහෝ කලකට පෙර සිටම පැවති යහපත් ආර්ථික වෙළඳ සහයෝගීතාවය ගැන සඳහන් කරමින් ශ්‍රී ලංකාවේ ආර්ථික කාර්ය සාධනය පිළිබඳ චීනය ප්‍රසංශා කරන ලදී. ශ්‍රී ලංකාවේ දෙවන විශාලතම වෙළඳ පාර්ශවකරුවා චීනය වන අතර විදේශීය ආයෝජනයන් හි තෙවන ප්‍රභවය ද වේ. 2015 වර්ෂයේ අවසානයේ සිට මෙම වර්ෂයේ අගෝස්තු මස දක්වා ශ්‍රී ලංකාවේ ආයෝජන එකතුව ඇ.ඩො.මි 890ක් වේ. වාර්ෂික මට්ටමින් චීනයෙන් සිදු කරන ලද ශ්‍රී ලංකාවේ ආයෝජන **70%** කින් වර්ධනය වී ඇත. ශ්‍රී ලංකාවේ විශාලතම සංචාරක කේන්ද්‍රයක් බවට චීනය පත් වී ඇත. නිදහස් වෙළඳ ගිවිසුම පිළිබඳ සාකච්ඡාවන්ගේ සාර්ථක කඩිනම් අවසානයක් චීනය අපේක්ෂා කරනු ලබයි.

රුසියානු ජනරජය ඔවුන්ගේ අවස්ථාවේදී පවසන ලද්දේ ශ්‍රී ලංකාවේ ආර්ථිකය පිළිබඳ සිය රට විසින් අභ්‍යන්තර ගැටුම් නිරාකරණයත් සමඟම උනන්දුවෙන් පසු වූ බවයි. පසුගිය වර්ෂ කිහිපය තුල රුසියාවේ ප්‍රමුඛපෙලේ ආනයනකරුවන්ගෙන් කෙනෙක් ලෙස සිලෝන් තේ රුසියාවට අපනයනය කරමින් ශ්‍රී ලංකාව සිදු කරන ලද ද්වීපාර්ශවීය වෙළඳාමේ ක්‍රමික වර්ධනය පිළිබඳ ඔවුන් අවධානය යොමු කොට ඇත. රුසියාව විසින් ඇ.ඩො.මි **7**ට වඩා ශ්‍රී ලංකාවේ ආයෝජනය කර ඇත.

ලෝක වෙළඳ සංවිධානයේ පකිස්ථාන නියෝජිත විසින් ශ්‍රී ලංකාවේ ආර්ථික කාර්ය සාධනය ප්‍රශංසා කරන ලද අතර සිය රට සමඟ පවතින ද්වීපාර්ශවීය සබඳතා විස්තීරණ ආර්ථික සම්බන්ධතාවයක් තුලින් පුළුල් කොට ශක්තිමත් කිරීමට පකිස්ථානය බලාපොරොත්තු වන බව පවසන ලදී.

වෙළඳ ප්‍රතිපත්ති සමාලෝචන ක්‍රියාවලිය අතරතුර ඉදිරිපත් කිරීම් සිදු කළ බොහෝ සාමාජිකයින් , විදේශීය සෘජු ආයෝජන සඳහා අවශ්‍ය පහසුකම් සංවර්ධනය කිරීමෙන් ශ්‍රී ලංකාවේ අපේක්ෂිත සහ ශක්තිමත් බදු සහ ගාස්තු ව්‍යුහය පිළිබඳ ශ්‍රී ලංකාවේ අවධානය යොමු කරන ලදී. විනිවිද

භාවයකින් යුතු ආයෝජන ප්‍රතිපත්ති මඟින් විදේශීය සෘජු ආයෝජන ආකර්ෂණය කර ගැනීමට ශ්‍රී ලංකාවට හැකියාව ඇත.

සිව්වන වෙළඳ ප්‍රතිපත්ති සමාලෝචනයට ශ්‍රී ලංකාව නියෝජනය කරන ලද්දේ කර්මාන්ත හා වාණිජ කටයුතු ගරු අමාත්‍ය රිෂාඩ් බදියුදීන් මහතාගේ ප්‍රධානත්වයෙන්, වාණිජ අධ්‍යක්ෂ ජනරාල් සහ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යංශයේ වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති අංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව සහ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසිනි.

### 3.2.1. ලෝක වෙළඳ සංවිධානයේදී "Sri Lanka An Emerging Economic Hub (ආසියාවේ නැගී එන ආර්ථික කේන්ද්‍රය ; ශ්‍රී ලංකාව )" ඉදිරිපත් කිරීම

**2016** නොවැම්බර් මස **1-3** දිනවල ලෝක වෙළඳ සංවිධානයේදී පැවත්වූ ශ්‍රී ලංකාවේ සිව්වන වෙළඳ ප්‍රතිපත්ති සමාලෝචනයට සමගාමීව ශ්‍රී ලංකාව අනුග්‍රහ දැක්වීමක් වශයෙන් වෙනත් වැඩසටහනක් දූත මෙහෙවර මඟින් සංවිධානය කරන ලදී. ලෝක වෙළඳ සංවිධානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් යොනෝව් ෆෙඩ්‍රික් අගා **(Yonov Fedric Agah)**මහතා එම වැඩසටහනට සහභාගී වන ලදී. ශ්‍රී ලංකාවේ නියෝජිත කණ්ඩායමේ ප්‍රධානිත්වය දරන ලද්දේ කර්මාන්ත හා වාණිජ කටයුතු ගරු අමාත්‍ය රිෂාඩ් බදියුදීන් මහතා වන අතර ඔහු විසින් **"Sri Lanka An Emerging Economic Hub** (ආසියාවේ නැගී එන ආර්ථික කේන්ද්‍රය ; ශ්‍රී ලංකාව )" යන තේමාව යටතේ **150** ක ටත් වැඩි සහභාගීත්වයක් සහිත සභාවක් ඉදිරි පිටදී ශ්‍රී ලංකාවේ ආර්ථික දෘෂ්ඨිකෝණය පිළිබඳ ඉදිරිපත් කරන ලදී. එහිදී ශ්‍රී ලංකා මහ බැංකුවේ ආර්ථික පර්යේෂණ අංශයේ අතිරේක ලේකම් විසින් ශ්‍රී ලංකාවේ ආර්ථික සහ වෙළඳ ක්‍රියාකාරීත්වය පිළිබඳ සවිස්තරාත්මකව ඉදිරිපත් කරන ලදී. එය වඩාත් සිත් ඇදගන්නාසුලු දේශනයක් වූ අතර ඉන් අනතුරුව ප්‍රශ්නවලට පිළිතුරු ලබදීමේ සැසියක් ද පැවැත්විණි. ශ්‍රී ලංකාවේ මෙම ජයග්‍රහණය පිළිබඳව සහභාගී වූවන් බොහොමයක් ප්‍රශංසා කළ අතර අලුතෙන් පිහිටුවාගත් ජාතික ඒකීය රජයේ දේශපාලන වෙළඳ සහ ආර්ථික ප්‍රතිසංස්කරණයන් පිළිබඳ ඔවුන්ගේ විශ්වාසය තබන ලදී.
ලෝක වෙළඳ සංවිධානයේ සාමාජික රටවල් , ජ්‍යෙෂ්ඨ සාමාජිකයින්, අන්තර්ජාතික වෙළඳ මධ්‍යස්ථානය, ලෝක ආර්ථික සමුළුව, UNCTAD, ලෝක වෙළඳ සංවිධානයේ නීති උපදේශක කේන්ද්‍රය යනාදීන්ගෙන් සභාව සමන්විත විය.

## 3.3. වෙළඳාම හා සංවර්ධනය පිළිබඳ ලෝක වෙළඳ සංවිධාන සමුළුව (UNCTAD)

UNCTAD අමාත්‍ය සමුළුවේ 14 වන සැසිවාරය 2016 ජූලි මස 17-22 දිනයන්හි කෙන්යාවේ නයිරෝබි හි දී පවත්වන ලදී. ශ්‍රී ලංකාව නියෝජනය කරමින් කර්මාන්ත හා වාණිජ කටයුතු ගරු අමාත්‍ය රිෂාඩ් බදියුදීන් මහතා, ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ රාජ්‍ය අමාත්‍ය ගරු සුජීව සේනසිංහ මහතා, ශ්‍රී ලංකා කෙන්යා තානාපති, ලෝක වෙළඳ සංවිධානයේ නිත්‍ය නියෝජිත සහ වාණිජ දෙපාර්තමේන්තුව ආයෝජන මණ්ඩලය සහ විදේශ කටයුතු අමාත්‍යංශය නියෝජනය කරමින් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් එම අවස්ථාවට සහභාගී විය.

සමුළුවේ වැඩසටහන් අතරින් අමාත්‍ය විවාද, ඉහළ මට්ටමේ වට මේස සාකච්ඡා, තේමාත්මක වැඩසටහන්, ලෝක අයෝජන සම්මන්ත්‍රණයක් , ගෝලීය වෙළඳ භාණ්ඩ පිළිබඳ සම්මන්ත්‍රණයක්, තරුණ සංසදයක් සහ සිවිල් සමාජ රැස්වීමක් යනාදිය විශේෂිත විය. ඉදිරි සිව් වසර සඳහා වෙළඳාම සහ සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සමුළුවට අදාල කර්තව්‍යන් ලෙස (නයිරෝබි ඇසිමියෝ) "Nairobi Azimio" (දේශපාලන ප්‍රකාශය ) සහ නයිරෝබි මාෆිකියානෝ "Nairobi Maafikiano" (නයිරෝබි ප්‍රථිඵල සම්මුතිය ) සමුළුව විසින් සම්මත කරගන්නා ලදී.

සංවර්ධනය වෙමින් පවතින රටවල් සහ සංවර්ධිත රටවල් අතර සාධාරණීය වෙළඳාම සුරක්ෂිත කිරීමටත් වෙළඳාම සහ සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සමුළුවේ පූර්ව ගිවිසුම් සඳහා පියවර ගෙන ඇති බවට සහතික කරගැනීමත් මෙම ලේඛන දෙකෙහි අරමුණ වේ.

නයිරෝබි මාෆිකියානෝ ගිවිසුමෙන් UNCTAD විසින් සංවර්ධනය වෙමින් පවතින සාමාජිකයින් හට වෙළඳාම සහ සංවර්ධනය සඳහා අභ්‍යන්තරික සහ සධාරණාත්මක ගෝලීය ආර්ථික පරිසරයක් වෙත ගමන් කිරීම සඳහා සහය විය යුතු ආකාර 4 ක් පහත දැක්වේ.

1. වසර 4 තුලදී වෙළඳාම සහ සංවර්ධනය සඳහා බහුපාර්ශවීයත්වයේ අභියෝග සහ අවස්ථා පිළිබඳ කටයුතු කිරීම UNCTAD වගකීමකි.
2. මාෆිකියානෝ ගිවිසුමේ UNCTAD විසින් සියල්ලටම සෞභාග්‍ය ලඟා කර ගැනීම සඳහා වෙළඳාම, ආයෝජනය, මූල්‍ය සහ තාක්ෂණය ඔස්සේ පරිපූර්ණ හා චිරස්ථායී ආර්ථික වර්ධනයක් ඇති කිරීම සඳහා සිදු කර යුතු කටයුතු කිහිපයක් සඳහන් වේ. මෙහි ප්‍රධාන අරමුණු අතර, දුගීබව තුරන් කිරීම, රැකියා උත්පාදනය, තාක්ෂණික දියුණුව, ආර්ථික විවිධාංගීකරණය සහ ආදායම් විශමතාවය අඩු කිරීම ඇතුලත් වේ.
3. UNCTAD හි තෙවන අවධානය යොමු වන්නේ ප්‍රත්‍යස්ත ආර්ථිකයක් ඇති කිරීම සඳහා වර්ෂ 4 ඇතුලත ආර්ථික ව්‍යුහාත්මක වෙනසක් සහ සහයෝගීතාවයක් ඇති කිරීමයි.
4. අවධානය යොමු කෙරෙන හතරවන අංශය වන්නේ චිරස්ථායී සංවර්ධනය සඳහා 2030 න්‍යාය පත්‍රය වෙළඳාම හා සංවර්ධනය ආශ්‍රිත ගෝලීය සමුළු ආදියට අදාල ප්‍රතිඵල සාධනීයව ක්‍රියාත්මක කිරීම.

## 3.4. වෙළඳාම පහසුකරණ පිළිබඳ ගිවිසුම

ලෝක වෙළඳ සංවිධානයේ වෙළඳාම පහසුකරණ පිළිබඳ ගිවිසුමෙහි මුල් කෙටුම්පත සඳහා ශ්‍රී ලංකාවේ අනුමැතිය ලෝක වෙළඳ සංවිධානයේ අධ්‍යක්ෂ ජනරාල් රොබැර්ටො අසවේදු (Roberto Azevêdo) මහතා වෙත එහි නිත්‍ය නියෝජිතවරයා විසින් 2016 මැයි මස 31 වන දින ඉදිරිපත් කරන ලදී. ලෝක වෙළඳ සංවිධානයේ වෙළඳාම පහසුකරණ පිළිබඳ ගිවිසුම අනුමත කරන ලද 81 වෙනි සාමාජිකයා ශ්‍රී ලංකාව වේ. සාමජික රටවල් මඟින් 3/2 ක් අදාල අනුමත කිරීම් සංඛ්‍යාව (110) සම්පූර්ණ කල පසු ගිවිසුම බලාත්මක වනු ඇත. 2017 ජනවාරි මස 10 වන දින වන විට සාමජික රටවල් 105 විසින් ගිවිසුම අනුමත කර ඇත.

වෙළඳාම පහසුකරණය පිළිබඳ ගිවිසුම සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහ ශක්‍යතා සංවර්ධනය හඳුනා ගැනීමට සහ ප්‍රමාණය තීරණය කිරීමට වාණිජ දෙපාර්තමේන්තුව ලෝක වෙළඳ සංවිධානය, ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානය, ලෝක ආර්ථික සමුළුව තුළින් වෙළඳාම පහසුකරණය සඳහා ගෝලීය සන්ධානය, එක්සත් ජාතීන්ගේ කර්මාන්ත සංවර්ධන සංවිධානය (UNIDO), ලෝක රේගු සංවිධානය සමඟ එකතුව කටයුතු කරයි. අමාත්‍ය මණ්ඩලය විසින් වෙළඳාම පහසුකරණය පිළිබඳ ජාතික කමිටුවක් (NTFC) පිහිටුවීම සඳහා අනුමැතිය ලබාදුන් අතර වෙළඳාම පහසුකරණයට අදාල රාජ්‍ය ආයතන සහ පෞද්ගලික අංශයේ වෙළඳ මණ්ඩලයේ නියෝජිතයන්ගෙන් එම කමිටුව සමන්විත වේ. මෙම වෙළඳාම පහසුකරණය පිළිබඳ ගිවිසුම ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රධාන සම්බන්ධීකරක ලෙස ශ්‍රී ලංකාව විසින් ලෝක බැංකු කණ්ඩායම තෝරාගෙන ඇත. එමනිසා ලෝක බැංකු කණ්ඩායම සමඟ සමීප සම්බන්ධතාවයක් වෙළඳාම පහසුකරණය පිළිබඳ ජාතික කමිටුව විසින් පවත්වා ගත යුතු වේ.

තාක්ෂණික, මූල්‍යමය සහ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා අවශ්‍ය සහය පිළිබඳ සැලසුම් කිරීම සඳහා 2016 නොවැම්බර් මස ලෝක බැංකු කණ්ඩායම විසින් ශ්‍රී ලංකා සංචාරයක නිරත විය.

වෙළඳාම පහසුකරණ ගිවිසුම වඩාත් අවධානයකින් ක්‍රියාත්මක කිරීම සහ සාමූහික සංවිධානයක් ශ්‍රී ලංකාවේ ඇති කිරීම සඳහා 2016 ජූලි මස 25 වන දින ජිනිවා හි දී අන්තර් ආයතන සම්බන්ධීකරණ පළමු රැස්වීම පවත්වන ලදී.

## 3.5. ශ්‍රී ලංකාව තුල ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන සහ ආරක්ෂණ නීති පැනවීම

ශ්‍රී ලංකාව තුල ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන සහ ආරක්ෂණ නීති පැනවීම ක්‍රියාත්මක කිරීම දිගු කලක සිටම අවශ්‍යව පැවතියකි. 2005 මැයි මස 12 වැනි දින අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් නීති කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍යවරුන්ගේ අනුමැතිය ලබා දී ඇත. 2006 ජනවාරි මස පත්‍රිකා දෙකක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදුව 2006 අප්‍රේල් 4 වන දින එය දෙවන වර කියවීම සිදු කරන ලදී. එහිදී අමාත්‍යවරුන් කිහිපදෙනෙකු විසින් පත්‍රිකා දෙකෙහි විධිවිධාන සම්බන්ධයෙන් කරුණු විමසන ලද අතර ඒ පිළිබඳ විශේෂ කමිටු යටතේ තවදුරටත් සාකච්ඡා කරන ලදී. එම රැස්වීම්වල සාකච්ඡා වූ කරුණු අනුව බිල්පත් දෙකෙහි කෙටුම්පතට සුදුසු සංශෝධන සිදු කිරීම සඳහා නීතිකෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යැවීමට තීරණය කරන ලදී. 2010 පෙබරවාරි මස පාර්ලිමේන්තුව විසුරුවා හරින ලද බැවින් එම බිල්පත ඉදිරිපත් කිරීමටත් පෙර අහෝසි වූ බවට සැලකේ. ඉන්පසු 2014 ජූලි මස නවත් අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරන ලද අතර මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ නිරීක්ෂණයන්ට හා නිගමනයන්ට අනුව නීතිපතිවරයා විසින් මෙය ප්‍රමුඛස්ථානයක් දිය යුතු කටයුත්තක් සේ සලකා නීති කෙටුම්පත් කිරීම සිදු කර ඇත. කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය විසින් නව අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරන ලදුව 2016 ඔක්තෝබර් මස 18 වන දින එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දෙන ලදී.

## 3.6 වෙළඳ භාණ්ඩ සඳහා පොදු අරමුදල (CFC)

වෙළඳ භාණ්ඩ සඳහා පොදු අරමුදල (CFC) යනු 1989 එක්සත් ජාතීන්ගේ රාමුව තුල පිහිටුවන ලද ස්වතන්ත්‍ර අන්තර් රාජ්‍ය මූල්‍ය ආයතනයකි. එය එක්සත් ජාතීන්ගේ සාමාජිකයන් 101 දෙනෙකු හා අන්තර් රාජ්‍ය ආයතන 10 කින් යුත් පාර්ශවකරුවන් 111 න් සමන්විත සංවිධානයකි. වෙළඳ භාණ්ඩ සඳහා පොදු අරමුදල (CFC) ආරම්භයේ සිටම ශ්‍රී ලංකාව එහි සාමජිකයකු වන අතර තේ, කිරි නිෂ්පාදන, කුරුළු, කොහුබත්, උණ අංකුර, රබර්, පොල්, මත්ස්‍ය නිෂ්පාදන ආදී භාණ්ඩ අංශ සඳහා ප්‍රතිලාභ ලබන්නෙක්ද වේ. භාණ්ඩ නිෂ්පාදකයින්ගේ සමාජීය-ආර්ථික සංවර්ධනය ඇති කිරීම සමස්ත සමාජීය සංවර්ධනයට දායක වීම යන නියමයෙන් යුතුව CFC දිගින් දිගටම භාණ්ඩ නිෂ්පාදන ක්ෂේත්‍රයෙහි නියැලෙන්නන් හට සහන ණය ප්‍රදාන ලබාදීම මඟින් උපකාර කරයි.

පොදු අරමුදල පිහිටුවීම සඳහා ගිවිසුමේ ප්‍රධාන අංශ 1989 අරමුදල පිහිටුවාගත් දින සිටම විවිධ වෙනස්කම්වලට ලක්වූ බව හඳුනාගනිමින්, ජාත්‍යන්තර සංවර්ධන සුසමාදර්ශය තුල පැතිර පවත්නා මෙහෙයුම් සාර්ථක කරගැනීමට හැකිවන ලෙස ගිවිසුම සංශෝධනය කිරීමට CFC සාමාජිකයින් විසින් එකඟ වන ලදී.

ඒ අනුව, CFC අධ්‍යක්ෂක මණ්ඩල නිර්දේශය ද හා පාලක සභාවේ අනුමැතිය ද ඇතිව සංශෝධන ක්‍රියාවලිය ඇරඹිණි. මුල් ගිවිසුම සඳහා සංශෝධනයන් කිහිපයක් හඳුනාගත් පසු, සංශෝධිත ගිවිසුමේ අවසන් කෙටුම්පත සකස් කෙරිණි. මුල් ගිවිසුම සඳහා සංශෝධන බලාත්මක වන්නේ සියලුම සාමජිකයන් විසින් සිය අනුමැතිය CFC මහ ලේකම් කාර්යාලය වෙත දැනුම්දුන් පසුව ය.

ඒ අනුව වාණිජ දෙපාර්තමේන්තුව කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය හරහා භාණ්ඩ සඳහා පොදු අරමුදල පිහිටුවීමේ සංශෝධිත ගිවිසුම වෙත අනුමැතිය ලබාදීම සඳහා 2016 ඔක්තෝබර් මස අමාත්‍යාංශ සංදේශයක් ඉදිරිපත් කළ අතර නීතිපති ජනරාල්තුමා විසින් සංශෝධිත කෙටුම්පතේ නෛතික අනුමැතියට යටත්ව, ඒ සඳහා 2016 නොවැම්බර් මස අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබිණි.

## 3.7 ගෝලීය වෙළඳ වරණ ක්‍රමය (GSTP)

සංවර්ධනය වෙමින් පවත්නා රටවල් අතර ගෝලීය වෙළඳ වරණ ක්‍රමය (GSTP) පිළිබඳ ගිවිසුම 1989 වර්ෂයේදී ස්ථාපිත කරන ලදී. ගෝලීය වෙළඳ වරණ ක්‍රමය (GSTP) යනු, දකුණ - දකුණ අතර වෙළෙඳාම හා ආර්ථික සහයෝගීතාව වර්ධනය කිරීමේ අරමුණින් වෙළඳාම සහ සංවර්ධනය

පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මේලනයෙහි (UNCTAD) අනුග්‍රහය යටතේ සාකච්ඡා සම්මුතිවලට එළැඹුණු වරණීය තීරුබදු යෝජනා ක්‍රමයකි. මෙම ක්‍රමය යටතේ 2016 වසරේ දී ශ්‍රී ලංකාව ඇ.ඩො.මි 45.14 වටිනා අපනයනයන් ද ඇ.ඩො.මි 0.03 වටිනා ආනයනයන් ද සිදු කර ඇත. ශ්‍රී ලංකාව ප්‍රධාන වශයෙන් මෙක්සිකෝව හා පේරු රාජ්‍යට කුරුඳු අපනයනය කරන අතර 2015 වසරේ මෙම ක්‍රමය යටතේ අපනයනය ට වඩා ඇ.ඩො.මි 4 ක අපනයන පහත වැටීමක් මේ වසරේ දී දක්නට ලැබේ.

## 3.8 යුරෝපා සංගමයේ වරණීය පොදු ක්‍රමය සහ අනෙකුත් වරණීය ක්‍රමයන්හි වර්ධනයන්

### 3.8.1. යුරෝපා සංගමයේ වරණීය පොදු ක්‍රමය

යුරෝපා කොමිසම සහ සංගමයේ පාර්ලිමේන්තුව විසින් 2014.01.01 දින සිට ක්‍රියාත්මක වූ නව GSP යෝජනා ක්‍රමය අනුමත කරනු ලැබ ඇති අතර ශ්‍රී ලංකාව ද එහි අර්ථලාභියෙකි.

තවද 2014 සිට යුරෝපා සංගමයේ වරණීය පොදු ක්‍රමයේ කලාපයන් අතර සමුච්චිත (Cross Regional Cumulation**)** විධිවිධාන යටතේ**,** ඉන්දුනීසියානු සම්භවීය HS ශීර්ෂ 2401 හි නොනිමි දුම්කොළ සක ප්‍රතික්ෂේපිත දුම්කොළ රැස් කිරීම හා යුරෝපා සංගමය වෙත සිගරට් අපනයනය කිරීමට ශ්‍රී ලංකාවට හැකියාව ලැබී ඇත.

#### 3.8.1.1. යුරෝපා සංගමයේ වරණීය පොදු ක්‍රමය නැවත ශ්‍රී ලංකාවට ලබා ගැනීම (EU GSP+)

වාණිජ දෙපාර්තමේන්තුව විසින් යුරෝපා සංගමයේ වරණීය පොදු ක්‍රම පහසුව ශ්‍රී ලංකාවට නැවත ලබා ගැනීම පිළිබඳ අනු කමිටු සමඟ සාකච්ඡා මාලාවක් පැවැත්වීමෙන් අනතුරුව එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර සම්මුති 27 සහ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සම්මුතීන් ට අනුව සිදු කරන ලද අනුකූලතාවන් සහ ප්‍රගතිය පිළිබඳ අදාල තොරතුරු සම්පාදනය කරන ලදී. උපකාරක ඇමිණුම් සියල්ල ඇතුලත් අවසාන වාර්තාව බ්‍රස්ල් හි ශ්‍රී ලංකා දූත මෙහෙයුම හරහා 2016 ජූනි මස 14 වන දින යුරෝපා කොමිසම වෙත ඉදිරිපත් කරන ලදී. යුරෝපා කොමිසම විසින් 2016 ජූලි මස12 වන දින එය භාරගත් බවට සහතික කරන ලදී. 2016 නොවැම්බර් මස යුරෝපා සංගමයේ වෙළඳාම පිළිබඳ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් යුරෝපා කොමිසම විසින් යුරෝපා සංගමයේ පාර්ලිමේන්තුවේ අනුමැතිය යටතේ GSP+ සහනය ශ්‍රී ලංකාවට නැවත ලබා දීමට එකඟ වූ බවට වාණිජ අධ්‍යක්ෂක ජනරාල් වෙත නිල වශයෙන් දැනුම් දෙන ලදී.

### 3.8.2. එක්සත් ජනපද වරණීය පොදු ක්‍රමය (US GSP)

එක්සත් ජනපද වරණීය පොදු ක්‍රමය වැඩසටහන 2013 ජූනි මස 31 වන දින අහෝසි වී 2015 ජූනි මස 29 දින සිට නැවත ව්‍යවස්ථාපිත කරන ලද්දේ 2017 දෙසැම්බර් මස 31 වන දින තෙක් වරණීය පොදු ක්‍රමය සඳහා නැවත අවසර දෙමිනි. මෙම පනත මඟින් GSP ප්‍රතිලාභය 2013 ජූලි 31 දින සිට ක්‍රියාත්මක වන පරිදි සකසා ඇත.

ගෝලීය වරණීය ක්‍රමය යටතේ ඌණ සංවර්ධිත රටවල **(**LDCs**)** සහ අප්‍රිකානු වර්ධනය සහ අවස්ථා පනතට **(**AGOA- African Growth and Opportunity Act) ඇතුලත් රටවල ගමන් භාණ්ඩ සඳහා ලබාදුන් තීරුබදු රහිත සහනය සෑම GSP ලාබී රටකම ගමන් භාණ්ඩ සඳහා ද දීර්ඝ කිරීමට ශ්‍රී ලංකාව අනෙකුත් GSP ලාබීන් සමඟින් ඉල්ලුම් පෙත්සමක් ජාත්‍යන්තර වෙළඳ පාලක මණ්ඩලයට ඉදිරිපත් කරන ලදී.

GSP ලාබී සියලුම රටවල් සඳහා ගමන් භාණ්ඩ තීරු බදු රහිත ක්‍රමවේදය දීර්ඝ කිරීම පිළිබඳ තීරණය ජාත්‍යන්තර වෙළඳ පාලක මණ්ඩලය විසින් 2017 මුලදී නිවේදනය කරනු ලැබේ.

### 3.8.3. ජපාන වරණීය පොදු ක්‍රමය (GSP)

තාවකාලික තීරුබදු පියවර පනත බලාත්මක කිරීම සඳහා ආඥා පනතෙහි සංශෝධනය මුල් කරගනිමින් ලිහිල් කරන ලද වරණීය ප්‍රභවස්ථාන නීති ජපාන වරණීය පොදු ක්‍රමය යටතේ ප්‍රකාශයට පත්කොට ඇත.

සංශෝධනයත් සමඟ නිෂ්පාදිතය රෙදි වර්ගවලින් (තනි ක්‍රියාවලි න්‍යාය ) සිදු කරන අවස්ථාවේ පේෂවීය භාණ්ඩ ලෙස රේගු වර්ගීකරණයෙහි 61 වන පරිච්ඡේදයේ ඇති නිෂ්පාදන (ගොතන හෝ වියන ලද ඇඟළුම්) සුදුසුකම් ලබයි. මෙය 2015 අප්‍රේල් මස 01 සිට බලාත්මක විය.

### 3.9. මාර්ගයෙහි නොදිවෙන ශ්‍රී ලංකාවේ නව වායව ටයර් කිහිපයක් පිළිබඳ ප්‍රතිතෝලන තීරු බදු විමර්ශනය ("OTR")

ජාත්‍යන්තර වෙළඳ පාලක මණ්ඩලය වන එක්සත් ජනපදයේ වාණිජ දෙපාර්තමේන්තුව විසින් 2016 ජනවාරි මස 8 වන දින ශ්‍රී ලංකාව "මාර්ගයෙහි නොදිවෙන ශ්‍රී ලංකාවේ නව වායව ටයර් ***(New pneumatic off road tires)** කිහිපයක් "අනුගෘහිත අපනයනයක යෙදෙන බවට පෙත්සමක් ගොනු කොට ඇත.

ශ්‍රී ලංකාවේ මාර්ගයෙහි නොදිවෙන වායව ටයර් නිෂ්පාදකයන් සඳහා අධාර ලැබෙන වැඩසටහන් 22ක් පිළිබඳ විමර්ශනයක් සිදු කරන ලෙසට පෙත්සම ගොනු කරනු ලැබූ ටයිටන් ටයර් සමාගම සහ එක්සත් ලෝහ, කඩදාසි සහ වන වගා, රබර්, නිෂ්පාදන, බලශක්ති අනුබද්ධිත කාර්මික හා සේවා කම්කරුවන්ගේ ජාත්‍යන්තර සංගමය (පෙත්සම්කරුවන්) එක්සත් ජනපදයේ වාණිජ දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා සිටින ලදී.

එක්සත් ජනපදයේ දේශීය කර්මාන්ත සඳහා හානි සිදු වීම හෝ හානි වීමේ තර්ජනයක් මෙමගින් ඇති වන බවට ද පෙත්සමේ සඳහන් වේ.

පෙත්සමේ සඳහන් වන ශ්‍රී ලංකාවේ නිෂ්පාදකයන්ට ලැබෙන අපනයන සහනාධාරය මෙසේය

- අපනයන සංවර්ධන ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
- සාම්ප්‍රදායික නොවන නිෂ්පාදන අපනයනකරුවන් සඳහා සහන
- අපනයනකරුවන්ගේ සැපයුම් සහ නිෂ්පාදකයන් සඳහා දිරි දීමනා
- අපනයන නිෂ්පාදන ග්‍රාමීය ආයතන සඳහා බදු නිදහස් කිරීම සහ සහන ලබා දීම
- අපනයන සංවර්ධන ප්‍රතිගෙවීම් සඳහා දීමනා
- ඉහළ ආයෝජනයත් සමඟ ඇතිවන එක් එක් කටයුතු සඳහා දීමනා
- අපනයනකරුවන් සඳහා වරණීය එකතු කළ අගය බද්ද
- ජාතිය ගොඩනැගීමේ වරණීය බදු
- වරාය සහ ගුවන් සේවා වරණීය බද්ද
- බදු ප්‍රතිගෙවීමේ ක්‍රමය
- ප්‍රධාන සහ අතරමැදි භාණ්ඩ සඳහා රාජ්‍ය මුල්‍ය බදු සහන/නිදහස් කිරීම්
- අපනයන ණය රක්ෂණ
- අපනයන ණය ඇප

ආධාර වැඩසටහන් මඟින් සිය දේශීය කර්මාන්තයන්ට හානි පැමිණෙන බවත් එක්සත් ජනපද වාණිජ දෙපාර්තමේන්තුව විසින් අදාල ආනයන සඳහා ශ්‍රී ලංකාව තුල ප්‍රතිතෝලිත අනුග්‍රහ ආධාර ලැබෙනවා ද යන්න නිර්ණය කිරීම පිණිස විමර්ශනය අඛණ්ඩව සිදු කළ යුතු බවට එකසත් ජනපද ජාත්‍යන්තර වෙළඳ කොමිසම (ITC) විසින් සිය පළමු තීන්දුව නිකුත් කරන ලදී.

2016 ජූනි මස 13 වන දින දෙපාර්තමේන්තුවේ පළමු තීන්දුව ලැබෙන විටදී ප්‍රතිතෝලන බදු පහත පරිදි ගණනය වී ඇත.

- පළමු තීන්දුව 2.9 (සාම්ප්‍රදායික නොවන නිෂ්පාදන අපනයනකරුවන් සඳහා බදු සහන සහ ජාතිය ගොඩනැගීමේ බදු 2.9 යන චෝදනා ලද වැඩසටහන් දෙකක් සඳහා)
- අපනයන ණය ඇප සඳහා පශ්චාත් පළමු තීන්දුව 0.88

නීතිපති දෙපාර්තමේන්තුවේ ද එක්සත් ජනපද වාණිජ දෙපාර්තමේන්තුවේ නීති ආයතනයේද සහය ඇතුව මූලික ප්‍රශ්නාවලි සහ අතිරේක ප්‍රශ්නාවලි සඳහා පිළිතුරු ලබාදුන් පසු එක්සත් ජනපද වාණිජ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයතන (දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, අයෝජන මණ්ඩලය, ශ්‍රී ලංකා රේගුව, රබර් සංවර්ධන මණ්ඩලය, මුදල් අමාත්‍යංශය සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය) වෙත 2016 අගෝස්තු 23-26 දක්වාද කැම්සො ලෝඩ්ස්ටාර් (පෞද්ගලික) (Camso Loadstar (Pvt) Ltd.) සමාගම වෙත අගෝස්තු 29 දා සිට සැප්තැම්බර් මස 2 තෙක් විමර්ශන මෙහෙයුමක් දියත් කිරීම සඳහා සංචාරයක නිරත විය.

ශ්‍රී ලංකාවේ මාර්ගයෙහි නොදිවෙන වායව ටයර් (OTR) සඳහා ප්‍රතිතෝලන බදු විමර්ශනය (CVD) පිළිබඳ මත විමසුමක් එක්සත් ජනපද වාණිජ දෙපාර්තමේන්තුවේ දී නොවැම්බර් මස 3 දින පැවැත්වීය. වැඩසටහන් තුනක් ප්‍රතිතෝලනාත්මක බවත් සහනාධාර සහ ප්‍රතිතෝලන බදු පියවර පිළිබඳ ගිවිසුමෙහි (SCM Agreement) VII වන ඇමිණුමේ (b) කොටසෙහි දක්වා ඇති කොන්දේසි අනුව 2015 දෙසැම්බර් මස 31 වන දින තෙක් ශ්‍රී ලංකාවට අපනයන සහනාධාර ලබාදීම කොහෙත්ම තහනම් කර නොමැති බවට ශ්‍රී ලංකා රජය කරුණු ගෙන හැර දක්වන ලදී.

කැම්සො ලෝඩ්ස්ටාර් (පෞලි ) සමාගම හා ශ්‍රී ලංකාවේ මාර්ගයෙහි නොදිවෙන වායව ටයර් අපනයනකරුවන් වෙත **2.18%** ප්‍රතිතෝලන බදු අනුපාතිකයක් ලබාදීමෙන් එක්සත් ජනපද වාණිජ දෙපාර්තමේන්තුව විසින් අවසන් නිර්දේශය නිකුත් කරන ලදී.

## 4. ද්විපාර්ශ්වික වෙළඳ සහ ආර්ථික සහයෝගීතාව

2016 වසරේදී, ශ්‍රී ලංකාව සිය ප්‍රධාන වෙළඳ පාර්ශවකරුවන් සහ ශ්‍රී ලංකාව සමඟ වෙළඳාම් කටයුතු කිරීමට එළැඹි වෙනත් රටවල් සමඟ ද්වීපාර්ශවීය වෙළඳාම සහ ආර්ථික සහයෝගීතාවය ප්‍රවර්ධනය කිරීමට දැඩි අවධානයක් යොමු කර ඇත. රුසියාව, යුරෝපා සංගමය, ඉරානය, ඇමරිකා එක්සත් ජනපදය,බෙලාරුසය, බංගලදේශය සහ තුර්කිය යන රටවල් සමඟ වෙළඳ සහ ආර්ථික සබඳතාවන්ට එළැඹී ඇත. සමාලෝචනයට ලක්වන කාල සීමාවේ දී ශ්‍රී ලංකාව විසින් ඉන්දියාව හා පකිස්ථානය සමඟ අත්සන් තබන ලද ද්වීපාර්ශවීය නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ මෙන්ම චීනය, ඉන්දියා සහ සිංගප්පූරුව සමඟ යෝජිත නිදහස් වෙළඳ ගිවිසුම් ශ්‍රී ලංකාවේ වාණිජ අභිරුචියෙහි ප්‍රගමනයේ වැදගත්කම සඳහා ක්‍රියාකර ඇත.

### 4.1. ඉන්දියාව වෙත වෙළඳපොළ ප්‍රවේශය වැඩි දියුණු කිරීම සඳහා වූ සාකච්ඡා:

### 4.1.1. ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA)

1998 දෙසැම්බර් 28 වන දින අත්සන් තබන ලදුව 2000 මාර්තු මස 01 වන දින සිට ක්‍රියත්මක ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම දෙරට අතර වෙළඳාමේ වර්ධනය සඳහා දායක වී ඇත. දේශීය කොටස්කරුවන් මෙන්ම ඉන්දියාවේ අදාල පාර්ශවයන් අතර නිදහස් වෙළඳ ගිවිසුම ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන ගැටලු විසඳීමේ කාර්යයෙහි දෙපාර්තමේන්තුව කටයුතු කරනු ලබයි. එක්ටා (ECTA) ගිවිසුම් ක්‍රියාවලියේ මූලික කොටස ලෙස මෙම ගැටලු යොදා ගන්න ලදී. 2016 පැවති මෙම සාකච්ඡා අතරතුරේදී පොල් ආශ්‍රිත නිෂ්පාදන, සත්ව ආහාර සහ නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ඉන්දියාවට ස්ට්‍රෝබෙරි අපනයනය ආදියෙහි පැවති ගැටලු කිහිපයක් විසඳා ගැනීමට ශ්‍රී ලංකා පාර්ශවයට හැකිවිය.

### 4.1.2. ඉන්දු ශ්‍රී ලංකා ආර්ථික සහ තාක්ෂණික සහයෝගීතා ගිවිසුම (ETCA)

ඉන්දු- ශ්‍රී ලංකා ආර්ථික සහ තාක්ෂණික සහයෝගීතා ගිවිසුමෙහි පළමු වටයේ සාකච්ඡා 2016 අගෝස්තු මස 09-10 දිනවල කොළඹ දී පැවත් වූ අතර එහි දෙවන වටයේ සාකච්ඡා සැප්තැම්බර් මස 29-30 දිනවල නව දිල්ලියෙහි දී පවත්වන ලදී.

පළමු වටයේ සාකච්ඡා අතරතුරේ දී, ගිවිසුමෙහි පුළුල් විෂය පථය පිළිබඳ සාකච්ඡා කරන ලද අතර දෙපාර්ශවයේම එකඟත්වයෙන් යුතුව ශ්‍රී ලංකා පාර්ශවයෙන් ඉදිරිපත් කරන ලද ගිවිසුමෙහි කෙටුම්පත සඳහා මූලික පරිකථනය ඉදිරිපත් කිරීමට ඉන්දියානු පාර්ශවය විසින් එකඟවන ලදී. 2015 මැද භාගය වන විට ශ්‍රී ලංකාවේ අපනයනකරුවන් මුහුණදෙනු ලබන තීරුබදු රහිත ක්‍රියාමාර්ග පිළිබඳ ඉදිරිපත් කරනු ලැබූ ලිපි ගොනුවට පිළිතුරු වශයෙන් ඉන්දියානු පාර්ශවය විසින් දෙවන වටයේ සාකච්ඡාවන්ට පෙරාතුව සිය ප්‍රතිචාරය ලබාදීමට එකඟවන ලදී. නිදහස් වෙළඳ ගිවිසුමට අදාල ගැටලු විසඳා ගැනීම සඳහා ශ්‍රී ලංකාව විසින් නිර්දේශන කොන්දේසි සැපයීමට නියමිත ක්‍රමවත් යාන්ත්‍රණයක් ස්ථාපිත කළ යුතු බවට එකඟ වන ලදී. ECTA මුල් ඇස්වනු වැඩසටහන (ගිවිසුමෙහි එක් කොටසක් පමණක් ක්‍රියාත්මක කරමින් එහි ප්‍රථිඵල විමසා බැලෙන Early Harvest Mechanism) පිළිබඳව ද සාකච්ඡා කරන ලද අතර එහිදී ගම්මිරිස් සහ රෙදිපිළි නිෂ්පාදනයන් සඳහා විශේෂිත අවදානයක් යොමු කරමින් ශ්‍රී ලංකා පාර්ශවය විසින් ඒ සඳහා සලාක ඉවත් කරන මෙන් ඉල්ලීමක් කරන ලදී. ECTA යටතේ සාකච්ඡා පැවත්වීම සඳහා කණ්ඩායම් 7ක් පත් කරන ලදී. වාණිජ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් සාකච්ඡා වටවලදී සඳහා තාක්ෂණික අංශයේ සහය ලබා දෙන ලදී.

දෙවන වටයේ සාකච්ඡාවන්හි දී ඉන්දියානු පාර්ශවයේ තීරුබදු රහිත ක්‍රියාමර්ග පිළිබඳ වූ ලිපි ගොනුවට පිළිතුරු සහ රෙදිපිළි, ගම්මිරිස්, තේ සහ වනස්පති සඳහා සලාක ඉවත් කරන මෙන් ශ්‍රී ලංකාවෙන් සිදු කළ ඉල්ලීම පිළිබඳ වැඩිදුර සාකච්ඡා පවත්වන ලද අතර ඉන්දියානු පාර්ශවය තම කොටස්කරුවන් සමඟ සාකච්ඡා කර දන්වන බවට එහිදී එකඟ වන ලදී. භාණ්ඩ වෙළඳාම හා සේවා වෙළඳාම පිළිබඳ අන්‍යෝන්‍යව පිළිගත් ගිවිසුම් තබාගැනීමේ වැදගත්කම පිළිබඳ දෙපාර්ශවයම

එකඟ විය. ECTA ගිවිසුමට එළැඹීමට ප්‍රථමව මුල අස්වනු වැඩසටහන ක්‍රියාත්මක කිරීම මෙන්ම වෙළඳාම පහසුකරණ කටයුතු තීරණය කොට අවසන් කිරීමේ අරමුණෙන් යුතුව සංශෝධිත යාන්ත්‍රණ කෙටුම්පතක් ලබාදීමට ශ්‍රී ලංකාව විසින් එකඟ වන ලදී. අදාල කණ්ඩායම් වෙන වෙනම එක්වී ගිවිසුමේ අදාල කෙටුම්පත් සටහන පිළිබඳ සාකච්ඡා කරන ලදී.

### 4.2. පකිස්ථානය වෙත වෙළඳපොළ ප්‍රවේශය වැඩි දියුණු කිරීම සඳහා වූ සාකච්ඡා:

#### 4.2.1. පකිස්ථාන- ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA)

2005 වසරේ දී පකිස්ථාන- ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA) බලාත්මක කිරීමත් සමඟ දෙරට අතර සිදුවන ද්වීපාර්ශවීය වෙළඳාමේ දියුණුවට එය මහත් දායකත්වයක් දක්වන ලදී.

ශ්‍රී ලංකා රේගුව විසින් ලබා දුන් දත්ත අනුව සමාලෝචනයට යටත්වන කාල සීමාවේදී ශ්‍රී ලංකා පකිස්ථාන නිදහස් වෙළඳ ගිවිසුම යටතේ පකිස්ථානයට ඇ.ඩො.මි 51.60 ක අපනයනයක් මෙන්ම පකිස්ථානයෙන් ඇ.ඩො.මි 20.72 ආනයනයක් ද සිදු කර ඇත.

සමාලෝචනයට ලක් වූ කාලයේදී PSFTA යටතේ අපනයන කරන ලද්දේ පොල්,බුලත්, වියලි පොල්, (MDF)මධ්‍යම ඝනත්වයෙන් යුතු ෆයිබර් ලෑලි: මි.මි. 9 ක ඝනත්වය ඉක්මවූ, වෙනත් කළු තේ (පැසුණු) සහ වෙනත් තේ යනාදිය වේ.

PSFTA යටතේ එම කාලයේදි ආනයනය කරන ලද නිෂ්පාදන අතර වෙනත්, පාස්සන ලද හෝ කවාකාර යකඩ බට හෝ අමිශ්‍රිත ලෝහ, සහල්, දොඩම් (මැන්ඩරින්), කි.ග්‍රෑ 50 සහ ඊට අඩු පෝර්ට්ලන්ඩ් සිමෙන්ති මිටි, පිටි, අහාර සහ සැකසූ මාළු හෝ මත්ස්‍ය ආහාර, බෙල්ලන් හෝ වෙනත් ජලජ අපෘෂ්ඨවංශීන් වේ.

#### 4.2.2. ශ්‍රී ලංකාව සහ පකිස්ථානය අතර වාණිජ අමාත්‍ය මට්ටමේ රැස්වීමේ 6 වන සැසිවාරය

ශ්‍රී ලංකාව සහ පකිස්ථානය අතර වාණිජ අමාත්‍ය මට්ටමේ රැස්වීමේ 6 වන සැසිවාරය 2016 ජනවාරි මස 4 වන දින කොළඹ දී පැවැත්විය. ශ්‍රී ලංකාවේ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් සහ පකිස්ථාන වාණිජ අමාත්‍යාංශයේ ලේකම් විසින් එහි මුලසුන හොබවන ලදී.

පකිස්ථානයේ තීරු බදු සහන ලැයිස්තුවට මෝටර් රථ අංශයේ අයිතමයන් නැවත ඇතුල් කිරීමත්,නිෂ්පාදන සලාක කිරීම සඳහා වෙළඳපොළ ප්‍රවේශය තවදුරටත් ලිහිල්කරණය කිරීමටත්, ප්‍රමිතීන් සඳහා අන්‍යෝන්‍ය පිළිගත් ගිවිසුම්වලට එළැඹීමටත්, ගැටළු නිරාකරණ යාන්ත්‍රණයක් සැකසීම, ශ්‍රී ලංකාවේ යම් යම් නිෂ්පාදනයන් සඳහා ආනයනික වෙළඳ මිලක් (ITP) පැනවීමටත් අදාල සාකච්ඡා රැස්වීමේදී සිදු කෙරුණි.

### 4.3. නව නිදහස් වෙළඳ ගිවිසුම්වලට එළඹීම

#### 4.3.1. චීනය සහ ශ්‍රී ලංකාව අතර යෝජිත නිදහස් වෙළඳ ගිවිසුම

චීනය සහ ශ්‍රී ලංකාව අතර යෝජිත නිදහස් වෙළඳ ගිවිසුම දියත් කිරීම සඳහා වූ අවබෝධතා ගිවිසුම වෙළඳ සහයෝගිතාවය පිළිබඳ ඒකාබද්ධ කමිටුවෙන් සිදු කරන ලද ශක්‍යතා අධ්‍යනය මත පදනම්ව 2014 සැප්තැම්බර් මස 16 වන දින අත්සන් තබන ලදී.

චීනය සහ ශ්‍රී ලංකාව අතර නිදහස් වෙළඳ ගිවිසුමෙහි උපායමාර්ගික අරමුණ වන්නේ ඇඟලුම් සහ රබර් ආශ්‍රිත නිෂ්පාදන, මැණික් හා ස්වර්ණාභරණ, පොල් ආශ්‍රිත නිෂ්පාදන, ආහාර වර්ග කිහිපයක්, ආදී ශ්‍රී ලාංකික අපනයනය සඳහා, නිදහස් වෙළඳ ගිවිසුම්/කලාපීය වෙළඳ ගිවිසුම්

හරහා ආසියාන් (ASEAN) කලාපය තුල වරණීය ආනයනික බදු වාසිය අත් කරගත් තරඟකාරී සැපයුම්කරුවන් හමුවේ චීන වෙළඳපොළ ප්‍රවේශ අවස්ථා පුළුල් කිරීම සහ තහවුරු කිරීමයි.

පළමු සහ දෙවන වටයේ සාකච්ඡා පිළිවෙලින් 2014 සැප්තැම්බර් මස 17-19 දිනවලිදී කොළඹ දී සහ 2014 නොවැම්බර් මස 26-28 බීජිං හි දී පැවත් විය. තෙවන වටයේ සාකච්ඡා 2016 අගෝස්තු මස 02-04 දිනවල පැවැත් වූ අතර සිව්වන වටයේ සාකච්ඡා 2016 නොවැම්බර් මස බීජිං හි 21-23 දිනයන් හි දී පැවත් විණි.

ශ්‍රී ලංකාවට අතිශයින්ම වැදගත්වන භාණ්ඩ වෙළඳාම පරිච්ඡේදදී 2016 වසරේ පැවති සාකච්ඡා වට දෙකෙහි දී වෙළඳාම ලිහිල්කරණ වැඩසටහන් සඳහා විධික්‍රමයක් සැකසීම පිළිබඳ සවිස්තරාත්මක සාකච්ඡාවක් දෙපාර්ශවය විසින් සිදු කරන ලද අතර භාණ්ඩ වෙළඳාම පිළිබඳ පරිච්ඡේදයේ කෙටුම්පතෙහි වගන්ති පිළිබඳ සාකච්ඡා කොට නිම කරන ලද අතර මෙම වටයේදී වගන්ති බොහොමයක් පිළිබඳ අවසන් තීරණයන්ට එළැඹෙන ලදී.

නිදහස් වෙළඳ ගිවිසුමෙහි වෙළඳාම් ලිහිල්කරණයේ අපේක්ෂිත ප්‍රතිඵලයක් ලෙස දේශීය කර්මාන්ත මත පැටවී ඇති පැටලැවීම් සැලකිල්ලට ගෙන කෙටුම්පත පිළිබඳ විස්තරාත්මකව සකච්ඡා කරන ලදී.

භාණ්ඩ වෙළඳාම පිළිබඳ විධික්‍රමය සම්බන්ධයෙන්, චීනයේ වාණිජ අමාත්‍යාංශයේ නියෝජ්‍ය අමාත්‍යතුමා සහ ශ්‍රී ලංකාවේ අග්‍රාමාත්‍යතුමා මෙන්ම ශ්‍රී ලංකාවේ උපායමාර්ග සංවර්ධන හා ජාත්‍යන්තර වෙළඳ කටයුතු අමාත්‍යතුමා සමඟ 2016 ඔක්තෝබර් මස කොළඹ දී සිදු කරන ලද සාකච්ඡාවන්ගේ තීරණ පිළිබඳ චීන පාර්ශවය විසින් සිහි කැඳවන ලදී. අමාත්‍යවරුන් හා නායකයින් ගේ උපදෙස් පිළිපැදීමට නම්, නිෂ්පාදන ආවරණය 90% ක් ද සෘණ ලැයිස්තුව 10% ක් ද ලෙස එම රැස්වීම්වලදී ගත් තීරණ අනාගත කටයුතුවලට පදනමක් විය යුතු බවට චීන පාර්ශවය විසින් යෝජනා කරන ලදී. ශ්‍රී ලංකා පාර්ශවය විසින් උපායමාර්ග සංවර්ධන හා ජාත්‍යන්තර වෙළඳ කටයුතු අමාත්‍යතුමාගේ උපදෙස් පරිදි ආවරණය කරන ලද්දේ සෘණ ලැයිස්තුවේ උපරිම 30% ක් සහ නිෂ්පාදන ලිහිල්කරණයෙහි 70% කි. මෙය සියලුම රේඛීය අමාත්‍යාංශ, ආයතන, පෞද්ගලික අංශයේ කර්මාන්ත සංගම් සහ පාර්ශවකරුවන්ගෙන් ලබාගත් අනුමැතිය සහ සාකච්ඡාවලි මෙන්ම ඒ සඳහා ලැබෙන ලද පිළිතුරු සැලකිල්ලට ගනිමින් භාණ්ඩ වෙළඳාම සඳහා වූ සාකච්ඡාවන්ගෙන් පෙන්වාදෙන සමස්තය වේ.
ශ්‍රී ලංකාව සහ චීනය අසමමිතික වෙළඳ හා ආර්ථික සම්බන්ධතාවයක් මත සාකච්ඡාවන් සිදු කරන බව හඳුනා ගනිමින් තෙවන වටයේ සාකච්ඡා නැවත ආරම්භ කළ යුතු බවට ශ්‍රී ලංකා පාර්ශවය විසින් චීන පාර්ශවය වෙත පවසන ලදී. එම නිසා තෙවන වටයේ සාකච්ඡාවන්ගේ සිටම ශ්‍රී ලංකාව විසින් ලිහිල්කරණය පිළිබඳ නව විධික්‍රමයක් ඉදිරිපත් කරන ලදී. පළමු සාකච්ඡා වට දෙකෙහි ප්‍රතිඵල පිළිබඳ සැලකිල්ලට ගන්නා මෙන් චීන පාර්ශවය ඉල්ලා සිටි අතර චීන වෙළඳපොළ පරිමාණය සහ අසමමිතික බදු ක්‍රමය හේතුවෙන් සහ දෙපාර්ශවයේ මට්ටම මත ශ්‍රී ලංකාවේ අපනයනකරුවන් හට චීන ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම මඟින් බොහෝ ප්‍රතිලාභ ලබා ගත හැකි බවට විශ්වාසය පල කරන ලදී.

බදු සීමා (Tariff lines) 451 ක් සඳහා කඩිනම් වෙළඳපොළ ප්‍රවේශය ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ ඉල්ලීම පිළිබඳ චීනය සතුටුදායක වන බව යන කොන්දේසිය මත අමාත්‍යවරයාගේ අනුමැතිය අනුව ශ්‍රී ලංකාවේ තාවකාලික යෝජනාවේ සංවේදී නිෂ්පාදන සඳහා සමස්ත බදුවලින් 30% න් සෘණ ලැයිස්තුව සීමා කිරීම චීන පාර්ශවය විසින් අනුමත කරන ලදී. ශ්‍රී ලංකාව චීනය වෙත අපනයන 5 ක් සිදු කළ හැකි වීම, චීනයේ පරිමාණානුකූල පිරිමැසුම් සහ ශක්‍යතාවය, ශ්‍රී ලංකාව කුඩා සහ අවදානමකින් පෙලෙන රටක් වීම සහ අපනයන වාසි අනුව සැලකියයුතු ආදායම් අත්හැරිය යුතු වීම ආදී පිරිවැය හා ප්‍රතිලාභ කරුණු හේතුවෙන් සෘණ ලැයිස්තුවෙන් ආවරණය කෙරෙන 30% ට අමතරව බදු සීමාවන් ගත නොහැකි බව ශ්‍රී ලංකා පාර්ශවය විසින් පවස ලදී.

චීන පාර්ශවය විසින් ශ්‍රී ලංකාවේ යෝජනාව පිළිබඳ සිය කණගාටුව ප්‍රකාශ කරන ලද අතර ඔවුන්ගේ බදු සීමා සහ වෙළඳ ධාරිතාවය යන්න 90% නිෂ්පාදන ආවරණයක් යටතේ ද 10% සෘණ ලැයිස්තුවද නොවෙනස්ව එලෙසටම පවතින බවට පවසන ලදී. ශ්‍රී ලංකා පාර්ශවයේ සමස්ත බදු සීමාවන්ගෙන් 10% ක් සෘණ ලැයිස්තුවෙන් අඩු කිරීමට දිරිමත් කරන ලද අතර විධික්‍රම පිළිබඳ

සාකච්ඡාවන්ගේ මෙන්ම අනෙකුත් ක්‍රමයන්ගේ කාණ්ඩ බිඳ වැටීම් මෙන්ම දිගු වෙනස්වීමේ කාලයන් පිළිබඳ සොයා බැලීමට එකඟ විය.

ශ්‍රී ලංකාව TLP I , TLP II (වෙළදාම ලිහිල්කරණ වැඩසටහන) ලෙස අනුයාත කාල සීමව තුළදී ලිහිල්කරණ කටයුතු පියවර දෙකක් මගින් ආවරණය කෙරෙන ද්වීමාර්ගික තීරුබදු ලිහිල්කරණ වැඩසටහනක් යෝජනා කරන ලදී. එයට පිළිතුරු වශයෙන් චීන පාර්ශවය සිය නිදහස් වෙළඳ ගිවිසුම් අත්දැකීම් මත පවසන ලද්දේ අඩු මට්ටමේ ලිහිල්කරණයක් තුලින් සමබර ප්‍රතිඵලයක් ලබා ගැනීමට අපහසු බවත් අපේක්ෂා භංගත්වයට පත් වීමත් ස්ථාවරත්වයක් නොමැති වීමත් නිසා ආයතනයන්ට ප්‍රතිලාභ ලබා ගැනීමට අපහසු බවත් පවසන ලදී. දිගු ලිහිල්කරණ කාලයක් ලබා ගැනීමට ශ්‍රී ලංකාව අපේක්ෂා කරන්නේ සමහර ආයතන/ කර්මාන්ත සඳහා ක්‍රියාත්මක කරවීමට පෙර හැඩ ගැසීමට අවශ්‍ය නිසා ය. ශ්‍රී ලංකාවේ නිෂ්පාදනයන්ට වෙළඳපොළ ප්‍රවේශය වැඩි දියුණු කිරීමට තීරු බදු රහිත බාධක සඳහා විශේෂ වැදගත්කමක් ආරෝපණය කර ඇත.

භාණ්ඩ වෙළදාම, සේවා, ආයෝජන, සෞඛ්‍ය හා ආරක්ෂණ ප්‍රමිති, ආර්ථික සහ තාක්ෂණික සහයෝගීතාවය, රේගු ක්‍රියා පටිපාටිය, වෙළදාම පහසුකරණය, වෙළඳ පිළියම් යනාදී ක්ෂේත්‍රයන් සඳහා මෙයින් අවකාශය ලැබෙනු ඇත.

නිදහස් වෙළඳ ගිවිසුමෙහි ප්‍රභවස්ථාන නීති පිළිබඳ පරිච්ඡේදය යෝජනා ඉදිරිපත් කිරීමේ ඉල්ලුම් (PSR) යෝජනාවන් බහුතරයකින් එකඟතාවයකට එළඹෙමින් සාකච්ඡා කරන ලදී.

වාණිජ දෙපාර්තමේන්තුව විසින් කණ්ඩායම් 3 ක් මෙහෙයවනු ලබන අතර ඒවා නම් භාණ්ඩ වෙළදාම, ප්‍රභවස්ථාන නීති හා වෙළඳ පිළියම් වේ. එමෙන්ම උපායමාර්ග සංවර්ධන හා ජාත්‍යන්තර වෙළඳ කටයුතු අමාත්‍යංශයේ ප්‍රතිපත්ති මෙහෙයුම යටතේ ක්‍රියාත්මක වන අනෙත් කණ්ඩායම් හයට ම අදාල තාක්ෂණික විශේෂඥ දැනුම ලබා දෙනු ලබයි.

මෙම ප්‍රාරම්භක ක්‍රියාවලිය එක් යාන්ත්‍රණයක් බවට පත් කරණු පිණිස පෞද්ගලික අංශයේ කොටස්කරුවන් හට ද සවිස්තරාත්මක උපදෙස් ලබා දෙන ලදී.

### 4.3.2. සිංගප්පූරුව සහ ශ්‍රී ලංකාව අතර යෝජිත නිදහස් වෙළඳ ගිවිසුම

සිංගප්පූරු පාර්ශවය, උපායමාර්ගික සංවර්ධන හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යංශයේ තීරණයට අනුව විසින් සිදු කරන ලද ශක්‍යතා අධ්‍යනයෙන් පසුව සහ සිංගප්පූරුව සහ ශ්‍රී ලංකාව යන දෙරට විසින්ම නව සහ වඩාත් විස්තීරණ නිදහස් වෙළඳ ගිවිසුමකට **2016** ජූනි මස එළැඹීමට සූදානම් බව ප්‍රකාශයට පත් කරන ලදී.

යෝජිත නිදහස් වෙළඳ ගිවිසුම පිළිබඳ ශ්‍රී ලංකාව හා අදාල ආයතන අතර විෂයපථය සහ එහි ආවරණයන් පිළිබඳ මූලික සාකච්ඡාවන් සිදු කිරීම සඳහා සිංගප්පූරුවෙන් පිරිසක් **2016** ජූලි මස **7** වන දින ශ්‍රී ලංකාවට පැමිණෙන ලදී. ශ්‍රී ලංකාවේ ගරු අග්‍රාමාත්‍යතුමාගේ සිංගප්පූරු සංචාරය අතරතුර ශ්‍රී ලංකාවෙහි ගරු උපායමාර්ගික සංවර්ධන සහ අන්තර්ජාතික වෙළඳ අමාත්‍යතුමා සහ සිංගප්පූරුවෙහි වෙළඳ හා කර්මාන්ත අමාත්‍යතුමා අතර ගිවිසුම හා සම්බන්ධ එකාබද්ධ ප්‍රකාශයක් 2016 ජූලි මස 18 වන දින අත්සන් කරන ලදී. 2016 අගෝස්තු, ඔක්තෝබර් සහ දෙසැම්බර් යන මාසයන්හි කොළඹ සහ සිංගප්පූරුවෙහි දී සාකච්ඡා වට තුනක් පැවැත්වෙන ලදී.

වාණිජ දෙපාර්තමේන්තුව විසින් වැඩ කණ්ඩායම් සඳහා තාක්ෂණික විශේෂඥ සහය ලබා දෙන ලදී. භාණ්ඩ වෙළදාම , වෙළඳ පිළියම් සහ ප්‍රභවස්ථාන නීති යන අනු කමිටු තුනක මූලිකත්වය දරන ලද්දේ වාණිජ දෙපාර්තමේන්තුව විසිනි.

## 4.4. ඒකාබද්ධ ආර්ථික කමිටු සාකච්ඡා (JEC)

වැදගත් වෙළඳ පාර්ශවකරුවන් සමඟ ශ්‍රී ලංකාව ඇතිකරගත් වෙළඳ හා ආර්ථික සහයෝගිතා ගිවිසුම් ආදියෙහි ඒකාබද්ධ ආර්ථික කමිටු සඳහා අදාල කටයුතු සිදු කරන කේන්ද්‍රීය ආයතනය ලෙස වාණිජ දෙපාර්තමේන්තුව ක්‍රියා කරනු ලබයි. ඒකාබද්ධ ආර්ථික කමිටු යටතේ ද්වීපාර්ශවීය වෙළඳ ගිවිසුම් සඳහා තීරණ සැකසීම, සම්බන්ධීකරණය කිරීම හා ක්‍රියාත්මක කිරීම වැනි සියලුම කටයුතු වාණිජ දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි. වෙළඳාම හා සම්බන්ධ කටයුතුවලට අවශ්‍ය තාක්ෂණික සහ ආර්ථික සහයෝගිතාවය දිරිමත් කරමින් එම රටවල් වෙත ශ්‍රී ලංකාවෙන් සිදුකරන අපනයනයන් වර්ධනය කොට විස්තාරණය කිරීමට මෙම ඒකාබද්ධ ගිවිසුම් මඟින් අවස්ථාව සැලසේ.

අදාල වර්ෂයේදී අමාත්‍ය/ලේකම් මට්ටමෙන් පවත්වන ලද පහත සඳහන් ඒකාබද්ධ කමිටු සඳහා සම්බන්ධීකරණ කටයුතු දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී.

### 4.4.1. වෙළඳ, ආර්ථික, විද්‍යා සහ තාක්ෂණික සහයෝගිතාවය පිළිබඳ ශ්‍රී ලංකාව සහ රුසියාව අතර අන්තර් රාජ්‍ය ඒකාබද්ධ කමිටුව

ද්වීපාර්ශවීය වෙළඳ, ආර්ථික, විද්‍යා සහ තාක්ෂණික සහයෝගිතාවය ශක්තිමත් කොට වර්ධනය කිරීම සඳහා පවතින විවිධාකාර වූ ද්වීපර්ශවීය ආර්ථික ගැටලු විසඳා ගැනීමට මාර්ගයන් සහ ක්‍රමයන් සාකච්ඡා කළ හැකි මූලිකම යාන්ත්‍රණය වන වෙළඳ, ආර්ථික, විද්‍යා සහ තාක්ෂණික සහයෝගිතාවය පිළිබඳ ශ්‍රී ලංකාව සහ රුසියාව අතර පළමු 2016 පෙබරවාරි මස 10-12 දිනවලදී මොස්කව් හි දී පැවැත් විය.

ද්වීපාර්ශවීය වෙළඳ සම්බන්ධතාවන්හි සැලකියයුතු ප්‍රමාණයක සොයා නොගත් විභවතාවන් පවතින බැවින්, ද්වීපාර්ශවීය වෙළඳාම, ආයෝජනය සහ විද්‍යා සහයෝගීතාවය වර්ධනය කිරීම සඳහා උපයෝගික මාර්ග සෙවීම සඳහා දෙපාර්ශවයම ඵලදායී සාකච්ඡාවන්හි නිරත විය. රුසියාවේ වෙළඳපොළ තුල සිලෝන් තේ ප්‍රවර්ධනය කිරීම ශක්තිමත් කිරීමටත් ශ්‍රී ලංකාවේ මැණික් ගල් සඳහා වෙළඳපොළ ප්‍රවේශය වැඩි දියුණු කිරීම කෙරෙහිත් සාකච්ඡා වාරයේදී අවධානය යොමු කරන ලදී.

වෙළඳාම, ආයෝජනය, අධ්‍යාපනය, කර්මාන්ත, කෘෂිකර්මාන්ත, රේගු, තාක්ෂනික සහ විද්‍යා යනාදී ක්ෂේත්‍රයන් ශ්‍රී ලංකාවේ හා රුසියාවේ සම්බන්ධතාවය ශක්තිමත් කිරීම සඳහා ඉහළ විභව්‍යතාවයක් ඇති ක්ෂේත්‍රයන් ලෙස හඳුනාගත් අතර යෝජනාවන් රුසියානු පාර්ශවය වෙත විමර්ශනය පිණිස ඉදිරිපත් කරන ලදී.

ශ්‍රී ලංකාවේ අපනයනකරුවන් සඳහා ඔවුන්ගේ මාළු සහ මාළු නිෂ්පාදන අපනයන රුසියානු වෙළඳපොළට යොමු කිරීම සඳහා අවසර දීම පිණිස රොසෙල්කොස්නඩ්සර් (Rosselkhoznadzor), රුසියානු පශු අධිකාරිය විසින් ශ්‍රී ලංකාවේ ධීවර ආයතන පිළිබඳ සිදු කරන විමර්ශනයන් කඩිනමින් සම්පූර්ණ කිරීමට දෙපාර්ශවය විසින් සැසිවාරය අතරතුරේදී එකඟ වන ලදී. බොහෝ කල් පැවති ගැටලුවක් වූ මෙයට කඩිනම් පියවරක් ලෙස, 2016 මාර්තු මස විමර්ශනය සිදු කරන ලදී. අවසාන වාර්තාව රොසෙල්කොස්නඩ්සර් (Rosselkhoznadzor) වෙත ඔවුන්ගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ලැබ ඇත.

### 4.4.2. ශ්‍රී ලංකාව සහ ඉරානය අතර ආර්ථික සහයෝගීතාවය පිළිබඳ ඒකාබද්ධ කමිටුව

දෙරට අතර වෙළඳාම, සංස්කෘතිය, අධ්‍යාපන සහ සමාජීය සම්බන්ධතා වර්ධනය කිරීමේ අරමුණින් යුතුව ශ්‍රී ලංකාව සහ ඉරානය අතර ආර්ථික සහයෝගීතාවය පිළිබඳ ඒකාබද්ධ කමිටුව පිහිටුවන ලදී.

ශ්‍රී ලංකාව සහ ඉරානය අතර ආර්ථික සහයෝගීතාවය පිළිබඳ ඒකාබද්ධ කමිටුවෙහි 11 වන සැසිවාරය ශ්‍රී ලංකාවේ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය ගරු රිෂාඩ් බදියුදීන් මහතා සහ ඉරානයේ බලශක්ති අමාත්‍ය හමීඩ් චිට්චියාන් (Hamid Chitchian) යන අමාත්‍යවරුන්ගේ ප්‍රධානත්වයෙන් 2016 පෙබරවාරි මස 24-25 දිනයන්හි කොළඹ දී පැවැත්විණි. කමිටුවෙහි 11 වන සැසිවාරයේ දී වෙළඳාම, ආර්ථික, රේගු, බැංකු කටයුතු, සෞඛ්‍ය, විද්‍යාව හා තාක්ෂණය, අධ්‍යාපනය සහ සංස්කෘතිය, බලශක්තිය, ප්‍රවාහනය, ඉදිකිරීම් අංශය සහ සන්නිවේදනය ඇතුලු පුළුල් පරාසයක් ආවරණය වන අංශයන් ප්‍රවර්ධනය කිරීමට දෙපාර්ශවය විසින්ම එකඟ වන ලදී.

රෙදිපිළි, පතල් සහ ආහාර සැකසුම් යන කර්මාන්ත ක්ෂේත්‍රයන් අතර තාක්ෂණික සහයෝගිතාවය ඇති කිරීමට දෙපාර්ශවය විසින් සිය අභිරුචිය ප්‍රකාශ කරන ලදී. දෙපාර්ශවය විසින් පහත අවබෝධතා ගිවිසුම්වලට එළඹෙන ලදී.

- රේගු සහයෝගීතාවය පිළිබඳ අවබෝධතා ගිවිසුම
- සෞඛ්‍ය බෙහෙත් ද්‍රව්‍ය සහ වෛද්‍ය උපකරණ පිළිබඳ අවබෝධතා ගිවිසුම
- විද්‍යා තාකෂණ සහ නව නිපැයුම් පිළිබඳ අවබෝධතා ගිවිසුම
- ප්‍රමිති පිළිබඳ අවබෝධතා ගිවිසුම

### 4.4.3. ශ්‍රී ලංකාව සහ ඇමරිකා එක්සත් ජනපදය අතර වෙළඳාම සහ ආයෝජනය පිළිබඳ සැකිළි ගිවිසුම

ශ්‍රී ලංකාව සහ ඇමරිකා එක්සත් ජනපදය අතර වෙළඳාම සහ ආයෝජනය පිළිබඳ සැකිළි ගිවිසුම් කමිටු රැස්වීමේ 12 වන සැසිවාර්ය 2016 අප්‍රේල් 28 දින වොෂින්ටන් හි දී පැවැත්විණි.

ශ්‍රී ලංකාව සහ ඇමරිකා එක්සත් ජනපදය අතර ද්වීමාර්ගික (Two-way) වෙළඳාම සහ ආයෝජනය සැලකිය යුතු මට්ටමකින් නගා සිටුවීමේ අරමුණ ලඟා කර ගැනීමේ පරමාර්ථයෙන් වෙළඳාම සහ ආයෝජනය වර්ධනය කිරීම සඳහා ඒකාබද්ධ ක්‍රියාකාරී සැලැස්මක් රාජ්‍යන් දෙක විසින් සම්මත කරගන්නා ලදී.

ඒකාබද්ධ ක්‍රියාකාරී සැලැස්ම තුළින් වසර පහක් කාලයක් තුළ සිය අරමුණු කරා ලඟා වීමට අපේක්ෂා කරයි. අනෙකුත් වැඩසටහන් අතුරින්, එහි අරමුණු අතර ශ්‍රී ලංකාවේ වෙළඳාම සහ ආයෝජනය ජාත්‍යන්තර මට්ටමේ ඉහළ ප්‍රමිතියකට සකස් කිරීම; ශ්‍රී ලංකාවේ දැනට පවතින අපනයනයන්ගේ තරඟකාරීත්වය ඉහළ දැමීම; විශේෂයෙන්ම කලාපීය සේවා ජාලය තුල ශ්‍රී ලංකාවේ මට්ටම නිසා වාසි ලබන්න වූ නව වෙළඳපොළ සංවර්ධනය; ඇමරිකානු සහ ශ්‍රී ලාංකේය ව්‍යාපාරික ප්‍රජාව අතර සහ සම්බන්ධතාවය ශක්තිමත් කිරීම; ඇමරිකානු වරණීය තීරු බදු ගිවිසුමේ ඉහළ උපයෝජනය; විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ රෙදිපිළි හා අඟළුම් ක්ෂේත්‍රය තුල කම්කරු අයිතීන් ශක්තිමත් කිරීම සහ ජාතීන් සහ පාරිසරික චිරස්ථායීභාවයෙන් යුතු නිෂ්පාදන භාවිතය ප්‍රවර්ධනය; ව්‍යාපාරික අවශ්‍යතාවන් සපුරාලන ආකාරයෙන් යුතු අධ්‍යාපන ක්ෂේත්‍රය ප්‍රතිසංස්කරණය කිරීම; සහ ව්‍යාපාර සහ වෙළඳ ක්ෂේත්‍රය සඳහා විශේෂයෙන් කාන්තාවන් ඇතුලු සමාජයේ සෑම අංශයක්ම බලමුළු ගැන්වීම යනාදී ඇතුලත් වේ.

12 වන රැස්වීම් වාරයේදී එකඟ වූ පරිදි, ක්‍රියාකාරී සැලැස්ම සම්පූර්ණ කොට අවසන් කිරීම සඳහා ශ්‍රී ලංකාව සහ ඇමරිකා එක්සත් ජනපදය අතර වෙළදාම සහ ආයෝජනය පිළිබඳ සැකිළි ගිවිසුම් අන්තර් සැසිවාර රැස්වීමක් 2016 සැප්තැම්බර් මස 1 දින කොළඹ දී පවත්වන ලදී.

### 4.4.4. වෙළදාම සහ ආර්ථික සම්බන්ධතා සහයෝගීතාවය පිළිබඳ ශ්‍රී ලංකාව සහ යුරෝපා සංගමය අතර වැඩ කණ්ඩායම

ද්වීපාර්ශවීය, කලපීය සහ බහුපාර්ශවීය වශයෙන් දෙපාර්ශවයටම ඇතිවන වෙළද හා ආර්ථික සහයෝගීතාවය පිළිබඳ ගැටලු පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා වෙළදාම සහ ආර්ථික සම්බන්ධතා සහයෝගීතාවය පිළිබඳ ශ්‍රී ලංකාව සහ යුරෝපා සංගමය අතර වැඩ කණ්ඩායම් රැස්වීම 2016 මැයි මස 11 වන දින බෙල්ජියමේ බ්‍රසල්ස් හි පවත්වන ලදී. 2016 ජූනි මස මැද වනවිට දී වත් GSP+ අයදුම්පත ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවය වාණිජ අධ්‍යක්ෂ ජනරාල් විසින් මූලිකත්වය දරණ ලද ශ්‍රී ලංකාවේ නියෝජිතයින් පෙන්වා දෙන ලදී.

### 4.4.5. ශ්‍රී ලංකාව හා බෙලාරුස් රාජ්‍යය අතර ඒකාබද්ධ ආර්ථික සහයෝගීතාවය

ශ්‍රී ලංකාව හා බෙලාරුස් රාජ්‍යය අතර ඒකාබද්ධ ආර්ථික සහයෝගීතා රැස්වීමෙහි දෙවන සැසිවාරය 2016 අගෝස්තු මස 19 වන දින බෙලාරුස් ජනරජයේ මින්ස්ක් හි දී පැවැත්විණි. සාකච්ඡා වාරය අතරතුරේදී දෙරටෙහි විද්‍යා සහයෝගීතාවය පිළිබඳ ගිවිසුමකට එළඹීමට දෙපාර්ශවය විසින් එකඟ වන ලද අතර දෙරට අතර ආර්ථික ව්‍යාපෘති සහ වෙළඳ සබඳතා තවදුරටත් වර්ධනය කිරීමේ දිශාවන් පිළිබඳ සාකාච්ඡා කරන ලදී.

### 4.4.6. ශ්‍රී ලංකාව හා තුර්කිය අතර ආර්ථික සහ තාක්ෂණික සහයෝගීතාවය පිළිබඳ ඒකාබද්ධ කමිටු රැස්වීම (JCETC)

ශ්‍රී ලංකාව හා තුර්කිය අතර ආර්ථික සහ තාක්ෂණික සහයෝගීතාවය පිළිබඳ පළමු ඒකාබද්ධ කමිටු රැස්වීම කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය ගරු රිෂාඩ් බදියුදීන්, තුර්කියේ අධ්‍යාපන අමාත්‍ය ගරු ඉස්මෙට් යිල්මාස් (Ismet Yilmaz) යන අමාත්‍යවරුන්ගේ සම නායකත්වයෙන් 2016 නොවැම්බර් මස 11-12 දිනවල දී තුර්කියේ අන්කාරා හි දී පැවැත්විණි. ආර්ථික සහ තාක්ෂණික සහයෝගීතාවය පිළිබඳ ඒකාබද්ධ කමිටුව යනු දෙරටෙහි වෙළඳ හා ආර්ථික සහයෝගීතාවය වර්ධනය කිරීම සඳහා පවතින ගැටලු විසඳා ගැනීමටත් නව යෝජනා පිහිටුවා ගැනීමටත් කදිම තෝතැන්නකි.

ශ්‍රී ලංකාව සහ තුර්කිය අතර වසර 64 ක් පුරාවට නිල වශයෙන් පිහිටුවාගත් රාජ්‍ය තාන්ත්‍රික සබඳතාවන් පවතී. 1991 ශ්‍රී ලංකාව හා තුර්කිය අතර ඒකාබද්ධ කමිටුවක් පිහිටුවීමේ ආරම්භය දෙරට අතර සහයෝගීතාවය පිළිබඳ කඩඉමකි. පළමු රැස්වීම අතරතුර වෙළදාම සහ ආයෝජනය, කර්මාන්ත, කෘෂිකර්මාන්තය සහ ජලජීවී වගාව, නාවික කටයුතු, බල්ශක්ති, ඉදිකිරීම් සහ අධ්‍යාපනය ඇතුලු පුළුල් පරාසයක ක්ෂේත්‍රයන් ඔස්සේ සහයෝගීතාවය ඇතිකර ගැනීම සඳහා දෙපාර්ශවය විසින් එකඟ විය.

### 4.4.7. ශ්‍රී ලංකාව සහ බංගලාදේශය අතර ඒකාබද්ධ ආර්ථික කමිටුව

ශ්‍රී ලංකාව සහ බංගලාදේශය අතර ඒකාබද්ධ ආර්ථික කමිටු රැස්වීමෙහි 5 වන සැසිවාරය 2016 නොවැම්බර් මස 09 වන දින කොළඹ දී පැවත් විය. කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය ගරු රිෂාඩ් බදියුදීන් සහ පකිස්ථානයේ වාණිජ අමාත්‍ය ගරු ටොෆේල් අහමඩ් (Tofail Ahmed) යන අමාත්‍යවරුන්ගේ සහභාගිත්වයෙන් සභාවාරය ආරම්භ කරන ලදී.

ජාතීන් දෙකකට ඔවුන්ගේ අභිරුචීන් මත ආර්ථික සහ වෙළඳ ගැටළු විසඳා ගැනීමට අවස්ථාව සලසා දෙන උසස් මෙවලමක් ලෙස ඒකාබද්ධ ආර්ථික කමිටුව හැඳින්විය හැකිය. ආර්ථික සහ තාක්ෂණික සහයෝගිතාවය පිළිබඳ ශ්‍රී ලංකාව සහ බංගලාදේශය අතර ඒකාබද්ධ ආර්ථික කමිටුව යටතේ වෙළඳ, වාණිජ සහ කර්මාන්ත, ගුවන් සේවා, සංචාරක, නාවික, තොරතුරු තාක්ෂණ යනාදී ක්ෂේත්‍රයන් ඔස්සේ සහයෝගිතාවය වැඩි දියුණු කිරීමට දෙපාර්ශවයම එකඟ වන ලදී.

ශ්‍රී ලංකාව සහ බංගලාදේශය යන රටවල් දෙකම දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA), ආසියා පැසිෆික් වෙළඳ ගිවිසුම (APTA) ලෙස පසුව නම් කරන ලද බැංකොක් ගිවිසුම, බහු-ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල මූලාරම්භයන්ගේ සංවිධානය(BIMST-EC), ගෝලීය වරණීය වෙළඳ ක්‍රමය (GSTP) , කලාපීය සහයෝගීතාවය සඳහා ඉන්දියානු සාගර වටද්දර රටවල සංවිධානය (IOR-ARC) යන සංවිධානයන්ගේ සාමාජිකයින් වේ.

### 4.4.8. ශ්‍රී ලංකාව සහ යුක්‍රේනය අතර වෙළඳ සහ ආර්ථික සහයෝගීතාවය පිළිබඳ අන්තර් රාජ්‍ය ඒකාබද්ධ කමිටුව

අදාල වසර තුලදී වාණිජ දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකාව සහ යුක්‍රේනය අතර වෙළඳ සහ ආර්ථික සහයෝගීතාවය පිළිබඳ අන්තර් රාජ්‍ය ඒකාබද්ධ කමිටුව පිහිටුවීමට අවශ්‍ය කටයුතු සිදු කළ අතර ඒ සඳහා වන ගිවිසුමට අතසන් තැබීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත.

### 4.4.9. මත්ස්‍ය නිෂ්පාදන ආනයනය සඳහා යුරෝපා සංගමයේ තහනම ඉවත් කිරීම (EU-IUU)

වාණිජ දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ ධීවර අධිකාරිය සමඟ මෙන්ම යුරෝපා කොමිසම සමඟ ද එක්ව යුරෝපා අධිකාරීන් විසින් පනවනු ලබන විවිධ කොන්දේසීන්ට අනුකූලව කටයුතු කිරීමට අදාල කටයුතු සිදු කරන ලදී.

ඒ සඳහා තීරණ ක්‍රියාත්මක කිරීමේ මණ්ඩලයේ ප්‍රකාශනය 2016 ජූනි මස 23 දින යුරෝපා සංගමයේ නිල ප්‍රවෘත්ති පත්‍රයේ පල වීමත් සමඟ ම ශ්‍රී ලංකාවෙන් මත්ස්‍ය නිෂ්පාදන ආනයනය සඳහා යුරෝපා සංගමයේ තහනම ඉවත් විය. මත්ස්‍ය නිෂ්පාදන අපනයනය මේ වන විට තහනමට පෙර පැවති ප්‍රකෘති තත්ත්වයට ක්‍රම ක්‍රමයෙන් පත්වෙමින් ඇත.

## 5. කලාපීය ආර්ථික සහයෝගීතාව

ශ්‍රී ලංකාව, ආසියා-පැසිෆික් වෙළඳ ගිවිසුම (APTA), දකුණු ආසියානු වරණීය වෙළඳ ගිවිසුම (SAPTA), දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA), බහු-ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල මූලාරම්භයන් (BIMSTEC) සහ ඉන්දියානු සාගර වටද්දර රටවල සංවිධානය (IORA) වැනි එහි කලාපීය වෙළෙඳ හා ආර්ථික ගිවිසුම් සම්බන්ධයෙන් ප්‍රධාන භූමිකාවක් ලෙස තවදුරටත් කටයුතු කරන ලදී.

### 5.1 ආසියා පැසිෆික් වෙළඳ ගිවිසුම යටතේ සාකච්ඡා පවත්වාගෙන යාම (APTA)

ආසියා පැසිෆික් කලාපය තුල අතිකරගත් පළමු වෙළඳ ගිවිසුම වන්නේ 1975 දී අත්සන් තබන ලද බැංකොක් ගිවිසුම වන අතර එය 2005 වසරේ සිට ආසියා පැසිෆික් වෙළඳ ගිවිසුම **(APTA)** ලෙස හැඳින්වේ.

APTA ස්ථාවර කමිටුවෙහි 49 වන සැසිවාරය 2016 සැප්තැම්බර් මස තායිලන්තයේ බැංකොක් හි දී පැවැත්විය. වෙළඳාම පහසුකරණය, අයෝජන සහ සේවා පිළිබඳ සැකිළි ගිවිසුමෙහි මෙහෙයුම් සනාථ කිරීමේ ක්‍රියාවලිය සහ උපක්‍රම තවදුරටත් වර්ධනය කිරීම පිළිබඳ මෙම සැසිවාරයේදී සාකච්ඡා කරන ලදී. APTA 2017 ජනවාරි මස තායිලන්තයේ බැංකොක් හි පැවැත්වීමට නියමිත අමාත්‍ය මණ්ඩල රැස්වීමේ 4 වන සැසිවාරය අතරතුරදී APTA යටතේ 4 වටයේ සාකච්ඡා අවසන් කළ යුතු බවට සාමාජික රාජ්‍යන් තීරණය කරන ලදී.

විද්‍යුත් ප්‍රභවස්ථාන සහතිකපත් නිකුත් කිරීම සහ ප්‍රභවස්ථාන සහතිකපත් නිකුත් කිරීම සඳහා ලියකියවිලි ගොනුවක් ලබාදීම යන දැක්මෙන් යුතුව, සාමාජික රටවල නියෝජිතයන්ගේ සහභාගීත්වයෙන් දැනුවත් කිරීමේ වැඩමුළුවක් 2016 නොවැම්බර් මස දකුණු කොරියාවේ සෝල් හි දී පැවැත්විය. වැඩමුළුවට සමගාමීව ප්‍රභවස්ථාන නීති සහතික කිරීමට සහ ස්ථිර කිරීම සඳහා මෙහෙයුම් ක්‍රියාවලිය සමාලෝචනය සඳහා ප්‍රභවස්ථාන නීති පිළිබඳ කණ්ඩායම රැස්වීමක් ද පැවැත්විණි.

සමාලෝචනය සිදු කරන වර්ෂය තුල ශ්‍රී ලංකාව ඇ. ඩො. මිලියන 126 ක් වටිනා භාණ්ඩ APTA ගිවිසුම යටතේ අපනයනය කර ඇති අතර ඉන් 70% ක් චීනය වෙතද 25% ක් දකුණු කොරියාව වෙතද වේ. APTA ගිවිසුම යටතේ ශ්‍රී ලංකාවේ ආනයන 2016 වර්ෂය තුල ඇ. ඩො. මිලියන 12.50 ක් වාර්තා වී ඇත.

### 5.2 දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම යටතේ සාකච්ඡා පවත්වාගෙන යාම (SAFTA)

දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම 2004 ජනවාරි මස අත්සන් තැබීමෙන් පසු 2006 ජනවාරි මස සිට බලාත්මක විය. 1995 දී පිහිටුවන ලද දකුණු ආසියානු වරණීය වෙළඳ ගිවිසුමත් (SAPTA) සමඟ ආරම්භ වූ වරණීය වෙළඳාම ප්‍රවර්ධනය කරමින් කලාපීය ආර්ථික සංකලනය කිරීමේ වැඩසටහන තවදුරටත් වැඩි දියුණු කිරීම SAFTA හි අභිප්‍රාය වේ.

2016 වන විට වසර 10න් සම්පූර්ණ කිරීමට නියමිත SAFTA හි වෙළඳාම ලිහිල්කරණ වැඩසටහන යටතේ සංවේදී භාණ්ඩ ලැයිස්තුවේ අරෙන්නට අනෙකුත් නිෂ්පාදන සඳහා තීරු බදු ක්‍රමයෙන් අඩු කරන ලදී. 2015 නොවැම්බර් මස 21 වන දින ශ්‍රී ලංකව සිය තීරු බදු ලිහිල්කරණය TLP පළමුවන අදියර සම්පූර්ණ කරන ලදී. ඌණ සංවර්ධිත රටවල් ද 2016 වන විට එසේ නිම කිරීමට නියමිතය.

TLP හි දෙවන අදියර ද සාර්ථකව සාකච්ඡාකොට අවසන් කර සෑම සාමාජික රටකම ක්‍රියාත්මක කරන ලදී. දෙවන අදියර යටතේ, සිය මූලික සංවේදී ලැයිස්තුවලින් අවම 20% ක් අඩු කිරීමට සාමජිකයන් එකඟ විය. සූක්ෂම ලැයිස්තුවෙන් ඉවත් කරන ලද නිෂ්පාදන සඳහා තීරු බදු අඩු කිරීම ක්‍රමයෙන් 2020 වන විටදී සම්පූර්ණ කළ යුතු අතර ශ්‍රී ලංකාව විසින් එය 2018 වන විට දී සම්පූර්ණ කල යුතුය.

**SAFTA** යටතේ ශ්‍රී ලංකාවේ අපනයනය **2016** වසරේදී ඇ.ඩො.මි **6.9** වන අතර එය **2015** වසරේ වාර්තා වූ අගයට වඩා **55%** ක අඩුවකි. **SAFTA** යටතේ සමස්ත අපනයනයන්ගෙන් **60%** ක අගයක ඉන්දියාව වෙත සිදු කර ඇත. කෙසේවුවත් මෙම ගිවිසුම යටතේ ආනයනය අවම මට්ටමක පවතී. **SAFTA** ගිවිසුමට පෙර පැවති **SAPTA** යටතේ අපනයනය **2016** වසරේදී ඇ.ඩො.මි **2.6** විය.

සාර්ක් (SAARC) රටවල් වෙත ශ්‍රී ලංකාවේ අපනයනයන්ගෙන් 80%කටත් වඩා සිදු වන බැවින් සාර්ක් කලාපය තුල ශ්‍රී ලංකාවේ ප්‍රධාන වෙළඳ පාර්ශවකරුවන් වන ඉන්දියාව සහ පකිස්ථානය සමඟ ශ්‍රී ලංකාව විසින් ඇති කරගන්නා ලද ද්වීපාර්ශවික ගිවිසුම් ද සලකා බැලීමේදී, එම රටවල් සඳහා නැවත SAFTA යටතේ අපනයන් සිදු කිරීමට වීම සාධ්‍ය නොවේ.

## 5.3 නව කලාපීය වෙළඳ ගිවිසුම් සඳහා සාකච්ඡා

### 5.3.1 බහු-ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල මූලාරම්භයන් (BIMSTEC)

බංගලාදේශය, භූතානය, ඉන්දියාව, මියන්මාරය, නේපාලය, ශ්‍රී ලංකාව සහ තායිලන්තය යන රටවල් හතකින් සමන්විත බහු-ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල මූලාරම්භයන්ගේ (BIMSTEC) අරමුණ වන්නේ, සාමාජික රටවල් අතර වෙළඳ ප්‍රවාහයන් වැඩිදියුණු කිරිම සහ කලාපය තුළ වඩා හොඳ ආර්ථික සබඳතා ගොඩනැගීමයි.

තෙවැනි බහු-ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල මූලාරම්භයන්ගේ සමුළුව, 14වැනි බහු-ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල මූලාරම්භයන්ගේ අමාත්‍ය හමුව සහ 16 වැනි බහු-ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල මූලාරම්භයන්ගේ ජ්‍යෙෂ්ඨ නිලධාරි හමුව මාර්තු 1-4 දක්වා මියන්මාරයේ Nay Pyi Taw හිදී පවත්වන ලදී.

අමාත්‍ය හමුව අතරතුරදී, සාමාජික රටවල විදේශ අමාත්‍යවරුන් විසින් බහු-ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල මූලාරම්භයන්ගේ ප්‍රමුඛතා ක්ෂේත්‍රයන්හි ප්‍රගතිය සමාලෝචනය කරන ලද අතර පහත සඳහන් සාධන පත්‍ර අත්සන් කිරීම සඳහා සිය කැමැත්ත පළ කරන ලදී;

- බහු-ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල මූලාරම්භයන්ගේ ස්ථිර ලේකම් කාර්යාලයක් ස්ථාපිත කිරිම පිළිබඳ සාංගමික සංස්ථා පත්‍රය
- බහු-ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල මූලාරම්භයන්ගේ සංස්කෘතික කර්මාන්ත කොමිසමක් සහ බහු-ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල මූලාරම්භයන්ගේ සංස්කෘතික කර්මාන්ත නිරීක්ෂණාගාරයක් ස්ථාපිත කිරිම පිළිබඳ අවබෝධතා ගිවිසුම
- කාලගුණය සහ දේශගුණය සඳහා බහු-ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල මූලාරම්භයන්ගේ මධ්‍යස්ථානයක් පිහිටුවීමට අදාළව බහු-ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල මූලාරම්භයන්ගේ සාමාජික රටවල් අතර සාංගමික සංස්ථා පත්‍රය

වෙළඳ හා ආර්ථික අමාත්‍ය හමුව අතරතුරදී පහත සඳහන් ගිවිසුම් අත්සන් කරනු ලැබීමට ජ්‍යෙෂ්ඨ නිලධාරි හමුවේදී එකඟවන ලදී;

- බහු-ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල මූලාරම්භයන්ගේ නිදහස් වෙළඳ ගිවිසුම (BIMSTEC FTA) සම්බන්ධයෙන් වන ගිවිසුම් රාමුවේ භාණ්ඩ වෙළඳාම පිළිබඳ ගිවිසුම
- බහු-ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල මූලාරම්භයන්ගේ නිදහස් වෙළඳ ගිවිසුම සම්බන්ධයෙන් වන ගිවිසුම් රාමුව සංශෝධනය සඳහා වන සන්ධාන ගිවිසුම
- ආරවුල් බේරුම්කිරීමේ ක්‍රියාපටිපාටි සහ ගිවිසුම් රාමුවේ යාන්ත්‍රණය පිළිබඳ ගිවිසුම
- රේගු කටයුතු සම්බන්ධයෙන් සහයෝගීතාව සහ අන්‍යෝන්‍ය ආධාර පිළිබඳ ගිවිසුම

ශ්‍රී ලංකාවේ වෙළඳාම ලිහිල්කරණ වැඩසටහන (TLP) පාර්ශවකරුවන්ගේ උපදේශකත්වය යටතේ සාමාජික රටවල් එකඟ වූ ආකෘතියකට අනුව සකස් කරන ලදී.

වෙළඳාම ලිහිල්කරණ වැඩසටහනෙහි ආකෘතිය පහත පරිදි වේ :

| | අයිතම සංඛ්‍යාව | % | උගන සංවර්ධිත නොවන රාජ්‍යයන් සඳහා | උගන සංවර්ධිත රාජ්‍යයන් සඳහා |
|---|---|---|---|---|
| ඉක්මන් ඉවත් කිරීම (Fast Track Elimination -FTE) | 505 | 10% | සාමාන්‍ය වාර්ෂික වාරික 4 | සාමාන්‍ය වාර්ෂික වාරික 2 |
| සාමාන්‍ය ඉවත් කිරීම (Normal Track Elimination - NTE) | 2,422 | 48% | දෙවන වසරේ සිට සාමාන්‍ය වාර්ෂික වාරික 6 | දෙවන වසරේ සිට සාමාන්‍ය වාර්ෂික වාරික 4 |
| සාමාන්‍ය අඩු කිරීම (Normal Track Reduction -NTR - 1% to 5%) | 960 | 19% | දෙවන වසරේ සිට සාමාන්‍ය වාර්ෂික වාරික 6 | දෙවන වසරේ සිට සාමාන්‍ය වාර්ෂික වාරික 4 |
| සෘණ ලැයිස්තුව (Negative List-NL) | 1,165 | 23% | අදාල නොවේ | අදාල නොවේ |

BIMSTEC වෙළඳ සාකච්ඡා සම්මුති කමිටුවේ 20 වන සැසිවාරය 2015 සැප්තැම්බර් මස 7-9 දිනයන්හි දී තායිලන්තයේදී පැවැත්විණි. 2014 මියන්මාර්යෙහි පැවති තෙවැනි BIMSTEC සමුළුවෙහි දී සිදු කරන ලද මඟ පෙන්වීම යටතේ 20 වැනි සාකච්ඡා කමිටු රැස්වීමේ ආසන්න අරමුණ වූයේ BIMSTEC නිදහස් වෙළඳ ගිවිසුමෙහි භාණ්ඩ වෙළඳාම සඳහා වන ගිවිසුම නිමා කිරීමයි. වසර 4 කට පෙර එකඟ වූ නිපැයුම් නිශ්චිත නීති (Product Specific Rules) ලැයිස්තුව නැවත සමීක්ෂණයක් සිදු කිරීමට අවශ්‍ය බවට ඉන්දියාව විසින් ප්‍රකාශ කර සිටි බැවින් භාණ්ඩ වෙළඳාම පිළිබඳ ගිවිසුම අවසන් කිරීමට නොහැකි විය. මෙයට අමතරව ආයෝජන හා සේවා පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම් ද පවත්වන ලදී.
ආර්ථික කළමණාකරණය පිළිබඳ අමාත්‍ය කමිටුව විසින් BIMSTEC වෙත TLP ඉදිරිපත් කිරීම සඳහා අනුමැතිය ලබා දී ඇති අතර ඒ අනුව 2016 පෙබරවාරි මස BIMSTEC මහ ලේකම් කාර්යාලය වෙත TLP ඉදිරිපත් කරන ලදී.

### 5.3.2 ඉන්දියානු සාගර වටද්දර රටවල සංවිධානය (IORA)

ඉන්දියානු සාගර වටද්දර රටවල සංවිධානය (IORA) යනු, ඉන්දියානු සාගර වටද්දර රටවල් අතර සහයෝගීතාව සහ සමීප අන්තර් ක්‍රියාකාරීත්වයන් ප්‍රවර්ධනය කිරීම සඳහා රජය, ව්‍යාපාරික ප්‍රජාව සහ විද්වත් ප්‍රජාව යන ත්‍රෛපාර්ශ්වයන් එකට කැටුව එන, එම රටවල් අතර පිහිටුවා ගන්නා ලද කලාපීය සංසදයකි. වෙළඳාම හා ආයෝජනය පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම (WGTI), ඉන්දියානු සාගර වටද්දර රටවල ව්‍යාපාරික සංසදය (IORBF) සහ ඉන්දියානු සාගර වටද්දර රටවල අධ්‍යයන කණ්ඩායම (IORAG) යනාදී වශයෙන්, පාර්ශ්ව කණ්ඩායම් සම්බන්ධයෙන් ක්‍රියාකාරී කණ්ඩායම් තුනක් මේ යටතේ පිහිටුවා ඇත.

කලාපයේ සහ සාමාජික රාජ්‍යයන්ගේ තිරසාර වර්ධනය සහ තුලිත සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සහ කලාපීය ආර්ථික සහයෝගීතාව උදෙසා පොදු පදනමක් ඇතිකිරීම සඳහා ඉන්දියානු සාගර වටද්දර රටවල සංවිධානය විසින්,

i. සමුද්‍රීය ආරක්ෂාව සහ සුරක්ෂිතතාව
ii. වෙළඳාම් සහ ආයෝජන පහසුකරණය
iii. ධීවර කළමනාකරණය
iv. ආපදා අවදානම් කළමනාකරණය,
v. අධ්‍යන, විද්‍යා හා තාක්ෂණ,
vi. සංචාරක හා සංස්කෘතික හුවමාරු
vii. ස්ත්‍රී පුරුෂ සවිබල ගැන්වීම
viii. සමුද්‍රීය ආර්ථික (Blue Economy) යනාදී ප්‍රමුඛ ක්ෂේත්‍ර හඳුනාගෙන ඇත.

කර්මාන්ත හා වාණිජ කටයුතු ගරු අමාත්‍ය රිෂාඩ් බදියුදීන් මහතා **2016** අප්‍රේල් මස **11-13** යන දිනයන් හි ඩුබායි හි දී පැවත්වූ IORA ආර්ථික සහ ව්‍යාපාරික අමාත්‍ය සමුළුවට සහභාගී විය.

සමුළුව ආරම්භ කරන ලද්දේ එක්සත් අරාබි එමිර් රාජ්‍යයේ ආර්ථික කටයුතු ගරු අමාත්‍ය සුල්තාන් බින් සයීඩ් අල් මන්සූරි **(**Mr. Sultan Bin Saeed Al Mansoori**)** මහතා විසිනි. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංවර්ධනය කරමින් සහ චිරස්ථායී සහ පුළුල් ආර්ථික හා සමාජීය සංවර්ධනය සුරක්ෂිත කෙරෙන නව්‍ය ආර්ථික පරිසරයක් ඇතිකළ යුතු බව ඔහු විසින් පෙන්වා දෙන ලදී.

IORA අමාත්‍ය මණ්ඩලයේ 16 වන රැස්වීම සහ ඒ ආශ්‍රිත අනෙකුත් රැස්වීම් 2016 ඔක්තෝබර් මස 12-27 දිනයන්හි ඉන්දුනීසියාවේ බාලි සහ ජකර්තා නගරයන් හි දී පැවැත්වෙන ලදී. අමාත්‍ය මණ්ඩලයේ 16 වන රැස්වීම් 2016 ඔක්තෝබර් මස 27 දින ඉන්දුනීසියාවේ බාලි හි දී පවත්වන ලද අතර අනෙකුත් රැස්වීම් වන ඉන්දියානු සාගර වටද්දර රටවල අධ්‍යන කණ්ඩායමෙහි (IORAG) 22 වන රැස්වීම සහ ඉන්දියානු සාගර ව්‍යාපාර සමුළුවෙහි (IORBF) 22 වන රැස්වීම පිළිවෙලින් ඔක්තෝබර් මස 12, 13 දිනයන්හි දී ජකර්තාහි පැවැත්වෙන ලදී. වෙළඳාම හා අයෝජනය පිළිබඳ වැඩ කණ්ඩායම් (WGTI) හි 16 වන රැස්වීම 2016 ඔක්තෝබර් 24 ද**,** ජ්‍යෙෂ්ඨ නිළධාරීන් **(**CSO) ගේ 18 වන රැස්වීම 25-26 දිනවල බාලි හි දී පැවැත්වෙන ලදී. වෙළඳාම හා අයෝජනය පිළිබඳ වැඩ කණ්ඩායම් සඳහා මෙම වසරේ දී වාණිජ දෙපාර්තමේන්තුව සහභාගී විය.

### 5.3.3 සේවා වෙළඳාම පිළිබඳ සාර්ක් ගිවිසුම (SATIS)

2010 අප්‍රේල් මාසයේදී භූතානයේදී පවත්වන ලද 16 වැනි සාර්ක් සමුළුව අතරතුර දී සාමාජික රාජ්‍යයන්ගේ නායකයින් විසින් සේවා වෙළඳාම පිළිබඳ සාර්ක් ගිවිසුම් කෙටුම්පත අත්සන් කරන ලදී. සියලුම රටවල් මෙම ගිවිසුම සඳහා එකඟතාව පළ කරන ලද අතර සේවා වෙළඳාම පිළිබඳ සාර්ක් ගිවිසුම (SATIS) යටතේ පවත්නා ජාතික බැඳීම් උපලේඛනවල කටයුතු අවසන් කිරීමේ ක්‍රියාවලියෙහි නිරතවන ලදී.

SATIS හි විශේෂඥ කණ්ඩායම් රැස්වීම් කිසිවක් මෙම වර්ෂයේ දී නොපැවත්විය.

SATIS යටතේ ශ්‍රී ලංකාවේ සේවා යෝජනාවලිය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇති අතර SATIS යටතේ සිය සේවා යෝජනාවලිය සූදානම් කර ඇති බවට ශ්‍රී ලංකාව විසින් SAARC මහ ලේකම් කාර්යාලය දැනුවත් කරන ලදී. කෙසේ වුවත් බැඳීම ලේඛණයන්ගේ අවසාන කෙටුම්පත සහාගත වන්නේ සියලුම සාමාජිකයන් තමන්ගේ යෝජනාවලි ඉදිරිපත් කර අවසන් වූ පසුවයි.

# 6. වෙළඳ, ආයෝජන සහ සංචාරක ප්‍රවර්ධනය

## 6.1 විදේශ වාණිජ නියෝජනය

විදේශ රටවල ස්ථාපිත ශ්‍රී ලංකා දූත මණ්ඩල 27ක නිලධාරින් 29 දෙනෙකුගෙන් සමන්විත වාණිජ දෙපාර්තමේන්තුවේ වාණිජ නියෝජනය මගින් වෙළඳාම, ආයෝජනය සහ සංචාරක ව්‍යාපාරය කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් සත්කාරක රටවල ශ්‍රී ලංකාවේ වාණිජ සහ ආර්ථික කටයුතු ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීමෙහිලා නිරත වෙයි. “රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරීත්ව වැඩසටහන” යටතේ වාණිජ නිලධාරින් විසින් ක්‍රියාකාරකම් පුළුල් පරාසයක් ක්‍රියාවට නංවනු ලැබේ. ශ්‍රී ලාංකික අපනයන සඳහා ජාත්‍යන්තර වෙළඳපළ තවදුරටත් පුළුල් කිරීම සහ විවිධාංගීකරණය කිරීම සඳහා, විදේශ රටවල ස්ථාපිත ශ්‍රී ලංකා දූත මණ්ඩලවල සේවයෙහි යොදවා ඇති වාණිජ නිලධාරීන්ගේ සහ ශ්‍රී ලංකාවේ පිහිටි අනෙකුත් සහාය ව්‍යාපාරික සංවිධානවල සහයෝගය ඇතිව, වාණිජ දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාකාරකම් පෙළක් ක්‍රියාවට නංවන ලදී. නව අපනයන වෙළඳපළ හඳුන්වාදීම සහ පවත්නා වෙළඳපළවල වඩාත් යෝග්‍ය පරිසරයක් නිර්මාණය කිරීම තුළින් ජාත්‍යන්තර වෙළඳපළ තුළ ඔවුනගේ වෙළඳපළ කොටස පුළුල් කිරීම සඳහා ප්‍රමුඛ අපනයනකරුවන් වෙත මූලික අවධානය යොමුකරන අතරතුර, වාණිජ නිලධාරීන් විසින් සුළු හා මධ්‍ය පරිමාණ අපනයනකරුවන් වෙත ඔවුනගේ නිෂ්පාදන වෙනුවෙන් ජාත්‍යන්තර වෙළඳපළ ප්‍රවේශයක් ලබාගැනීම සඳහා අඛණ්ඩව සහයෝගය දක්වන ලදී.

විදේශයන්හි සිටින වාණිජ නිලධාරීන් විසින් ඉටුකරන ප්‍රධාන කාර්යයන් පහත සඳහන් පරිදි වේ.

- WTO, CFC, UNCTAD යනාදී බහුපාර්ශවීය සංවිධාන සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කිරීම සහ ද්වීපාර්ශවීය, කලාපීය ප්‍රතිපත්ති සැකසීමට දායක වීම.
- වෙළඳ සහ ප්‍රවර්ධන සාකච්ඡා නියෝජනය කිරීම සහ ක්‍රියාත්මක කිරීමට මෙන්ම අධීක්ෂණය සඳහා දායක වීම.
- ප්‍රභවස්ථාන නීති සහ නිෂ්පාදන සම්භවය පිළිබඳ ගැටලු සඳහා දායක වීම, වාණිජ දේශසීමා සහ ආර්ථික අවශ්‍යතා ආරක්ෂා කිරීම මෙන්ම නියෝජන කටයුතු සහ ප්‍රවර්ධන කටයුතු සිදු කිරීම.
- අපනයන සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය, ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව, ශ්‍රී ලංකා තේ මණ්ඩලය වැනි දේශීය ආයතනයන හා සම්බන්ධව වාණිජ සහ ආර්ථික කටයුතු ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය අන්තර් සම්බන්ධතාවයන් ගොඩ නැංවීමට කටයුතු කිරීම.
- සත්කාරක රටවල වෙළඳ, ආයෝජන සහ සංචාරක ක්ෂේත්‍ර වලට අදාළ රජයේ නිලධාරීන් ජාලගත කිරීම සහ ශ්‍රී ලංකාවේ වාණිජ සහ ආර්ථික කටයුතු වලට අදාළ ගැටළු/කරුණු සම්බන්ධයෙන් විවිධ රාජ්‍ය සහ ජාත්‍යන්තර සංවිධාන වලදී ශ්‍රී ලංකාව නියෝජනය කිරීම.
- සත්කාරක රටෙහි වෙළඳ ප්‍රතිපත්ති වෙනස්කම්, විශේෂයෙන් තීරුබදු සහ තීරුබදු නොවන ක්‍රියාමාර්ග අධීක්ෂණය කිරීම සහ වාර්තා කිරීම.
- සත්කාරක රටවලදී ශ්‍රී ලංකා-විශේෂී (තනි-රට) ප්‍රචාරණ වැඩසටහන් පැවැත්වීම.
- වැදගත් ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශන/අවස්ථා සඳහා ශ්‍රී ලංකාවේ සහභාගීත්වය සංවිධානය කිරීම. මෙය, ශ්‍රී ලාංකික අපනයන ප්‍රවර්ධනය කිරීමෙහිලා වඩාත් ඵලදායී මෙවලමක් වශයෙන් සළකනු ලැබේ.
- ශ්‍රී ලංකාවේ පවත්වන ප්‍රදර්ශන/අවස්ථා සඳහා විදේශීය ව්‍යාපාරික දූත පිරිස් සහභාගීත්වය සංවිධානය කිරීම.

- ව්‍යාපාරික අවස්ථාවන් සොයාබැලීම සඳහා ශ්‍රී ලංකාවෙන් සහ ශ්‍රී ලංකාව වෙත වෙළඳ, ආයෝජන සහ සංචාරක දූත පිරිස් සංවිධානය කිරීම.
- ව්‍යාපාරික අවස්ථාවන් සොයාබැලීම සඳහා ශ්‍රී ලංකාවෙන් සහ ශ්‍රී ලංකාව වෙත පුද්ගල ව්‍යාපාරික සංචාරයන් සංවිධානය කිරීම.
- නව වෙළඳපොල සෙවීම, වෙළඳපොල පර්යේෂණ පැවැත්වීම, වෙළඳපොල තොරතුරු සහ නිෂ්පාදන තොරතුරු බෙදාහැරීම සහ සමීක්ෂණ පැවැත්වීම යනාදී කටයුතු සිදු කිරීම.
- වෙළඳ, ආයෝජන සහ සංචාරක ආශ්‍රිත වෙළඳ විමසුම් සම්බන්ධයෙන් සේවය සැපයීම, විදේශ ව්‍යාපාරිකයින් හමුවීම/ සාකච්ඡා පැවැත්වීම, ශ්‍රී ලාංකික අපනයනකරුවන් සඳහා තාක්ෂණික සහාය ලබාදීම සහ වෙළඳ ආරවුල් විසඳීම යනාදිය.
- තාක්ෂණ හුවමාරු කරගැනීම සඳහා සහාය සහ වෙළඳපොල සංවර්ධන වැඩසටහන් සඳහා සහාය ලබාදීම සහ තාක්ෂණික සහාය ලබාදීම.
- නව භාණ්ඩ සත්කාරක රටවල්වලට පිවිසීමේදී ඒ සඳහා අවශ්‍ය නිරෝධායන කාර්යයන් සිදු කිරීම.
- ශ්‍රී ලංකා රජයේ ටෙන්ඩර් සඳහා සත්කාරක රටෙහි ප්‍රචාරණ කටයුතු සිදු කිරීම.

2016 වසර තුල වාණිජ නිලධාරීන් විසින් සිදුකරන ලද මෙවැනි ආකාරයේ ක්‍රියාකාරකම්වල සාරාංශයක් පහත දැක්වේ.

| | ක්‍රියාකාරකම | | මුළු එකතුව |
|---|---|---|---|
| 1 | සත්කාරක රටවල්වල ශ්‍රී ලංකා-විශේෂී (තනි රට ) ප්‍රවර්ධන වැඩසටහන් (වෙළඳාම/ ආයෝජන / සංචාරක ) | | 49 |
| 2 | ශ්‍රී ලංකාව වෙත සිදු කරන ලද දූත මෙහෙයුම් | නියෝජන ගණන | 96 |
| | | නියෝජිතයින් ගණන | 770 |
| 3 | සත්කාර රටවල් වෙත ශ්‍රී ලංකාවෙන් සිදු කරන ලද දූත මෙහෙයුම් | නියෝජන ගණන | 142 |
| | | නියෝජිතයින් ගණන | 1,005 |
| 4 | ශ්‍රී ලංකාව වෙත පුද්ගල සංචාර | | 253 |
| 5 | සත්කාරක රට වෙත පුද්ගල සංචාර | | 224 |
| 6 | සත්කාරක රටවල සිදු කරන ලද ප්‍රදර්ශන | | 295 |
| 7 | ශ්‍රී ලංකාව තුල පැවති ප්‍රදර්ශන සඳහා සත්කාරක රටවල සහභාගීත්වය | ප්‍රදර්ශන/සල්පිල් ගණන | 62 |
| | | සහභාගී වූවන්/ ප්‍රදරශනකරුවන් ගණන | 485 |
| 8 | පිළිතුරු දුන් වෙළඳ විමර්ශන සංඛ්‍යාව (වෙළඳ/ආයෝජන/සංචාරක ) | | 1,871 |
| 9 | විසඳුම් ලබා දුන් වාණිජ ගැටලු/ ආරවුල් සංඛ්‍යාව | | 228 |
| 10 | ප්‍රවර්ධනය කරන ලද නිෂ්පාදන ක්ෂේත්‍ර ප්‍රමාණය | | 147 |
| 11 | සත්කාරක රටවල්වල වාණිජ නිලධාරීන් විසින් සහභාගී වන ලද ප්‍රදර්ශන/සල්පිල් | | 100 |
| 12 | සත්කාරක රටවල වෙළඳාම පහසුකරණ සහ ව්‍යාපාර ජාලගත රැස්වීම් සඳහා ශ්‍රී ලංකාවේ සහභාගීත්වය | | 244 |
| 13 | වෙළඳපොළ තොරතුරු | | 70 |
| 14 | ජාත්‍යන්තර සම්මේලනයන් හි ශ්‍රී ලංකාව නියෝජනය කිරීම | | 32 |
| 15 | තේ අලෙවි ප්‍රවර්ධනය | | 33 |
| 16 | ආයෝජන ප්‍රවර්ධන කටයුතු | | 245 |
| 17 | සංචාර ප්‍රවර්ධන කටයුතු | | 219 |
| 18 | ව්‍යාපාර ජාලගත වැඩසටහන් | | 204 |

### 6.1.1 කාර්ය සාධන ඇගයීමේ ක්‍රියාමාර්ගයන්

#### 1. අපනයන ප්‍රවර්ධනය

වාණිජ දූත මණ්ඩල නිලධාරීන් විසින් ගැණුම්කරුවන් හා විකුණුම්කරුවන් මුණගැස්වීමේ අන්තර් සම්බන්ධතාවය සිදු කිරීමට අමතරව විදේශ ඇණවුම් සුරක්ෂිත කිරීමේ සාර්ථකත්වය පහත කරුණු මත රඳා පැවතෙනු ඇත. එම කරුණු සඳහා වාණිජ නිලධාරීන් හට මැදිහත් වීමක් සිදු කළ නොහැකිය.

| සූක්ෂම කරුණු | සාර්ව කරුණු |
|---|---|
| සමාගමෙහි සාමාන්‍ය අපනයන සූදානම/ උනන්දුව | තරඟකාරී ආර්ථිකය තුල අඩු නිෂ්පාදන පිරිවැය |
| තරඟකාරී මිල (වෙනත් සැපයුම්කරුවන් සමඟ තරඟ කිරීම ) | තාක්ෂණය සඳහා සිදුකරන ආයෝජන මට්ටම් සහ නව නිපැයුම් මට්ටම |
| නිෂ්පාදනයේ ගුණාත්මක භාවය | රටෙහි සම්පත් උරුමය |
| සැපයුම් ධාරිතාවය - විශාල ඇණවුම් ප්‍රමාණයක් කලට වේලාවට සහ සාමාන්‍ය අයුරින් සම්පූර්ණ කිරීමේ හැකියාව | වෙළඳ පහසුකම් මට්ටම |
| ආනයන රටවල පවත්නා නීති රීතිවලට අනුකූල වීම | අයවැය හැකියාව |
| මූල්‍ය ප්‍රවර්ධන හැකියාව | |

රටක ඉහත සඳහන් කරන ලද සූක්ෂම සහ සාර්ව කරුණු හිතකර අයුරෙන් පැවතීම වාණිජ නිලධාරීන්ගේ කර්තව්‍ය වඩාත් කාර්යක්ෂම කරනු ඇත.

2. *<u>ආයෝජන සහ සංචාරක ප්‍රවර්ධනය</u>*

ඉහත අපනයන ප්‍රවර්ධනය සඳහා වාණිජ නිලධාරීන්ගේ මැදිහත්වීම හා සමානවම, ආයෝජන සහ සංචාරක ප්‍රවර්ධනයෙහිදී ද වාණිජ නිලධාරීන් දේශීය ආයෝජන සහ සංචාරක අවස්ථා හඳුන්වා දීම සිදු කළද එහි  අවසානය දක්වා ඍජු මැදිහත්වීමක් සිදු කළ නොහැක.

උක්ත කරුණු හේතුවෙන් වාණිජ නිලධාරීන්ගේ කාර්ය සාධන අගය කිරීම ආයෝජන හා අපනයන වටිනාකම්හි වර්ධනයක් ලෙසින් අගය කළ නොහැකි අතර එම නිලධාරීන් විසින් ඉහත අන්තර් සම්බන්ධතාවයන් සඳහා සත්කාරක රටෙහි දී ගනු ලබන ප්‍රමාණාත්මකවූත් කාලීනවූත් වෘතියමය දායකත්වය මත එය අගය කළ යුතු වන්නේය.

**විදේශයන් හි සිටින වාණිජ නිළධාරීන් විසින් ඉටුකරන ලද ප්‍රධාන නියෝජන කාර්යයන්:**

- ලෝක වෙළඳ සංවිධානයේ **TRIPS** ගිවිසුම යටතේ භූගෝලීය දර්ෂකයක් වන ශ්‍රී ලාංකික තේ ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ජාතික නීති රීති සම්පාදනයෙහි ලා කටයුතු කිරීම සහ ශ්‍රී ලාංකික කුරුඳු සඳහා විශේෂ වර්ගීකරණයක් වන **HS** වර්ගීකරණය **2007** සිට බලාත්මක වන පරිදි ලබා ගැනීමට කටයුතු කිරීම.

- කුඩා සහ අවදානමකින් පෙළෙන රටක් ලෙස කෘෂිකාර්මික සාකච්ඡා සඳහා ද කෘෂිකාර්මික නොවන සාකච්ඡා සම්බන්ධයෙන් සමානුපාතික නොවන ලෙස බලපෑම් සිදුවන රටක් ලෙස ලෝක වෙළඳ සංවිධානයේ සිදුකෙරෙමින් පවතින දෝහා සාකච්ඡාවන්හි ශ්‍රී ලංකාව නියෝජනය කිරීම.

- ලෝක වෙළඳ සංවිධානයේ **1998, 2003, 2010,** සහ **2016** වසරට අදාලව වෙළඳ ප්‍රතිපත්ති විමසුම් වාර්තා සඳහා ශ්‍රී ලංකාවේ වාර්තාව සම්පාදනය කිරීම.

- කුරුඳුවලට සල්ෆර් ඩයොක්සයිඩ් එක්වීම සම්බන්ධයෙන් යුරෝපා කොමිසම මඟින් නැගුණ චෝදනා මත ශ්‍රී ලංකා කුරුඳුවලට පැනවූ නිල නොවන තහනම ඉවත් කිරීම සඳහා සල්ෆර් ඩයොක්සයිඩ් (**SO2**) ආහාර ආකලනයන් ලෙස කුරුඳු සඳහා භාවිත කිරීම සම්බන්ධයෙන් තත්ත්වයන් වැඩි දියුණු කිරීම පිළිබඳව ජාත්‍යන්තර තත්ත්ව සහතිකයක් සකස් කිරීම සඳහා රෝමයේ පිහිටි ඇලිමෙන්ටෙරියස් කෝඩෙක්ස් (**Codex Alimantarius**) කමිටුවට යෝජනාවලියක් ඉදිරිපත් කිරීම.

- 2004 වර්ෂයේ යුරෝපා සංගමයෙන් කම්කරු අයිතීන් සුරක්ෂිත කිරීම සඳහා විශේෂිත දීමනා ක්‍රමයන් ලබා ගැනීම සඳහා වූ ක්‍රියාවලියට සහ 2005,2008 වර්ෂයන් හි සහ දැනට සකස්වෙමින් පවතින යුරෝපා සංගමයේ GSP + වෙළඳ සහනය නැවත ලබා ගැනීම සඳහා නායකත්වය සැපයීම.

- යුරෝපා සංගමයේ ප්‍රමිතීන් හා අනුකූල නොවන ශ්‍රී ලංකාව විසින් අපනයනය කරන ලද රඳවා තබා ගත් හා ප්‍රතික්ෂේප වූ අපනයන තොග ශ්‍රී ලංකාවේ අපනයනකරුවන්ට සැලකියයුතු අභියෝගයක් වන බැවින් ශ්‍රී ලංකාවේ අපනයන තොග EC විසින් නිකුත් කරන රඳවා තබා ගැනීම සහ ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ පද්ධතියෙහි වේගවත් වෙනස්වීම (RASFF notifications) පිළිබඳ දැනුම්දීම් සම්බන්ධව කටයුතු කිරීම.

- ශ්‍රී ලංකාවේ පළතුරු සහ එළවළු මෙන්ම අනෙකුත් පැළ යුරෝපා සංගමය වෙත අපනයනය සඳහා යහපත් තත්ත්වයකින් යුත් ශාක සඳහා වන සහතිකය සම්බන්ධව පැන නැගෙන ගැටලු ආදිය විශ්ලේෂණය කිරීම සහ ඉතා කෙටි කළකින් ඒ සඳහා ක්‍රියාකාරී සැලස්මක් සැකසීම.

- යුරෝපා සංගමය මඟින් යුරෝපා සංගමයේ නීති විරෝධී විධිමත් නොවන සහ වාර්තා නොවූ මත්ස්‍ය නීතිරීති (IUU) යටතේ ශ්‍රී ලංකාවේ මත්ස්‍ය නිෂ්පාදන ආනයන සඳහා පනවන ලද තහනම ඉවත් කිරීම සඳහා "ඉදිරි සැලසුම්" සම්පාදනය කිරීම සහ ඒ සඳහා සහය වීම. ශ්‍රී ලංකාවේ මත්ස්‍ය ආහාර අපනයනකරුවන්ගේ සංගමය සමඟින් එක්ව ශ්‍රී ලංකාවේ මත්ස්‍ය ආහාර කර්මාන්තය පිළිබඳ Seafood Expo Global හි ජාත්‍යන්තර මාධ්‍ය හමුවේ පවත්වන 2016 අප්‍රේල් මස 27 දින ලද මාධ්‍ය සාකච්ඡාවල ශ්‍රී ලංකාවේ මත්ස්‍ය ආහාර නිෂ්පාදනයන් යුරෝපා සංගමය වෙත අපනයනය කිරීම තහනම් කරමින් යුරෝපා කොමිසම විසින් නිකුත් කරන ලද රතු කාඩ්පත ඉවත් කිරීම සඳහා හේතුවක් විය.

- ප්‍රධාන US GSP + ප්‍රතිලාභීන් සමඟ ක්‍රියාකාරීව සහභාගී වී එම වැඩසටහනට ගමන් භාණ්ඩ අඩංගු කිරීමට කටයුතු සම්පාදනය කිරීම සඳහා ඇමරිකානු කොන්ග්‍රස් සභිකයින් පෙළඹවීම.

- ඇමරිකා එක්සත් ජනපදයේ මාර්ගයෙහි නොදිවෙන නව වායව ටයර් (Off Road Tyre) පිළිබඳ ප්‍රතිතෝලන විමර්ශනයන් සිදු කිරීම.

- 2017 ජනවාරි මස 1 වන දින වන විට සිදු කළ යුතු ලියාපදිංචි ක්‍රියාවලියේ අපහසුතා පිළිබඳ සලකා බැලීමෙන් 2017 දෙසැම්බර් 31 වන දින තෙක් ලියාපදිංචි වූ අපනයනකරුවන්ගේ පද්ධතියේ අයදුම්පත කල් දැමීමට GOSL වෙත යුරෝපා කොමිසමේ බදු සහ රේගු සංගමයේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අවසර ලබා ගැනීම. පනවන ලද අවසාන දිනය වන 2016 ජූනි 30 ට පසු මෙම ඉල්ලීම සිදු කළ ද විශේෂ තත්වය යටතේ එම අවස්ථාව හිමි විය.

- ජර්මනියේ අපනයන ණය අවදානම් ආයතන සමඟ සම්බන්ධතාවයන් පවත්වාගෙන යෑම සහ OECD හි අවදානම් රටවල් පිළිබඳ වර්ගීකරණයෙහි ශ්‍රී ලංකාව ඉහළ නැංවීම සඳහා ඔවුන්ගේ සහය ඉල්ලීම.

- ඉන්දියාවේ නශ්‍ය ආහාර නිෂ්පාදන සහ ඉන්දුනීසියාවේ ආහාර නිෂ්පාදනවල කඩිනම් නිෂ්කාශනය සඳහා ශ්‍රී ලංකාවේ රසායනාගාරයන්ට නිල පිළිගැනීම ලබා දීම සඳහා සහය වීම.

- කොරියාවට මත්ස්‍ය අපනයනය කිරීම ආරම්භ කිරීමට අපේක්ෂා කරන ශ්‍රී ලාංකික මත්ස්‍ය අපනයනකරුවන්ගේ ආයතන පරික්ෂා කර බැලීම සඳහා කොරියාවේ අහාර සහ ඖෂධ සුරක්ෂණ අමාත්‍යාංශයේ කණ්ඩායම වෙත සහය වීම. එම කොරියානු අධිකාරීන් විසින් සිය අනුමැතිය 2017 දී ලබා දීමට නියමිතයි.

- ශ්‍රී ලංකාවේ අපනයන කරුවන් සඳහා ඔවුන්ගේ අපනයන නිෂ්පාදන අර්මේනියා බදු සංගමය, කසකස්ථානය, බෙලාරුසය, කිරිගිස්ථානය සහ රුසියානු සමූහාණ්ඩු වෙළඳපොළට යොමු කිරීම සඳහා අවසර දීම පිණිස රොසෙල්කොස්නඩ්සර් (Rosselkhoznadzor), රුසියානු පශු අධිකාරිය විසින් ශ්‍රී ලංකාවේ ධීවර ආයතන පිළිබඳ සිදු කරන විමර්ශනයන් සම්පූර්ණ එම කණ්ඩායම වෙත සහය වීම.

- අනාගතයේදී ඉතාලියේ රැකියා සඳහා ශ්‍රී ලාංකිකයන් පුහුණු කිරීමට ශ්‍රී ලංකාවේ විදේශීය සේවා නියුක්ති කාර්යාංශයේ අනුමැතිය ලද බඳවා ගැනීමේ රාජ්‍ය නොවන ආයතනයක් වන ඉතාලියේ මහාසාර සමාගමේ (M/S Mahasara Co.) කළමණාකාරීත්වය සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

- නව ව්‍යාපෘති හරහා ශ්‍රී ලංකාවට IFAD අරමුදල් ලබා ගැනීමේ හැකියාවන් සොයා බැලීම සඳහා සහ 2016 වසරේදී පවත්නා ව්‍යාපෘති 3ක තත්වය පිළිබඳ IFAD සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම.

- ජපානයේ තොරතුරු තාක්ෂණ සමාගම් සමඟින් එක්ව කටයුතු කිරීම සඳහා විදේශීය තොරතුරු තාක්ෂණ සමාගම් සඳහා අවස්ථාව ලබා දෙන ජපානයේ ප්‍රථම ගෝලීය තොරතුරු තාක්ෂණ තැන්න වන මිනාමි ඔනුමා "නිගාටා" හි සමාගම් ගොඩනැගීම සඳහා ශ්‍රී ලංකාවේ තෝරාගත් තොරතුරු තාක්ෂණ ආයතන 6 කට සහය ලබා දීම.

- ඉන්දු ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය පිහිටු වීම සඳහා මූලිකත්වය ගැනීම සහ පහසුකම් සැලසීම. ඒ අනුව ඉන්දියාවේ නව දිල්ලියේ හි 2016 මැයි මස 25 දිනත් ශ්‍රී ලංකාවේ කොළඹ දී 2016 නොවැම්බර් මසත් කාර්යාල පිහිටුවන ලදී.

- ජනාධිපතිතුමාගේ ජර්මානු සහ මැලේසියානු සංචාරය මෙන්ම අග්‍රාමාත්‍යතුමාගේ චීන සංචාරයන් හා සමගාමීව ව්‍යාපාරික සම්මන්ත්‍රණ සහ ජාලගත වැඩසටහන් සංවිධානය කිරීම. එමෙන්ම සත්කාරක රටවල වෙළඳ මණ්ඩල සහ වෙළඳ ප්‍රවර්ධන සංවිධාන සහ ශ්‍රී ලංකාවේ ජාලගත වැඩසටහන් සමඟින් ව්‍යාපාරික රැස්වීම්, සම්මන්ත්‍රණ ආදිය වාණිජ නිලධාරීන් විසින් සංවිධානය කරන ලදී.

## 6.2 වෙළඳ සල්පිල් සඳහා සහභාගීත්වය

### 6.2.1. සත්කාරක රටවල පැවත්වන ලද වෙළඳ සල්පිල් සඳහා ශ්‍රී ලංකාවේ සහභාගීත්වය

තොරතුරු හුවමාරු කරගැනීමට අවැසි වේදිකාවක් සඳහා කාර්මික තාක්ෂණයේ සහ විශේෂ වුවමනාවන්ගේ ඉහළ යෑම හමුවේ වෙළඳ සල්පිල් හුදු සල්පිළක මට්ටමේ සිට ගැනුම් හා විකුණුම් සඳහා වැදගත් තොරතුරු සපයන, වෙළඳ පාර්ශවකරුවන්ට හමුවීමේ අවස්ථාව සලසා දෙන සාර්ථක ඵලදායී වෙළඳපොළක් ලෙස වර්ධනය වී ඇත.

වෙළඳ සල්පිල් සඳහා සහභාගීවීම විදේශීය වෙළඳපොළ වෙත ප්‍රවේශ වීම සඳහා යොදා ගතහැකි වඩාත් ඵලදායීය මෙවලමක් බව හඳුනාගනිමින්, සමාලෝචනයට ලක් වන වර්ෂය තුලදී වාණිජ නිලධාරීන් විසින් සත්කාරක රටවල පැවැත්වෙන ලද වෙළඳ සල්පිල් 62ක් සඳහා ප්‍රචාරණ කටයුතු සිදු කරන ලද අතර ශ්‍රී ලංකාවේ තේ, ආහාර සහ බීම, ඇඟළුම්, මැණික් හා ස්වර්ණාභරණ, අත්කම්, මුහුදු ආහාර, ටයර් හා රබර් ආශ්‍රිත නිෂ්පාදන, කොහු ආශ්‍රිත නිෂ්පාදන, කාබනික නිෂ්පාදන, සෞඛ්‍ය සත්කාර නිෂ්පාදන සහ විවිධ නිෂ්පාදන වැනි නිෂ්පාදන ක්ෂේත්‍රයන්හි ප්‍රදර්ශනකරුවන්/නරඹන්නන් 400 කට වැඩි පිරිසක් එම සල්පිල් සහ ප්‍රදර්ශන සඳහා සහභාගී කරවීය. මෙම වෙළඳ සල්පිල් සඳහා ශ්‍රී ලංකාවේ සහභාගීත්වය සංවිධානය කිරීමේදී, ශ්‍රී ලංකාවේ ප්‍රදර්ශනකරුවන් ට නොමිලේ ප්‍රදර්ශන අවකාශයන් ලබා දීම සඳහා අවස්ථාව ලබා ගැනීමට වාණිජ නිළධාරීන්ට හැකිවිය. එහි ප්‍රතිඵලයක් ලෙස අවම පිරිවැයකින් ආකර්ෂණීය ලෙස නිෂ්පාදනයන් ප්‍රදර්ශනය කිරීමට ශ්‍රී ලංකාවට අවකාශය සැලසිණි.

තව ද, ප්‍රථම වරට ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් හි පවත්වන ලද ජාත්‍යන්තර ප්‍රභව ප්‍රදර්ශනය (ඇඟළුම් ) (Sourcing Fair), ස්වීඩනයේ ස්ටොක්හොම් හි පැවති FORMEX වෙළඳ සල්පිල (රෙදිපිළි, සෙරමික් නිෂ්පාදන, සෙල්ලම් බඩු, එකතු කළ අගය සහිත තේ සහ වෙනත් ජීවන රටාවන්ට ඔබින භාණ්ඩ ) ආමේනියාවේ යෙරෙවාන්හි පැවති ජන්වෙක්ස්- යෙරෙවාන් ප්‍රදර්ශනය (Junwex- Yerevan) (වටිනා ගල්) යනාදියෙහි අදාල විදේශීය රටවල ස්ථාපිත වී සිටින වාණිජ නිලධාරීන් විසින් සම්බන්ධීකරණ කටයුතු, සහය දීමේ කටයුතු සිදු කර ඇත.

ප්‍රදර්ශනය සඳහා සහභාගී වන ශ්‍රී ලංකාවේ ප්‍රදර්ශනකරුවන් සඳහා සහ වෙළඳ ප්‍රදර්ශන සඳහා සහ සමගාමීව කටයුතු කරන අදාල රාජ්‍ය නිලධාරීන් සඳහා විවිධ ප්‍රවර්ධන කටයුතු, කර්මාන්ත හා සුපිරි වෙළඳසැල් දාම සංචාරයන්, වැඩමුළු, මාධ්‍ය සාකච්ඡා යනාදිය වාණිජ නිළධාරීන් විසින් සංවිධානය කරයි.

ශ්‍රී ලංකාවේ සහ විදේශීය රටවල පැවැත්වෙන වෙළඳ ප්‍රදර්ශන සඳහා නිසි ප්‍රචාරණ කටයුතු සිදු කිරීමට අමතරව, වාණිජ නිලධාරීන් විසින් අදාල සත්කාරක රටවල පවත්වන වෙළඳ ප්‍රදර්ශන සඳහා නිරන්තරයෙන් සහභාගී වීමත් සිදුකරයි. අදාල වර්ෂය තුල, ව්‍යාපාරික සබඳතා ගොඩනගා ගැනීම සඳහා මෙන්ම අනාගතේ එවැනි ප්‍රදර්ශනයන් ට ශ්‍රී ලංකාවේ සහභාගීත්වය නිර්දේශ කිරීම සඳහා වාණිජ නිලධාරීන් විසින් එවැනි ප්‍රදර්ශන 200කට වැඩි ප්‍රමාණයකට සහභාගී වී ඇත.

### 6.2.2. ශ්‍රී ලංකාවේ පවත්වන ලද වෙළඳ ප්‍රදර්ශන/ සම්මන්ත්‍රණ ප්‍රවර්ධනය කිරීම

ශ්‍රී ලංකාවේ පවත්වන වෙළඳ ප්‍රදර්ශන සහ සල්පිල් සඳහා පුළුල් ප්‍රචාරණයක් විදේශීය රටවල ස්ථාපිත වාණිජ නිළධාරීන් විසින් ලබා දෙනු ලැබේ. මෙම පුළුල් ප්‍රචාරණ ව්‍යාපාරත් සමඟ 2016 වර්ෂය තුල ශ්‍රී ලංකාවේ පවත්වන ලද ප්‍රදර්ශන සහ සල්පිල් සඳහා 300 ට අධික විදේශීය ගැණුම්කරුවන් ප්‍රමාණයක සහභාගීත්වය සංවිධානය කරන ලදී. එමෙන්ම අමාත්‍යවරුන්, රාජ්‍ය නිලධාරීන්, වෙළඳ ප්‍රවර්ධන සංවිධාන සමඟ ඉල්ලීම් මත පෞද්ගලික සාකච්ඡා ද සංවිධානය කරන ලදී.

#### 6.2.2.1. 2016 ලෝක අපනයන සංවර්ධන සමුළුව (WEDF)

2016 ලෝක අපනයන සංවර්ධන සමුළුව යනු ජිනිවා හි ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානයෙන් සිදු කරන ප්‍රධානතම වැඩසටහනක් වන අතර එය 2016 නොවැම්බර් මස 11-13 දිනයන් හි කොළඹ දී පැවැත්විණි. වැඩසටහන සඳහා විදේශීය ගැණුම්කරුවන් ආකර්ෂණය කර ගැනීමට වාණිජ දෙපාර්තමේන්තුව විසින් වාණිජ නිලධාරීන් සමඟින් ක්‍රියාකාරී දායකත්වයක් ලබා දෙන ලදී. සියලුම වාණිජ නිලධාරීන් විසින් මෙය සඳහා පුළුල් ප්‍රචාරණයක් ලබා දුන් අතර ඒ අනුව WEDF වැඩසටහන සඳහා එක්සත් අරාබි එමීර් රාජ්‍ය, ඊජිප්තුව, ප්‍රංශය, ස්විස්ටර්ලන්තය, ජර්මනිය, පකිස්ථානය, මැලේසියාව, ඉන්දියාව, සෞදි අරාබිය, කොරියාව, ඉතාලිය, දකුණු අප්‍රිකාව, ස්වීඩනය, තායිලන්තය, වියට්නාමය සහ ජපානය යන රටවල්වලින් නියෝජිතයින් 171 සහභාගීත්වය සංවිධානය කරන ලදී.

ලෝක වෙළඳ සංවිධානයේ නිත්‍ය නියෝජිතවරයාද මෙම වැඩසටහනෙහි සාමාජිකයකු ලෙස සහභාගී වූ අතර ලෝක අපනයන සංවර්ධන සමුළුව වෙත ඊබේ මහා යුරෝපය (Great Europe of Ebay) හි උප සභාපති එබන් සර්මොන් (Eben Sermon) මහතාගේ ජිනිවා වාණිජ මණ්ඩලයේ ජාත්‍යන්තර සබඳතා අංශයෙහි ප්‍රධානී වින්සන්ට් සබිලියා (Vincent Subilia) මහතාගේ සහභාගීත්වයද සංවිධානය ඔහු විසින් සිදු කරන ලදී.

### 6.3. විදේශීය සෘජු ආයෝජන ප්‍රවර්ධනය

විදේශ රටවල ස්ථාපිත වාණිජ නිලධාරී විසින් රට තුලට විදේශීය සෘජු ආයෝජන ලබාගැනීමෙහි ලා ඉතා වැදගත් මෙහෙයක් ඉටු කරනු ලබයි. එහිදී ඔවුන් විසින් ප්‍රධාන පෙලේ ආයෝජකයන් සහ අයෝජන ආයතන සමඟ මනා සම්බන්ධතාවයක් පිහිටුවා ගනු ලබයි. මීට අමතරව ශ්‍රී ලංකාවේ නිෂ්පාදන කර්මාන්ත වඩාත් පුළුල් කිරීම සඳහා බලවත් බද්ධ ව්‍යාපාර පාර්ශවකරුවන් හඳුනා ගැනීමට ශ්‍රී ලංකාවෙන් පරිබාහිර ව්‍යාපාරික නියෝජිතයන් සමඟ ව්‍යාපාර හමු සංවිධානය කිරීමද ඔවුන් සිදු කරනු ලබයි.
ඒ අනුව අදාල වර්ෂයේදී, වාණිජ නිලධාරීන් විසින් එක් එක් ක්ෂේත්‍රයට අදාල සවිමත් ආයෝජකයන් හමු වී දිවයිනෙහි පවතින ආයෝජන අවස්ථා පිළිබඳ විස්තර සැපයීමට කටයුතු කර ඇත.

දේපල සංවර්ධනය, ටයර් නිෂ්පාදනය, ගෘහ භාණ්ඩ නිෂ්පාදන, රෙදිපිළි නිෂ්පාදනය, තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය, අපජල පිරියම්, ජල පිරියම් සහ පවිත්‍රකරණය, වැලි පර සංවර්ධනය, ඉදිකිරීම් කර්මාන්තය, සංචාරක ක්ෂේත්‍රය, වාහන කොටස් එක්ලස් කිරීමේ කර්මාන්තය, රොන්මඩ ඉවත් කිරීම, දුම්රිය මාර්ග, රෝහල් උපකරණ, දේපල හා සංචාරක හෝටල්, සිමෙන්ති ඇඹරුම් සහ මිටි ඇසිරීම් නිෂ්පාදන ක්ෂේත්‍ර, බලශක්ති ක්ෂේත්‍රය, ලෝහ නල නිෂ්පාදන කර්මාන්ත, විදුලිබල හා බලශක්ති, විදුලිබල හා බලශක්ති, වරාය හා සංචාරක මෙහෙයුම්,සුපිරි වෙළඳසැල් ව්‍යාපෘති, සූර්ය බලශක්ති ව්‍යාපෘති, මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘති, මාර්ග සලකුණු අවශ්‍යතා නිෂ්පාදන ව්‍යාපෘති යනාදී ක්ෂේත්‍රයන් සඳහා විදේශීය අයෝජකයින්ගේ ඉල්ලුම් 107 මෙම වර්ෂය තුලදී වාණිජ නිලධාරීන් හට ලැබෙන ලදී.

ජෝන් කීල්ස් දේපල සංවර්ධන (John Keels Property Developer) ආයතනය සහ JVR Pvt.Ltd ,HNB බැංකුව සමඟ ශ්‍රී ලංකාවේ දේපල වෙළඳපොළ තුල ආයෝජනය කිරීම ප්‍රවර්ධනය සඳහා ඩුබායි හි දී පැවති දේපල ප්‍රවර්ධන ප්‍රදර්ශනය සඳහා සහය ලබා දෙන ලදී. සමස්ත අපනයනය ඇ.ඩො.මි. 1 වන ඩුබායි සහ මැද පෙරදිග පිහිටුවා ඇති ඉන්දියාවේ විශාලතම සමාගමක් වන Lulu Hypermarket අති සුපිරි

වෙළඳපොළ වෙත කටුනායක පිහිටි කෘෂිකාර්මික නිෂ්පාදන එකතු කිරීමේ සහ සකස් කිරීමේ මධ්‍යස්ථානය සමඟ සම්බන්ධ කිරීම සඳහා අවශ්‍ය කරන සහය ලබා දෙන ලදී. එක්සත් අරාබි එමීර් රාජ්‍යට පළමු ප්‍රේෂණය සිදු කරමින් නොවැම්බර් මස දී සමාගම විසින් ඔවුන්ගේ වාණිජ මෙහෙයුම සිදු කිරීම ආරම්භ කරන ලදී.

ශ්‍රී ලංකාවේ අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ සහභාගීත්වයෙන් උදෑසන වටමේස සාකච්ඡාවක් බෙල්ගොලක්ස් සහ ශ්‍රී ලංකා ව්‍යාපාර කවුන්සිලය (Belgolux- Sri Lanka Business Council) සමඟ බෙල්ජියමේ රෙනේසොන්ස් බ්‍රසල්ස් හෝටලයෙ හි (Renaissance Brussels Hotel) දී 2016 ඔක්තෝබර් මස 20 වන දින පැවැත් විය. මෙම සැසිවාරය සඳහා යුරෝපීය සමාගම් 46 ක් ද, වාණිජ මණ්ඩලයන්හි, සංගම්වල, සමිති ආදියෙහි ප්‍රධාන නියෝජිතයින් ද යුරෝපා කොමිසම සහ පාර්ලිමේන්තුව ද සහභාගී විය. මෙහි ප්‍රථිඵලයක් ලෙස ෆ්ලැන්ඩෙර්ස් ආයෝජන සහ වෙළඳාම (Flanders Investment & Trade (FIT)), බ්‍රසල්ස් ආයෝජන සහ අපනයන (Brussel Invest & Export (BIE)) සහ වැලෝනියා අපනයන ආයෝජන ආයතනය (Wallonia Export – Investment Agency (AWEX))විසින් 2016 නොවැම්බර් මස 29 සිට දෙසැම්බර් මස 2 දක්වා ශ්‍රී ලංකාව වෙත පැමිණ තොරතුරු රැස්කිරීමේ වෙළඳ මෙහෙයුමක් සංවිධානය කරන ලදී.

### 6.4. සංචාරක ප්‍රවර්ධනය

වාණිජ නිලධාරීන් විසින් සංචාරක ක්ෂේත්‍රයේ විභවීය ලක්ෂණ හඳුනා ගනිමින් ශ්‍රී ලංකාව ආකර්ෂණීය සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ සහ ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ සහයද ඇතිව, විදේශ රටවල් තුල විවිධ ප්‍රවර්ධන වැඩසටහන් සංවිධානය කරනු ලබයි. විශේෂ සංසද සහ සම්මේලන සංවිධානය, සංචාරක කණ්ඩායම් සඳහා සංචාර සංවිධානය, සංචාරක ප්‍රවර්ධන වැඩසටහන් සූදානම් කිරීම, ජාත්‍යන්තර සංචාරක සල්පිල් සඳහා සහභාගී වීමට අවස්ථාව සලසා දීම, මාධ්‍ය නියෝජන, ශ්‍රී ලංකාව වෙත FAM සංචාර, සංචාර ප්‍රවර්ධන මණ්ඩල පිහිටුවීම, සත්කාරක රට තුල විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යන්ගෙන් ප්‍රචාරණ කටයුතු සිදු කිරීම ආදිය ශ්‍රී ලංකාව ආකර්ෂණීය සංචාරක ගමනාන්තයක් බවට පත් කිරීම සඳහා වාණිජ නිළධාරීන් විසින් අනුගමනය කරනු ලබන ප්‍රධාන ක්‍රමෝපායන් වේ.

සමාලෝචනයට ලක්වන කාල සීමාව තුල වාණිජ නිළධාරීන් විසින් එක්සත් රාජධානිය,සිංගප්පූරුව, ඉන්දියාව (චෙන්නායි, මුම්බායි සහ නව දිල්ලිය ), මැලේසියාව, දකුණු කොරියාව, ඉතාලිය, සෞදි අරාබිය, ස්වීඩනය, චීනය, බෙල්ජියම, ජර්මනිය, රුසියාව සහ එකසත් ජනපදය යන රටවල පැවත් වූ චාරිකා සහ සංචාරක ප්‍රදර්ශන 22 ට සහභාගීවීමට ශ්‍රී ලංකාවේ 380 ට වැඩි චාරික හා සංචාරක සමාගම් සහ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන මණ්ඩලය සහ ශ්‍රී ලංකා ගුවන් සේවා සඳහා සම්බන්ධීකරණ කටයුතු සහ අවස්ථාව ලබා දෙන ලදී.

පොදුවේ සහ සංචාරක ක්ෂේත්‍රය අතර සංචාරක ප්‍රවර්ධනය සඳහා වඩාත් ඵලදායී මෙවලම වන්නේ තෝරා ගත් නගරයක පවත්වන විවිධ ප්‍රවර්ධන වැඩසටහන් ඇතුලත් ප්‍රදර්ශන වේ. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා ගුවන් සේවා සහ ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තය එකතුවෙන් වාණිජ නිලධාරීන් විසින් චීනය (තියැන්ජින් සහ ශෙන්යැං, චෙන්ජු සහ චෙන්ගැං, සිඈං) මැලේසියාව, බ්‍රසල්ස්, ස්වීඩනය (ස්ටොක්හොම්), ඩෙන්මාර්කය (කෝපන්හේගන්), නොර්වේ (ඔස්ලෝ) මුල් කරගත් ප්‍රදර්ශන සංවිධානය කරන ලදී.

රටක් සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීමට නිෂ්පාදන දැනුම සහ / හෝ ප්‍රදේශ පිළිබඳ දැනුම වර්ධනය කිරීම සඳහා වඩාත් කාර්යක්ෂම ක්‍රමයන් වන්නේ සංචාරක නියෝජිතයෙකු හෝ මෙහෙයවන්නෙකු වෙත FAM මාධ්‍ය චාරිකා පැවැත්වීමයි. ඒ අනුව ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන මණ්ඩලය, ඉන්දියාව, බෙල්ජියම, ජර්මනිය, ඉතාලිය, ස්වීඩනය, ඊජිප්තුව, මැලේසියාව යන රටවල වාණිජ නිලධාරීන් සමඟ එක්වී සංචාරක නියෝජිතවරුන්, චාරිකා මෙහෙයවන්නන් 100 ක ට වැඩි පිරිසක් වෙත FAM මාධ්‍ය චාරිකා සංවිධානය කර ඇත. 2016 ඔක්තෝබර් 31 සිට නොවැම්බර් 4 දක්වා කොළඹ දී ප්‍රංශ සංචාරක නියෝජිත සංගමය කැඳවීමෙන් පැවැත් වූ වැඩසටහනට දේශීය සංචාරක පාර්ශවකරුවන් ද සමඟ සංචාරක නියෝජිතයින් 300 ට අධික ප්‍රමාණයක් සහභාගී විය. මෙවන් වැඩසටහනක් ආසියාවේ පැවැත් වූ දෙවන වතාව මෙය වේ.

ඉතාලියේ, ස්වීඩනයේ සහ ප්‍රංශයේ රූපවාහිනී නාලිකාවල ශ්‍රී ලංකාවේ සංචාරක ගමනාන්ත, ආහාර පිළිබඳ විස්තරාත්මක වැඩසටහන් විකාශනය කරන ලද අතර විවිධ සඟරාවන් හි ඒ පිළිබඳ ලිපි ද 2016 වසර තුල පල කරන ලදී.
තවද, සත්කාරක රටවල ශ්‍රී ලංකාවේ සංචාරක ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් යුතුව සංස්කෘතික සැඳෑවන් (රුසියාව, දකුණු කොරියාව, ඉන්දියාව (නව දිල්ලිය, මුම්බායි )), සංචාරක නියෝජිතයින්/ චාරිකා මෙහෙයවන්නන් සඳහා වැඩමුළු, ශ්‍රී ලංකීය සමාගම් හි සංචාරය කිරීම සඳහා ව්‍යාපාරික රැස්වීම්, ඉදිරිපත් කිරීම්, ප්‍රවර්ධන මෙවලම් බෙදාහැරීම් යනාදිය වසර පුරාවට පැවති විවිධ වැඩසටහන්වලදී වාණිජ නිලධාරීන් විසින් සංවිධානය කර ඇත.

## 6.5 වෙළඳ, ආයෝජන සහ සංචාරක කටයුතු පිළිබඳ විමසීම් සපුරාලීම

වාණිජ දෙපාර්තමේන්තුව සහ වාණිජ නිලධාරීන් දේශීය හා විදේශීය ව්‍යාපාරිකයන්ගේ වෙළඳාම පිළිබඳ පැනනගින්නා වූ ප්‍රශ්න සඳහා විසඳුම් ලබා දීමේදී විශේෂ සේවාවක් සිදු කරයි. විදේශ පාර්ශවකරුවන්ගේ වෙළඳ විමසීම් මෙන්ම ආයෝජන සහ සංචාරක කටයුතු සම්බන්ධව සිදු කරන විමසීම් සඳහා විදේශ රටවල ස්ථාපිත වාණිජ දූත මණ්ඩල නිලධාරීන් සම්බන්ධ වෙයි. අදාල වසර තුලදී එවැනි ගැටලු ආසන්න වශයෙන් 506ක් වාණිජ නිලධාරීන් වෙත ලැබී ඇති අතර ශ්‍රී ලංකාව ආකර්ෂණීය ආයෝජන හා සංචාරක ගමනාන්තයක් වශයෙන් ද ශ්‍රී ලංකාවේ නිෂ්පාදන විදේශීය වෙළඳපොළේ හි ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ද ඇතිව වාණිජ නිලධාරීන් විසින් ඒ සඳහා සුදුසු මග පෙන්වීම ලබා දී ඇත.

විදේශීය ගැණුම්කරුවන් විසින් ඉදිරිපත් කර ඇති එවැනි විමසීම් අදාල ශ්‍රී ලංකික අපනයනකරුවන්ට සෘජුවම මෙන්ම වාණිජ මණ්ඩල, අපනයන සංවර්ධන මණ්ඩලය ආදී ආයතනවල සාමාජිකයන්ගෙන්/ අපනයනකරුවන්ගෙන් ලැබෙන විමසීම්වලට අදාල විදේශීය ගැණුම්කරුවන් සොයා ගැනීම සඳහා ද වාණිජ නිලධාරීන් සිය සහාය ලබා දෙනු ලබයි.

එමෙන්ම ආයෝජන සහ සංචාරක කටයුතු සම්බන්ධයෙන් වාණිජ නිලධාරීන් වෙත් ලැබෙන විමසීම් වලට ඔවුන් විසින්ම සුදුසු පරිදි තොරතුරු සහ සහය ලබාදීම මෙන්ම ශ්‍රී ලංකාවෙහි අදාල ආයතන/ අමාත්‍යංශ වෙත යොමු කිරීම ද සිදු කරයි.

## 6.6 වෙළඳ ආරවුල් විසඳීමට සහය

අපනයනකරුවන් හා ආනයනකරුවන් අතර ඇතිවන වාණිජ ආරවුල් සඳහා සාමකාමී විසඳුම් ලබදීමට වාණිජ දෙපාර්තමේන්තුව මැදිහත් වේ. අපක්ෂපාතී සහ සාමකාමී විසඳුම් සොයාගැනීම හා අන්‍යෝන්‍යව සාකච්ඡා කොට විසඳා ගැනීම කෙරෙහි අවධානය යොමු කරමින් ඒ සඳහා සුදුසු පියවර ගනු ලබයි.

අපනයන හා ආනයනකරුවන් අතර ඇතිවන වෙළඳ ආරවුල් සුහදශීලී අයුරින් විසඳා ගැනීම සඳහා වාණිජ දෙපාර්තමේන්තුව විසින් මැදිහත් වනු ලබයි. එලෙස ගනු ලබන පියවර අතිශයින්ම අපක්ෂපාතී සහ සුහදශීලී මෙන්ම අනොන්‍යව ගිවිසගත් දෑ නිරවුල් කිරීම අරමුණු කොට සිදු කරනු ලබයි

සමාලෝචනය සිදු කරන කාල සීමව තුල එවැනි වෙළඳ ගැටලු 228 ක් සඳහා වාණිජ නිලධාරීන් මැදිහත්වී ඇති අතර වාණිජ දෙපාර්තමේන්තුවට එවැනි ගැටලු 47 ක් ලැබී ඇත. පාර්ශවකරුවන් වෙත සුහදශීලී විසඳුමක් ලබා දීමේ අපේක්ෂාවෙන් එහිදී දෙපාර්තමෙනතුව විසින් කටයුතු කර ඇති අතර ආරවුල්වලින් 85% ක ට පමණ සුහදශීලී විසඳුම් වලට එළැඹිය හැකි වී ඇත.

## 6.7 නේවාසික වීසා බලපත්‍ර සඳහා නිර්දේශ ලබාදීම

විදේශිකයන් විසින් ඔවුන්ගේ ව්‍යාපාරික, වෘත්තීය සහ පෞද්ගලික කටයුතු සඳහා ශ්‍රී ලංකාව තුල වැඩි කාලයක් සිටීමට නේවාසික වීසා අයදුම් කරනු ලබයි. ආගමන විගමන දෙපාර්තමේන්තුව විසින් නේවාසික වීසා බලපත් ලබාදීම සඳහා අදාල රේඛීය අමාත්‍යංශයන්ගෙන් නිර්දේශයන් අපේක්ෂා කරයි. ලංකාව වෙත පැමිණීම සහ ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාරික කටයුතුවල යෙදීමට, විදේශීය සමාගම්වල සහ වෙනත් වෙළඳ සහ වාණිජ ව්‍යාපාරවල සම්බන්ධීකරණ කාර්යාලවල/ ශාඛා කාර්යාලවල සේවයේ නියුතු විගමණිකයන් සඳහා නේවාසික වීසා බලපත්‍ර නිකුත්කිරීම සඳහා නිර්දේශ ලිපි නිකුත්කිරීමේ බලය කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් වාණිජ දෙපාර්තමේන්තුව වෙත පවරාදී ඇත.

වාණිජ දෙපාර්තමේන්තුව විසින් වාණිජ ආයතනයන්හි අධ්‍යක්ෂ, උපදේශක සහ විශේෂිත කාණ්ඩ යටතේ සිටින සුදුසුකම් ලත් විදේශිකයන්, ඔවුන්ගේ යැපෙන්නන් වෙත ඔවුන්ගේ ඉල්ලීමට අදාලව ඇතුල්වීමට සහ දීර්ඝ කිරීමට අදාල නේවාසික වීසා නිර්දේශ ලිපි අවුරුද්දක කාලයක් සඳහා නිකුත් කරයි. එවැනි සේවා නියුක්තියක් මගින් අපනයන වෙළඳාම, තාක්ෂණික මාරුව සහ ඵලදායිතා වර්ධනය සඳහා ඇතිවන සෘජු ප්‍රතිලාභ සහ එමඟින් ජාතික ආර්ථිකයට ඇතිවිය හැකි වාසි සැළකිල්ලට ගනිමින්, එවැනි වීසා බලපත්‍ර නිර්දේශ සඳහා ඉදිරිපත්වන අයදුම්පත් දැඩි ලෙස තක්සේරු කරනු ලැබේ.

2016 වසරේදී වාණිජ දෙපාර්තමේන්තුව විසින් සමාගම් 72 ක ජාතීන් 25 ක යැපෙන්නන් 86 සැදුම්ලත් අයදුම්කරුවන් 121 නේවාසික වීසා බලපත්‍ර සඳහා නිර්දේශ ලබා දෙන ලදී. 2015 වර්ෂයට සාපේක්ෂව එය සමාගම් 21, ජාතීන් 6, යැපෙන්නන් 17 ඇතුලත් අයදුම්කරුවන් 35 ක ඉහළ යාමකි. එහි ආදායම රු. 739,000.00 /= වේ.

## 6.8 ණයදෙන ආයතන අනුමත කිරීම

1949 අංක 06 දරන උකස් පනත යටතේ, ඕනෑම සමාගමක්, වෙළඳ සමාගමක්, ආයතනයක් හෝ පුද්ගලයකු අනුමත කරන ලද ණය දෙන ආයතනයක් ලෙස ප්‍රකාශයට පත්කිරීමට වාණිජ අධ්‍යක්ෂ ජනරාල් වෙත බලය පවරා ඇත. අධ්‍යක්ෂ ජනරාල්වරයා එසේ සිය අනුමැතිය දෙනු ලබන්නේ, 1949 අංක 06 දරන උකස් පනතේ 114 (1) වන වගන්තිය යටතේ ගරු. අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන සභාපතිවරයකුගෙන් හා තවත් පුද්ගලයින් දෙදෙනෙකුගෙන් සමන්විත මණ්ඩලයක නිර්දේශ මත පදනම්ව වේ.

සමාලෝචිත වර්ෂයේ දී වාණිජ දෙපාර්තමේන්තුව විසින් අයදුම්පත් 8 ක් සකසන ලදී (නව අයදුම්පත් 5ක් සහ ප්‍රමාද වූ පෙර අයදුම්පත් 3 ක්). මෙම අයදුම්පත් 8 න් , මණ්ඩලය විසින් සිදුකරන ලද නිර්දේශ මත සමාගම් 4 ක් අනුමත ණයදෙන ආයතන ලෙස ගැසට් නිවේදනය කරන ලදී.

### 6.9. තාක්ෂණික සහාය සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

වර්ෂය තුලදී, ලෝක වෙළඳ සංවිධානයේ ගිවිසුම් සහ වෙළඳ ගනුදෙනු හැකියාව අදාල රාජ්‍ය නිලධාරීන් තුළ වර්ධනය කිරීමේ අභිලාශයෙන් වෙළඳාම් ප්‍රවර්ධන සංවිධාන සහ අපනයන සමාගම්වල නියෝජිතයින් හා වාණිජ දෙපාර්තමේන්තුව WTO, UNESCAP, ITC සහ අනෙකුත් විවිධ සංවිධානයන්ගේ ද සහය ඇතුව පහත දැක්වෙන සම්මන්ත්‍රණ පවත්වන ලදී.

### 6.9.1. තීරු බදු රහිත පියවරයන් පිළිබඳ සහ ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ඉන්දියාවේ ප්‍රමිති පිළිබඳ දැනුවත් කිරීම පිළිබඳ වැඩමුළුව

තීරු බදු රහිත පියවරයන් පිළිබඳ සහ ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ඉන්දියාවේ ප්‍රමිති පිළිබඳ අපනයනකරුවන් දැනුවත් කිරීම දිනක වැඩමුළුවක් 2016 මාර්තු මස 4 වන දින පැවැත්වීය.

මෙම වැඩමුළුවෙහි ප්‍රධාන අරමුණ වන්නේ වැරදි වටහා ගැනීම් සහ ඉන්දියාව සමඟ වෙළඳ ගනුදෙනු ක්‍රමවත්ව සිදු කිරීම සඳහා ශ්‍රී ලංකවේ අපනයන ප්‍රජාව ඉන්දියානු ආනයන සඳහා පැනවෙන නීති සහ රෙගුලාසි පිළිබඳව දැනුවත් කිරීමයි. ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ප්‍රතිලාභිත වෙළඳපොළ ප්‍රවේශයන් සඳහා බාධා ඇතිවන ලෙස ඉන්දීය අධිකාරීන් යටතේ විවිධ තීරු බදු රහිත පියවරයන් පිළිබඳ වාර්තා කරන ලද ශ්‍රී ලාංකික අපනයන කරුවන්ගේ චෝදනා පිළිබඳ සලකා බැලීමක් ද වැඩමුළුවේදී සිදු විය.

ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ විශේෂ ක්ෂේත්‍රයන් යටතේ අදාල ගැටලු පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා වැඩමුළුවේදී අවස්ථාව ලැබුණි. ඉන්දීය ප්‍රමිති කාර්යාලය, සුරාබදු සහ රේගු කටයුතු පිළිබඳ මධ්‍යම අධිකාරිය, ආහාර ආරක්ෂණ ප්‍රමිති අධිකාරිය සහ විදේශීය වෙළඳ අධ්‍යක්ෂ ජනරාල් යන නිලධාරීන්ගෙන් ඉන්දීය නියෝජිත මණ්ඩලය සමන්විත විය. ශ්‍රී ලාංකික අපනයනකරුවන්/මාණ්ඩලික නියෝජිතයින් සහ වෙළඳාම සම්බන්ධ නියාමන ආයතනවල නිලධාරීන් 250 ක් මේ සඳහා සහභාගී විය. අපනයනයේ දී මුහුණ දීමට සිදුවන පෞද්ගලික ගැටලු පිළිබඳව සාකච්ඡා කිරීමේදී සහභාගීවූවන් විශාල උනන්දුවක් දැක් වූ අතර ශ්‍රී ලංකාවේ ගුණාත්මක නිෂ්පාදන සඳහා වඩාත් හොඳ වෙළඳපොළ ප්‍රවේශයක් ලබා ගැනීම සඳහා පවත්නා නියාමන රාමුව සහ වෙළඳාමෙ පවතින වෙනත් විධික්‍රමයන් පිළිබඳ ඔවුන්ගේ අදහස් පල කරන ලදී.

### 6.9.2. ලෝක වෙළඳ සංවිධානයේ පශ්චාත් නයිරෝබි ගැටලු සම්බන්ධයෙන් වූ පොදු රාජ්‍ය මණ්ඩල ප්‍රතිපත්ති සම්පාදක වැඩමුළුව ශ්‍රී ලංකාවේ පැවැතිවීම

ලෝක වෙළඳ සංවිධානයේ පශ්චාත් නයිරෝබි ගැටලු අනුව, සංවර්ධනය වෙමින් පවතින රටවල වෙළඳ තරඟකාරීත්වය වර්ධනය කිරීම අරමුණු කරමින් රටවල් 15 ට වැඩි ප්‍රමාණයක ජ්‍යෝෂ්ඨ නිලධාරීන්, පොදු රාජ්‍ය මණ්ඩලීය මහ ලේකම් සහ චිරස්ථායී සංවර්ධනය සඳහා වූ ආයතන (IISD) ද ඇතුලත්ව නියෝජිතයන් 60 කට වැඩි සහභාගීත්වයකින් 2016 මාර්තු 16-18 යන දිනයන් වල දින 3 ක වැඩමුළුවක් කොළඹ පැවැත් විණි.

ඌණ සංවර්ධිත රටවල සහ සංවර්ධනය වන ආර්ථිකවල ශක්‍යතා බාධක, ට්‍රාන්ස් පැසිෆික් හවුල(TPP), ට්‍රාන්ස් අත්ලාන්තික් වෙළඳ සහ ආයෝජන හවුල (TTIP), කලාපීය ආර්ථික අවබෝධතා හවුල වැනි ලෝක වෙළඳ සංවිධානය මූලිකත්වය දරන දෝහා සංවර්ධන වැඩසටහන යටතේ බහුපාර්ශවීය වෙළඳ සාකච්ඡා ඇණහිටීම සහ එවැනි නිදහස් වෙළඳ ගිවිසුම් සඳහා කම්කරු

අයිතිවාසිකම්, ආයෝජන නීති, රාජ්‍ය ව්‍යාපාර ආදියෙහි දායකත්වය ඉහළ දැමීම යනාදිය එම අවස්ථාවේ සාකච්ඡාවට බඳුන්වූ මූලික තේමාවන් අතර වේ.

පොදු රාජ්‍ය මණ්ඩලීය මහ ලේකම් කාර්යාලය, වාණිජ දෙපාර්තමෙන්තුව, චිරස්ථායී සංවර්ධනය සඳහා වූ ආයතන, ප්‍රතිපත්ති අධ්‍යන ආයතනය සහ ලන්ඩනයේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය සමඟ එක්ව මෙම වැඩමුළුව සංවිධානය කරන ලදී.

### 6.9.3. වෙළඳ පිළියම් සඳහා ශක්‍යතා සංවර්ධන වැඩසටහන

ලෝක වෙළඳ සංවිධානයේ නීති අංශය සමඟින් වෙළඳ පිළියම් පිළිබඳ වැඩමුළුවක් වාණිජ දෙපාර්තමේන්තුවේ දී 2016 අප්‍රේල් 4-8 දිනයන් වල පැවැත්වෙන ලදී. අදාල රාජ්‍ය නිලධාරීන් අතර ඒ පිළිබඳ දැනුම වර්ධනය කිරීම, ලෝක වෙළඳ සංවිධානයේ ගිවිසුම් යටතේ වෙළඳ පිළියම් පිළිබඳ තාක්ෂණික දැනුම ලබා දීම වැඩමුළුවේ මූලික අරමුණ විය. තාක්ෂණික සහයේ ප්‍රථිඵලයක් ලෙස ලෝක වෙළඳ සංවිධානයේ නීති අංශය විසින් වෙළඳ පිළියම් සඳහා තාක්ෂණික සහයෝගිතා සංක්ෂිප්ත කෙටුම්පතක් සකසන ලදී.

ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය සමඟ එක්ව පෞද්ගලික අංශය සඳහා ප්‍රපාතන විරෝධී, ප්‍රතිතෝලන බදු අරාක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණයක් ද පැවැත් විණි.

### 6.9.4. සේවා වෙළඳාම පිළිබඳ සම්මන්ත්‍රණය

බණ්ඩාරනායක ජාත්‍යන්තර අධ්‍යනය කේන්ද්‍රය (BCIS) සමඟ එක්ව වාණිජ දෙපාර්තමේන්තුව විසින් සේවා වෙළඳාම පිළිබඳ අන්තර් ක්‍රියාකාරී සම්මන්ත්‍රණයක් 2016 ජූනි මස 27-28 දිනවලදී බණ්ඩාරනායක ජාත්‍යන්තර අධ්‍යනය කේන්ද්‍රයේ දී පවත් වන ලදී.

මෙම සම්මන්ත්‍රණයේ අරමුණ වුයේ ලෝක වෙළඳ සංවිධානයේ සේවා වෙළඳාම පිළිබඳ පොදු ගිවිසුමේ රාමුව , එහි විවිධ වගකීම, බැඳීම් උපලේඛණය කිරීම, නියාමන විනිවිදභාවය පිළිබඳ වගකීම් ප්‍රතිපත්ති සැකසීම, සේවා පිළිබඳ සාකච්චාවන්හි නව ගැටලු සහ ශ්‍රී ලංකාව ඉලක්ක කොට ගත් කලාපීය ඒකාබද්ධ භූදර්ශනය මෙන්ම ප්‍රතිපත්ති අවකාශයෙ ලිහිල්කරණය පිළිබඳ ගැටලු සහ නිදහස් වෙළඳ ගිවිසුම්වල කම්කරු ව්‍යාපාරයන්ට අදාල ගැටලු පිළිබඳ රාජ්‍ය නිලධාරීන්, පෞද්ගලික අංශය, මහජනයා සවිස්තරාත්මකව දැනුවත් කිරීමයි.

### 6.9.5. බහුපාර්ශවීය වෙළඳ ක්‍රමය තුල වෙළඳාම මුල් කරගත් සංවර්ධනය පිළිබඳ කලාපීය වැඩමුළුව

ජිනිවා හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය, ලෝක වෙළඳ සංවිධානයේ වෙළඳාම සහ සංවර්ධන අංශය සමඟින් එක්ව වාණිජ දෙපාර්තමෙන්තුව විසින් බහුපාර්ශවීය වෙළඳ ක්‍රමය තුල වෙළඳාම මුල් කරගත් සංවර්ධනය පිළිබඳ කලාපීය වැඩමුළුවක් මෙහෙයවන ලදී. එය ලෝක වෙළඳ සංවිධානය සහ UNESCAP ඒකාබද්ධව සංවිධානය කොට 2016 ඔක්තෝබර් මස 26-28 දිනවලදී කොළඹ දී පැවත් වූ අතර ආසියානු රටවල් 21 කින් 50 ට අධික පිරිසක් වැඩමුළුව සඳහා සහභාගී විය.

### 6.9.6 වෙළඳ ප්‍රතිපත්ති පිළිබඳ සම්මන්ත්‍රණය

එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුව, එක්සත් ජනපද වාණිජ දෙපාර්තමේන්තුව සමඟින් එක්ව වාණිජ දෙපාර්තමේන්තුව විසින් වෙළඳ ප්‍රතිපත්ති පිළිබඳ තෙදින සම්මන්ත්‍රණයක් පවත්වන ලද අතර විවිධ ශ්‍රී ලාංකීය අමාත්‍යංශයන්හි, ආයතනයන්හි, පර්යේශණ ආයතනයන්හි, වෙළඳ

ප්‍රතිපත්ති බුද්ධි මණ්ඩල සහ වාණිජ මණ්ඩලයේ තීරකයන් සහ තාක්ෂණික විශේෂඥයන් 70 ට අධික ප්‍රමාණයක් මේ සඳහා සහභාගී විය.

ප්‍රමාණාත්මක වෙළඳ ප්‍රතිපත්ති විශ්ලේෂණයේ හැකියාව වර්ධනය කිරීම , වෙළඳ ගිවිසුම්වල ක්‍රමෝපායන් පිළිබඳ සාකච්ඡාවන් , ශ්‍රී ලංකාවේ ජාතික වෙළඳ ප්‍රතිපත්තියක් සකස්කිරීමේ විභවතාවය පිළිබඳ සාකච්ඡාවන්, එම දින තුන ඇතුලත ආවරණය කරන ලදී.

### 6.9.7. ලෝක වෙළඳ සංවිධානයේ වෙළඳාම පහසුකරණ ගිවිසුම පිළිබඳ සම්මන්ත්‍රණය

වෙළඳාම පහසුකරණ ගිවිසුම පිළිබඳ සම්මන්ත්‍රණය 2016 ජූලි මස 27 දින කොළඹ දී පැවත් විය. මාර්ගස්ථ නිදහස, ආනයනය සහ අපනයනය සහ සම්බන්ධිත ගාස්තු සහ විධික්‍රම, අන්තර්ජාලය තුළින් ප්‍රකාශනය සහ වෙළඳ රෙගුලාසි පරිපාලනය පිළිබඳ මෙම සාකච්ඡාවන් මඟින් ආවරණය විය.

ලෝක වෙළඳ සංවිධානයේ සාමජික රටවල් මඟින් (සමස්ත සමාජික රටවල් 164 න් 3/2 ක්) අදාල අනුමත කිරීම් සංඛ්‍යාව (110) සම්පූර්ණ කල පසු මෙම ගිවිසුම බලාත්මක වේ. මේ වන විට ලංකාවද ඇතුලත්ව සාමාජිකයන් 102 ක් අනුමත කිරීම් ලබා දී ඇත. 2016 මාර්තු මස ශ්‍රී ලංකාවේ අනුමත කිරීම ලබා දීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දුන් අතර 2016 අප්‍රේල් මස අමාත්‍ය මණ්ඩලය විසින් වෙළඳාම පහසුකරණය පිළිබඳ ගිවිසුමේ විධිවිධානයන්ගේ දේශීය සම්බන්ධීකරණය, හා ක්‍රියාත්මක කිරීම සඳහා වෙළඳාම පහසුකරණය පිළිබඳ ජාතික කමිටුව පත් කිරීම අනුමත කරන ලද අතර, කමිටුවේ සම අසුන් හොබවනු ලබන්නේ රේගු අධ්‍යක්ෂ ජනරාල් සහ වාණිජ අධ්‍යක්ෂ ජනරාල් විසිනි. වෙළඳාම පහසුකරණය පිළිබඳ ජාතික කමිටුව නියාමන ආයතන 12 කින් සහ ශ්‍රී ලංකාවේ වෙළඳාම සහ කර්මාන්ත අංශය නියෝජනය කරන සාමජිකයින් 6 දෙනෙකුගෙන් සමන්විත වේ.

ගිවිසුම ක්‍රියාත්මක කිරීමෙන් සමාජිකයන්ගේ වෙළඳ පිරිවැය අඩු කිරීමට ද, රටවල් අතර වෙළඳාම වර්ධනය කිරීමට ද, ලෝක ආදායම ඉහල නැංවීමට ද හැකි වනු ඇත. සංවර්ධනය වෙමින් පවතින රටවල් වත්මන මුහුණ දෙන කාර්යය පටිපාටික බාධක හමුවේ විශාලතම ප්‍රතිලාභයක් ලැබීමට මෙයින් අපේක්ෂා කෙරේ. අධ්‍යනයන් මඟින් පෙන්වා දෙන්නේ ඔවුන්ගේ වෙළඳ පිරිවැය 13% සිට 15% දක්වා පහත වැටෙන බවයි. එමෙන්ම විවිධාංගීකරණයට ලක්වූ භාණ්ඩ පරිග්‍රහණයට ගෘහයන්ට අවස්ථාව සැලසේ. සමාගම් සඳහා අවම පිරිවැයක යෙදවුම් ප්‍රමාණයකින් විදේශීය වෙළඳපොළ ප්‍රවේශය අත් කරගත හැකි මාර්ගයක් වේ.

සංවර්ධනය වෙමින් පවතින රටවල අපනයනය විවිධාංගීකරණයකින් යුතුව 14% සිට 22% දක්වා වර්ධනය වෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. සමාගම් දේශීය ආයෝජන දිරිමත් කෙරෙන ලෙස වඩාත් ලාභදායී වනු ඇත. මෙයට අමතරව මෙම ගිවිසුම සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කෙරෙන රටවලට විදේශීය ඍජු ආයෝජන ගලා එනු ඇත. කම්කරුවන් සඳහා යහපත් සේවා නියුක්ති අපේක්ෂාවන් දියුණු වෙළඳ ක්‍රම තුලින් ලැබෙන අතර රජයටද විශාල ආදායමක් ලැබෙනු ඇත. (මූලාශ්‍රය : ලෝක වෙළඳ සංවිධානය )

පහත දැක්වෙන සම්මන්ත්‍රණ සහ වැඩමුළු සඳහා වාණිජ අධ්‍යක්ෂ ජනරාල් විසින් සම්පත් දායකයෙකු ලෙස සහභාගී වන ලදී

- ශ්‍රී ලංකා චීන සමකාලීන සම්බන්ධතා: අභියෝග සහ අනාගත මාවත
  බණ්ඩාරනායක ජාත්‍යන්තර අධ්‍යන කේන්ද්‍රය (BCIS)
- නිදහස් වෙළඳ ගිවිසුම්වල වාසි හා අවාසි - ලංකා තරුණ ව්‍යවසායක මණ්ඩලය (COYLE)

- රාජ්‍ය අංශය තුලින් ඔබේ ව්‍යාපරය වර්ධනය කරගනිමින් ගෝලීය වෙළඳපොළ ප්‍රවේශයන් ගවේෂණය කිරීම පිළිබඳ විද්වත් සාකච්ඡාව සහ සම්මේලනය- ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය (CCC)
- ජී.එස්.පී. + අපේක්ෂිත ප්‍රථිඵල - ශ්‍රී ලංකා පදනම් ආයතනය

### 6.10. වෙළඳාම හා බැඳි යුරෝපා සංගමය අනුග්‍රහිත ශක්‍යතා සංවර්ධන ව්‍යාපෘතිය

"යුරෝපා සංගමය හා ශ්‍රී ලංකාව අතර වෙළඳාම සම්බන්ධ සහය: කලාපීය හා යුරෝපා සංගමයේ වෙළඳපොළ තුල සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ගේ තරගකාරීත්වය වර්ධනය කිරීම" යන ව්‍යාපෘතිය , 2013 දෙසැම්බර් මස 2 වන දින බ්‍රසල් හි පැවති යුරෝපා සංගමය හා ශ්‍රී ලංකාව අතර ඒකාබද්ධ කමිටුව හා සමගාමීව පැවත් වූ වෙළඳ හා ආර්ථික සම්බන්ධතා පිළිබඳ යුරෝපා සංගමය හා ශ්‍රී ලංකාව අතර වැඩ කණ්ඩායම වෙත ඉදිරිපත් කරන ලදී.
විශේෂයෙන් ම ආහාර, කුළුබඩු සහ තොරතුරු තාක්ෂණය හා ව්‍යාපාර ක්‍රියාවලි බාහිරකරණය (IT & BPO) යන අංශ සඳහා

1. ව්‍යාපාර හා වෙළඳ ප්‍රතිපත්ති
2. වෙළඳ පහසුකරණය
3. තත්ත්ව සහතික හා සනීපාරක්ෂක සහ ස්වස්තතා පියවරයන් (SPS),
4. ආංශික අගයන් දාම සංවර්ධනය සහ කලාපීය හා ගෝලීය අගය දාමයට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් සම්බන්ධ කිරීම

තුලින් ශ්‍රී ලංකාවේ අපනයන ක්ෂේත්‍රයේ සමස්ත කාර්ය සාධනය ඉහළ නැංවීමට ව්‍යාපෘතිය අපේක්ෂා කරයි.

යුරෝපා සංගමය විසින් මෙම ව්‍යාපෘතිය සඳහා යුරෝ මිලියන **8**ක අරමුදල් ලබා දීමට එකඟ වූ අතර ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථාන ක්‍රියාත්මක කිරීමේ ආයතනය ලෙස යුරෝපා සංගමය ක්‍රියා කරනවිට වාණිජ දෙපාර්තමේන්තුව එහි ජාතික සම්බන්ධීකාරක ලෙස පත් කර ඇත.

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය රිෂාඩ් බදියුදීන් මහතාගේ සහ යුරෝපා සංගමයේ ශ්‍රී ලංකා සහ මාලදිවයිනෙහි නියෝජිත කණ්ඩායමේ ප්‍රධානී සහ තානාපති තුන්ග්ලායි මාර්ග් මහතා ගේ සහභාගීත්වයෙන් 2016 නොවැම්බර් මස 15 වන දින සිව් අවුරුදු ව්‍යාපෘතිය දියත් කරන ලදී.

## 7. ප්‍රභවස්ථාන සහතික නිකුත්කිරීම

පහත සඳහන් වරණීය ගිවිසුම් සහ කලාපීය, ද්විපාර්ශ්වික සහ නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ අපනයනය කරනු ලබන ශ්‍රී ලාංකික සම්භවීය නිෂ්පාදන සඳහා වාණිජ දෙපාර්තමේන්තුව විසින් ප්‍රභවස්ථාන සහතික (COOs) නිකුත් කරනු ලබයි.

- වරණීය පොදු ක්‍රමය (GSP)
- ගෝලීය වෙළඳ වරණ ක්‍රමය (GSTP)
- සාර්ක් වරණීය වෙළඳ ගිවිසුම (SAPTA)
- දකුණු-ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA)
- ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA)
- පාකිස්ථානු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA)
- ආසියානු-පැසිෆික් වෙළඳ ගිවිසුම (APTA)

සාමාන්‍ය වැඩකරන දිනයකදී, වාණිජ දෙපාර්තමේන්තුව විසින් ප්‍රභවස්ථාන සහතික 500 ක් සම්බන්ධයෙන් කටයුතු කරන ලදුව නිකුත් කරනු ලැබ ඇත. පූර්ව දැනුම්දීමකින් තොරව රාජකාරී වේලාව තුළ ඕනෑම අවස්ථාවක හමුවිය හැකි පූර්ණකාලීනව ප්‍රභවස්ථාන සහතික අංශය වෙත අනුයුක්තව කටයුතුකරන, ඉතා ඉහළ මට්ටමින් අභිප්‍රේරණය කරන ලද නිලධාරීන්ගෙන් සමන්විත කණ්ඩායමක් උපදෙස් ලබා දීම සඳහාත්, වැඩිදුර තොරතුරු පැහැදිලිකර දීම සඳහාත් සූදානම්ව සිටියි. සාමාන්‍යයෙන්, පත්කර ඇති නිලධාරීන් විසින් අපනයනකරුවන් 30 - 50 දෙනෙකුට දිනපතා උපදෙස් ලබා දෙනු ලැබේ. ප්‍රභවස්ථාන සහතික (COOs) නිකුත් කිරීම, විවිධ වෙළඳ ගිවිසුම් යටතේ අදාළ ප්‍රභවස්ථාන රීති නිර්ණායකය පිළිබඳව ගැඹුරු දැනුමක් ලබාගැනීම යනු අවශ්‍යවන ඉතා විශේෂිත කාර්යයක් වේ. මේ සම්බන්ධයෙන් වාණිජ දෙපාර්තමේන්තුවේ වගකීම් වන්නේ;

(අ) තීරුබදු සහන සඳහා නිෂ්පාදනයක යෝග්‍යතාව තක්සේරු කිරීම,
(ආ) අපනයනකරුවන්ගේ තොරතුරු සටහන් (profiles) ලියාපදිංචි කිරීම සහ පවත්වාගෙන යාම,
(ඇ) පිරිවැය ප්‍රකාශයන් සහ යෝග්‍යතාව සපුරාලීම සඳහා අපනයනකරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන අනෙකුත් ආධාරක ලිපිලේඛන ඇගයුමට ලක්කිරීම,
(ඈ) වරණය ලබාදෙන්නා වූ රටවල ඉල්ලීම මත ප්‍රභවස්ථාන සහතික නිකුත් කිරීමෙන් පසු විගණන පැවැත්වීම සහ
(ඉ) ප්‍රභවස්ථාන සහතික ආශ්‍රිත දත්ත සහ විශ්ලේෂණාත්මක වාර්තා සකස් කිරීම.

පසුගිය වසර 5 තුළ වාණිජ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ප්‍රභවස්ථාන සහතිකපත් වල විස්තර පහත දැක්වේ.

| ගිවිසුම | නිකුත් කරන ලද ප්‍රභවස්ථාන සහතිකපත් ගණන | | | | | |
|---|---|---|---|---|---|---|
| | **2011** | **2012** | **2013** | **2014** | **2015** | **2016** |
| **EU GSP** | 85,600 | 114,029 | 79,774 | 83,898 | 72,675 | 74,003 |
| **GSP - CIS** | 856 | 1,009 | 929 | 842 | 480 | 514 |
| **GSP -** වෙනත් | 14,782 | 13,909 | 13,410 | 12,706 | 11,985 | 11,981 |
| **ISFTA** | 35 | 9,742 | 11,088 | 10,852 | 11,494 | 12,621 |
| **PSFTA** | 30 | 8,057 | 8,190 | 7,069 | 7,320 | 6,673 |
| **APTA** | 2,424 | 2,781 | 3,482 | 4,131 | 4,025 | 4,508 |
| **SAFTA** | - | 26 | 74 | 388 | 231 | 149 |
| **SAPTA** | 248 | 253 | 243 | 309 | 304 | 288 |
| **GSTP** | 115 | 136 | 147 | 107 | 150 | 143 |
| එකතුව | **104,090** | **149,942** | **117,337** | **120,302** | **108,664** | **110,830** |

## 8. වාණිජ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල සංචලන – 2016

| නිලධාරියාගේ නම | සංචලනය | දිනය |
|---|---|---|
| ***සේවා ස්ථාන මාරුවීම් - දෙපාර්තමේන්තුවට ආපසු පැමිණීම්*** | | |
| පී.එම්.බී සෝමසිරි මයා<br>වාණිජ අධ්‍යක්ෂ | ඇමරිකා එක්සත් ජනපදයේ වොෂින්ටන් පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සේවයේ සිට ශ්‍රී ලංකාවට පැමිණීම | 21.05.2016 |
| බී. එම්. එස්. ඒ. බී. ගොඩවිට මයා<br>**වාණිජ අධ්‍යක්ෂ** | කැනඩාවේ ටොරොන්ටෝ හි පිහිටි ශ්‍රී ලංකා කොන්සාල් ජනාරාල් කාර්යාලයේ සේවයේ සිට ශ්‍රී ලංකාවට පැමිණීම | 21.10.2016 |
| ඩී.ඒ.එස්.විජේවන්ත මිය<br>නියෝජ්‍ය වාණිජ අධ්‍යක්ෂ | එක්සත් රාජධානියේ ලන්ඩන් නුවර ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයේ සිට දෙපාර්තමේන්තුවට පැමිණීම | 28.09.2016 |
| ***සේවා ස්ථාන මාරුවීම් - විදේශ දූත මණ්ඩල සඳහා පත්කිරීම්*** | | |
| **යූ. සමරතුංග මෙය**<br>වාණිජ අධ්‍යක්ෂ | ඇමරිකා එක්සත් ජනපදයේ වොෂින්ටන් පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය වෙත මාරු කරන ලදී | 09.05.2016 |
| බී. එම්. එස්. ඒ. බී. ගොඩවිට මයා<br>වාණිජ අධ්‍යක්ෂ | ඇමරිකා එක්සත් ජනපදයේ ලොස් ඇන්ජලීස් හි පිහිටි ශ්‍රී ලංකා කොන්සාල් ජනාරාල් කාර්යාලය වෙත පත් කරන ලදී | 21.10.2016 |
| එම්. සෝමසේන මයා<br>නියෝජ්‍ය වාණිජ අධ්‍යක්ෂ | ඉතාලියේ රෝමයේ පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය වෙත මාරු කරන ලදී | 07.09.2016 |
| එච්.කේ.ඩබ්. ලියනගේ මිය<br>සහකාර **වාණිජ** අධ්‍යක්ෂ | තායිලන්තයේ බැංකොක් හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය වෙත පත් කරන ලදී | 17.05.2016 |
| ශ්‍රීමාලි ජයරත්න මිය<br>සහකාර වාණිජ අධ්‍යක්ෂ | වියට්නාමයේ හැ නොයි හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය වෙත පත් කරන ලදී | 29.03.2016 |
| **තාරකා බොතේජු මෙය**<br>සහකාර වාණිජ අධ්‍යක්ෂ | ස්විස්ටර්ලන්තයේ ජිනීවා හි ලෝක වෙළඳ සංවිධානයේ නිත්‍ය මෙහෙයුම වෙත පත් කරන ලදී | 23.12.2016 |
| එස්.ඒ.එස්.ඒ. සමරවීර මයා<br>සහකාර වාණිජ අධ්‍යක්ෂ | එක්සත් රාජධානියේ ලන්ඩන් නුවර ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය වෙත පත් කරන ලදී | 21.10.2016 |
| ***විශ්‍රාම ගැනීම*** | | |
| ඩී.ඩබ්. ජිනදාස මයා<br>වාණිජ අධ්‍යක්ෂ | විශ්‍රාම යාම | 20.08.2016 |

## 9. වාර්ෂික ගිණුම් - 2016

**ශීර්ෂ අංකය: 295**

**අමාත්‍යංශය / දෙපාර්තමේන්තුව :- වාණිජ දෙපාර්තමේන්තුව**

**වැඩසටහන් අංකය: 01**

**ව්‍යාපෘති අංකය: 01**

### පුනරාවර්තන වියදම්

| විස්තරය | 2015 සත්‍ය වියදම Rs. 000 | 2016 අනුමත ඇස්තමේන්තුව Rs. 000 | 2016 සංශෝධිත ඇස්තමේන්තුව Rs. 000 | 2016 සත්‍ය වියදම Rs. 000 | 2016 ඉතිරිය Rs. 000 |
|---|---|---|---|---|---|
| පෞද්ගලික පඩිනඩි | 44,898 | 47,600 | 47,600 | 46,969 | 631 |
| වෙනත් | 51,104 | 53,580 | 62,688 | 62,156 | 532 |
| **මුළු වියදම** | **96,002** | **101,180** | **110,288** | **109,125** | **1,163** |

## මූලධන වියදම්

| වැය විෂය අංකය / විස්තර | 2015<br>සත්‍ය වියදම<br>Rs. 000 | 2016<br>අනුමත ඇස්තමේන්තු<br>Rs. 000 | 2016<br>සංශෝධිත ඇස්තමේන්තු<br>Rs. 000 | 2016<br>සත්‍ය වියදම<br>Rs. 000 | 2016<br>ඉතිරිය<br>Rs. 000 |
|---|---|---|---|---|---|
| **මූලධන වත්කම් පුනරුත්තාපනය හා වැඩි දියුණු කිරීම** | **3097** | **500** | **635** | **536** | **98** |
| ගොඩනැගිලි හා ඉදිකිරීම් (2001)<br>යන්ත්‍ර සූත්‍ර හා උපකරණ (2002)<br>වාහන (2003) | 2,552<br>0<br>545 | 100<br>0<br>400 | 235<br>0<br>400 | 212<br>0<br>324 | 23<br>0<br>75 |
| **මූලධන වත්කම් අත්පත් කර ගැනීම** | **2,618** | **3,000** | **2,405** | **2,280** | **125** |
| ලී බඩු හා කාර්යාලයීය උපකරණ (2102)<br>යන්ත්‍රෝපකරණ (2103) | 2,548<br>70 | 2,000<br>1,000 | 1,540<br>865 | 1,,512<br>768 | 28<br>97 |
| **මානව සම්පත් සංවර්ධනය** | **2,134** | **2,000** | **2,460** | **2,454** | **6** |
| කාර්ය මණ්ඩල පුහුණු (2401) | 2,134 | 2,000 | 2,460 | 2,454 | 6 |
| **වෙනත් මූලධන වියදම්** | **4,292** | **5,000** | **5,000** | **4,806** | **194** |
| ආයෝජන (2502)<br>01. අපනයන වෙළඳපල ගවේෂණය කිරීම | 4,292 | 5,000 | 5,000 | 4,806 | 194 |
| **එකතුව** | **12,141** | **10,500** | **10,500** | **10,076** | **423** |